4
ශ්‍රේණිය

මූලික පිරිවෙන්

# ඉතිහාසය

# මධ්‍ය හා අවසන් වාර ප්‍රශ්න පත්‍ර
# Mid Term and Year End Papers

**මූලික පිරිවෙන් අවසාන වාර ප්‍රශ්න පත්‍ර i-ii**



www.pirivena.lk

මූලික පිරිවෙන් ඉතිහාසය මධ්‍ය හා අවසන් වාර ප්‍රශ්න පත්‍ර

# ඉතිහාසය

## මධ්‍ය වාර ප්‍රශ්න පත්‍ර - 4 ශ්‍රේණිය



| | |
|---|---|
| සියලු ම හිමිකම් ඇවිරිණි<br>All Rights Reserved | **මූලික පිරිවෙන් මධ්‍යවාර පරීක්ෂණය 2018**<br>Primary Piriven Mid Year Tearm Test - 2018<br>**ශ්‍රේණිය 04** /Grade **04** |
| | ඉතිහාසය I, II<br>History I, II<br>කාලය : පැය තුන යි<br>**Time : Three Hours** |

## ඉතිහාසය I

උපදෙස්

- » මෙම කොටස ප්‍රශ්න 40 කින් සමන්විත වේ.
- » එය එක් එක් ප්‍රශ්නයට වරණ හතර බැගින් දී ඇත. නමුත් නිවැරදි පිළිතුර වන්නේ එක් වරණයක් පමණි. එම නිවැරදි වරණය තෝරා දී ඇති උපදෙස් අනුව පිළිතුරු ලකුණු කරන්න.
- » මෙම කොටසට ලකුණු 40 ක් හිමි වේ.

» පහත සඳහන් 1 සිට 15 තෙක් සෑම ප්‍රශ්නයකටම ගැළපෙන පිළිතුරු තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

01. අනුරාධපුර රාජධානිය බිඳ වැටීමට බලපෑ ප්‍රධානතම හේතු සාධකය වන්නේ,

(i) පාලකයින් සුරාවට සූදුවට ලොල්වීම යි.
(ii) එළාර රජුගේ ආක්‍රමණය යි.
(iii) පළමුවන රාජ රාජ හා පළමුවන රාජේන්ද්‍රගේ ආක්‍රමණය යි.
(iv) දේශපාලන හා ආගමික සබඳතා බිඳ වැටීම යි.

02. අනුරාධපුර රාජධානියේ අවසාන පාලකයා වූයේ,

(i) පස්වන මිහිඳු රජු ය. (ii) හතරවන සේන රජු ය.
(iii) පස්වන සේන රජු ය. (iv) හතරවන මිහිඳු රජු ය.

03. අනුරාධපුර නගරය පිහිටියේ කුමන ඔය ආශ්‍රිතව ද?

(i) කලාඔය (ii) යාංඔය
(iii) ගල් ඔය (iv) මල්වතු ඔය

04. පොළොන්නරු කිරි වෙහෙර ඉදි කළේ කවුරුන් ද?

(i) පළමුවන විජයබාහු රජතුමා (ii) පළමුවන පරාක්‍රමබාහු රජතුමා
(iii) නිශ්ශංකමල්ල රජතුමා (iv) දෙවන විජයබාහු රජතුමා

05. දඹදෙණි යුගයේ සිටි ප්‍රකට පඬිවරයකු වන්නේ මින් කවු ද?

(i) වේදේහ හිමි (ii) වැත්තෑවේ හිමි
(iii) තොටගමුවේ ශ්‍රී රාහුල හිමි (iv) වීදාගම මෛත්‍රිය හිමි

06. පෘතුගීසීන් ක්‍රි.ව. 1505 ලංකාවට පැමිණෙන විට කෝට්ටේ පාලකයා කවු ද?

(i) හයවන පරාක්‍රමබාහු රජු (ii) හත්වන බුවනෛකබාහු රජු

(iii) අටවනවීර පරාක්‍රමබාහු රජු (iv) හයවන විජයබාහු රජු

07. කෝට්ටේ ධර්මපාල රජු කතෝලික ආගම වැළඳ ගැනීම නිසා කළකිරුණු වැසියෝ දළඳා වහන්සේ සඟවා තැබුවේ කොහේ ද?

(i) දඹදෙණියේ විජය සුන්දරාරාමයේ පාත්‍රයක (ii) බෙලිගල යටහලෙනේ ගල් ලෙනක

(iii) කුරුණෑගල ඇතුගල් විහාරයේ උමගක (iv) සීතාවක දෙල්ගමුව විහාරයේ කුරහන් ගලක

08. කොනප්පු බණ්ඩාර නමින් හඳුන්වනු ලැබූයේ,

(i) සීතාවක රාජසිංහ රජතුමාට ය. (ii) පළමුවන විමලධර්ම සූරිය රජතුමාට ය.

(iii) දෙවන රාජසිංහ රජතුමාට ය. (iv) දෙවන විමලධර්මසූරිය රජතුමාට ය.

09. '' VOC '' වෙළඳ සමාගම නමින් හඳුන්වන්නේ,

(i) පෘතුගාල පෙරදිග ඉන්දීය වෙළෙඳ සමාගම ය.

(ii) ඕලන්ද පෙරදිග ඉන්දීය වෙළෙඳ සමාගම ය.

(iii) ප්‍රංශ පෙරදිග ඉන්දීය වෙළෙඳ සමාගම ය.

(iv) බ්‍රිතාන්‍ය පෙරදිග ඉන්දීය වෙළෙඳ සමාගම ය.

10. පෘතුගීසීන් මෙරටින් පිටුවහල් කළේ,

(i) 1638 දී ය. (ii) 1652 දී ය.

(iii) 1656 දී ය. (iv) 1658 දී ය.

11. රෝම ලන්දේසි උසාවි පද්ධතිය තුළ ලැන්ඩ්රාද් යනු,

(i) ඉඩම් උසාවිය (ii) සිවිල් උසාවිය

(iii) මහාධිකරණය (iv) අභියාචනාධිකරණය

12. ඉතිහාසයේ පියා වශයෙන් හඳුන්වන්නේ කවු ද?

(i) ඇරිස්ටෝටල් (ii) සොක්‍රටීස්

(iii) හෙරඩෝටස් (iv) හෝමර්

13. ශාස්ත්‍ර හැදෑරීමට ''ඇකඩමිය'' නමින් උසස් අධ්‍යාපන ආයතනයක් පිහිටවූයේ,

(i) පයිතගරස් ය. (ii) ප්ලේටෝ ය.

(iii) ඇරිස්ටෝටල් ය. (iv) එරටොස්තිසිස් ය.

14. රෝමවරු ''ආලයට අධිපති'' දෙවියන් ලෙස සැලකූයේ,

(i) මිනාර්වා දෙවඟන ය. (ii) ජුපිටර් දෙවියා ය.

(iii) වීනස් දෙවඟන ය. (iv) මාර්ස් දෙවියා ය.

15. රෝම යුගයේ බොහෝ පොතපත ලියන ලද භාෂාව කුමක් ද?

(i) ග්‍රීක භාෂා (ii) චීන භාෂා

(iii) ඉතාලි භාෂාව (iv) ලතින් භාෂාව

❖ අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් හතර බැගින් දී ඇත. ඒවා අතුරෙන් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග නොගැලපේ. එම නොගැලපෙන නාමය සහිත වරණය තෝරන්න.

16. (i) හංස සන්දේශය (ii) මයුර සන්දේශය

(iii) ගිරා සන්දේශය (iv) පරවි සන්දේශය

17. (i) මාතලේ (ii) කුරුණෑගල

(iii) ගම්පොළ (iv) මහනුවර

18. (i) කෝට්ටේ (ii) රයිගම

(iii) සීතාවක (iv) යාපනය

19. (i) කොළඹ කොමාණ්ඩරිය (ii) ගාල්ල කොමාණ්ඩරිය

(iii) මඩකලපුව කොමාණ්ඩරිය (iv) යාපනය කොමාණ්ඩරිය

20. (i) අවන්ති (ii) කාලිංග

(iii) ගන්ධාර (iv) කාම්බෝජය

❖ අංක 21 සිට 25 තෙක් ප්‍රශ්නවලට පද යුගල හතර බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගයක පද එකිනෙක නොගැළපේ. එම නොගැලපෙන යුගලය තෝරන්න.

21. (i) මහාවංසය - මහානාම හිමි (ii) සමන්ත පාසාදිකාව - බුද්ධඝෝෂ හිමි

(iii) සද්ධර්මරත්නාවලිය-ධර්මසේන හිමි (iv) බුදුගුණ අලංකාරය - වෑත්තෑවේ හිමි

22. (i) පණ්ඩුකාභය රජු - තිසා වැව (ii) මහසෙන් රජු - මින්නේරි වැව

(iii) ධාතුසේන රජු - කලා වැව (iv) දෙවන අග්බෝ රජු - ගිරිතලේ වැව

23. (i) මුල්ලේරියා සටන - ක්‍රි.ව. 1575 (ii) දන්තුරේ සටන - ක්‍රි.ව. 1594

(iii) බලන සටන - ක්‍රි.ව. 1602 (iv) රන්දෙනිවල සටන - ක්‍රි.ව. 1630

24. (i) ගම - ගම්මුලාදෑනි (ii) පත්තු - අතුකෝරල

(iii) කෝරාල - හමුදා කපිතාන් (iv) කොමාන්ඩර් - කොමදෝරු

25. (i) කපිලවස්තු - ශාක්‍යයන් (ii) පාවානුවර - ලිච්ඡවීන්

(iii) මිථිලා - විදේහයන් (iv) රාමගාම - කෝලියන්

» අංක 26 සිට 30 තෙක් ප්‍රශ්නවලටදී ඇති A,B,C,D යන ප්‍රතිචාර හතර අතුරෙන් දෙකක් නිවැරදිය. එම නිවැරදි ප්‍රතිචාර දෙක සඳහන් පිළිතුර තෝරන්න.

26. පළමුවන විජයබාහු රජතුමා සම්බන්ධයෙන් ද නිවැරදි ප්‍රකාශයන් දෙක වන්නේ,

(A) මෙතුමාව කිත්ති කුමරු ලෙස හඳුන්වයි.

(B) දකුණු ඉන්දියාවේ පාණ්ඩ්‍ය රාජ්‍ය ආක්‍රමණය කළේ ය.

(C) මහවැලි ඉදි කළ මෙරටේ පළමු පාලකයා වේ.

(D) වසර 53 ක් පමණ කාලයක් චෝළයින්ට යටත්ව පැවති රජරට නිදහස් කොට රට එක්සේසත් කළේය.

(i) A හා B ය. (ii) B හා C ය. (iii) C හා D ය. (iv) A හා D ය.

27. කෝට්ටේ යුගය හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වන්නේ,

(A) දෙවුනුවර ඉරුගල්කුලතිලක පිරිවෙන මෙකල ප්‍රකට අධ්‍යාපන ආයතනයකි.

(B) අවසන්වරට ලංකාව එක්සේසත් වූයේ මේ යුගයේදීය.

(C) පන්සිය පනස් ජාතක පොත රචනා කිරීම.

(D) රාජ්‍ය බලය සඳහා ප්‍රධාන පවුල් දෙකක් අතර අරගල ඇති විය.

(i) A හා B ය. (ii) B හා C ය. (iii) C හා D ය. (iv) A හා D ය.

28. පෘතුගීසීන්ගේ උඩරට ආක්‍රමණය අසාර්ථකවීමට හේතු දෙකක් දැක්වෙන්නේ,

(A) උඩරට රජුට ලන්දේසින්ගෙන් සහයෝගයක් නොලැබීම ය.

(B) පෘතුගීසීන්ගේ අවි ආයුධ අක්‍රියවීම නිසා ය.

(C) තීරණාත්මක සටන්වල දී ලස්කිරිඤ්ඤ හමුදාව උඩරට රජුට එක්වීම නිසා ය.

(D) උඩරටියන්ගේ සටන් උපක්‍රම හා රජවරුන්ගේ උපාය කෞශල්‍ය නිසා ය.

(i) A හා B ය. (ii) B හා C ය. (iii) C හා D ය. (iv) A හා D ය.

29. ලන්දේසි ආගමික ප්‍රතිපත්තිය සම්බන්ධ නිවරදි කරුණු දෙකක් වන්නේ,

(A) ලන්දේසීන්ගේ ආගම වූයේ රෝමානු කතෝලික ආගම යි.

(B) දෙමළ හා සිංහල භාෂාවලින් ආගම ප්‍රචාරය කළේ ය.

(C) කොළඹ, යාපනය, මන්නාරම, ගාල්ල ආදී මධ්‍යස්ථානවල ආගමික මණ්ඩල පිහිටුවන ලදී.

(D) ආගම සහ අධ්‍යාපනය එකිනෙකට සම්බන්ධ කළේ නැත.

(i) A හා B ය. (ii) B හා C ය. (iii) C හා D ය. (iv) A හා D ය.

30. මගධය අධිරාජ්‍යයක් වශයෙන් ගොඩනැගීමේදී වැදගත් වූ සාධක දෙකක් වන්නේ,

(A) වෙළඳ මාර්ගවල මධ්‍යස්ථානයක්වීම.

(B) අනෙකුත් ජනපදවලින් විශාල සහයෝගයක් ලැබීම.

(C) විදේශ රටවලින් යුධ ආධාර ලබා ගැනීම.

(D) මගධ පාලකයන් අනුගමනය කළ ක්‍රියාමාර්ග.

(i) A හා B ය. (ii) B හා C ය. (iii) C හා D ය. (iv) A හා D ය.

❖ අංක 31 සිට 35 තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම ප්‍රකාශයන් දින වකවානු සමූහයක් X හා Y තීරුවල දී ඇත. Y තීරුවේදී ඇති නාම ප්‍රකාශන දින වකවානු X තීරුව සමග කිසියම් ආකාරයකට ගැලපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැලපෙන අනුපිලිවෙලට නොවේ. y තීරුව X තීරුව සමග ගැලපෙන අනුපිළිවෙලට සකස් කළ විට පහත දී ඇති සංයෝග හතරෙන් එකක් නිවරදිය. නිවැරදි සංයෝගය අයත් වරණය තෝරන්න.

31.

| X | Y |
|---|---|
| (i) මහසෙන් රජු | (A) හැටදාගෙය |
| (ii) පළමුවන පරාක්‍රමබාහු රජු | (B) රත්නපුර මහ සමන් දේවාලය |
| (iii) නිශ්ශංකමල්ල රජු | (C) දෙමළ මහා සෑය |
| (iv) දෙවන පරාක්‍රමබාහු රජු | (D) ජේතවන සෑය |

(i) A B C D (ii) B A D C (iii) C A D B (iv) D C A B

32.

| X | Y |
|---|---|
| (i) පොළොන්නරුව | A ශෛල හස්තිපුර |
| (ii) යාපහුව | B ගඟසිරිපුර |
| (iii) කුරුණෑගල | C ජනනාතපුර |
| (iv) ගම්පොළ | D සුභ පබ්බත |

(i) A B D C (ii) B A C D (iii) C D A B (iv) D A B C

33.

| X | Y |
|---|---|
| (i) හත්වන බුවනෙකබාහු රජු | A මහනුවර |
| (ii) රයිගම් බණ්ඩාර රජු | B සීතාවක |
| (iii) මායාදුන්න රජු | C කෝට්ටේ |
| (iv) සෙනරත් රජු | D රයිගම |

(i) A C D B (ii) C D B A (iii) C A D B (iv) D A B C

34.

| X | Y |
|---|---|
| (i) ෆෙඩ්‍රිකන්ට්වරු | A පාසල් පරිපාලනය |
| (ii) රාද්වැන් ජස්ටිට් | B ආගමික කටයුතු |
| (iii) ස්කෝලාකල් | C සිවිල් පරිපාලනය |
| (iv) කොමදෝරු | D මහාඅධිකරණය |

(i) A B C D (ii) B A D C (iii) C D A B (iv) D B C A

35. X Y

(i) චන්ද්‍රගුප්ත මෞර්ය - A ඉන්දියාවේ අධිරාජ්‍යයා පාලකයෙකි

(ii) පෙරික්ලීස් - B රෝම අධිරාජ්‍යයෙකි

(iii) ඇලෙක්සැන්ඩර් - C ග්‍රීසියේ ශ්‍රේෂ්ඨතම පාලකයාවේ.

(iv) ඔගස්ටස් සීසර් - D ඉන්දියාව ආක්‍රමණය කළ ග්‍රීක අධිරජුය.

(i) A C D B (ii) B A C D (iii) C D B A (iv) D C A B

❖ අංක 36 සිට 40 තෙක් ප්‍රශ්නවලට අදාළ ප්‍රකාශන දෙක බැගින්දී ඇත. ඒ ඒ ප්‍රශ්නයට ගැලපෙනුයේ පහත වගුවේ දැක්වෙන 1,2,3,4 යන කවර ප්‍රකාශන යුගලය දැයි තෝරා ඊට අදාල අංකය ඉදිරියේ ඇති වරහන තුළ එහි අංකය ලියන්න.

| අංකය | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 1 | නිවැරදිය | වැරදිය |
| 2 | නිවැරදිය | නිවැරදිය |
| 3 | වැරදිය | වැරදිය |
| 4 | වැරදිය | නිවැරදිය |

| | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය | පිළිතුර |
|---|---|---|---|
| 36 | දඹදෙණිය රාජධානිය මෙරට හතරවන රාජධානියයි | පළමුවන බුවනෙකබාහු රජු යාපහුව රාජධානිය කර ගන්නා ලදී | (...............) |
| 37 | හයවන පරාක්‍රමබාහු රජු ගඩලාදෙණිය හා ලංකාතිලකය වැඩිදියුණු කරන ලදී | හයවන පරාක්‍රමබාහු රජු තම මෑණියන් වූ සුනේත්‍රාදේවියගේ නමින් පැපිලියානේ සුනේත්‍රාදේවී පිරිවෙන කරවන ලදී | (...............) |
| 38 | ක්‍රි. ව. 1521 විජයබා කොල්ලයෙන් කෝට්ටේ රාජ්‍ය කොටස් පහකට කැඩී ගියේ ය. | ක්‍රි.ව. 1597 ධර්මපාලගේ මරණයෙන් පසු කෝට්ටේ රාජ්‍ය මුළුමනින් ම ලන්දේසි අතට පත් විය | (...............) |
| 39 | ක්‍රි.ව. 1638 ගිවිසුමෙන් වෙළෙඳ ඒකාධිකාරයක් ලන්දේසීන්ට ලැබුණි | ලන්දේසි පෘතුගීසීන්ගෙන් අල්ලා ගත් සෑම බලකොටුවක්ම උඩරට රජුට බාර දුන්හ. | (...............) |
| 40 | මිනෝවාන්වරු හා මසිනියානුවරු ග්‍රීකයන්ගේ මුතුන් මිත්තෝ වෙති | ග්‍රීසිය හා මිසරය රෝමවරු යටත් කර ගන්නා ලදී | (...............) |

# මූලික පිරිවෙන් මධ්‍යවාර පරීක්ෂණය 2018

## Primary Piriven Mid Year Tearm Test - 2018

**04 ශ්‍රේණිය/Grade 04**

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

ඉතිහාසය I, II
History I, II

**ඉතිහාසය** II

සැලකිය යුතුයි

» පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
» පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

01. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

i.) ඔබට සපයා ඇති ශ්‍රී ලංකා ආකෘති සිතියමේ පහත සඳහන් සියලුම ස්ථාන ලකුණු කොට නම් කරන්න.

| | | |
|---|---|---|
| (i) මහාතිත්ථ | (ii) විජිතගාම | (iii) මල්වතු ඔය |
| (v) පොළොන්නරුව | (vi) කෝට්ටේ | (vii) මඩකලපුව |

(ලකුණු 1 x 6 = 6)

❖ A සහ B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) A වලින් දැක්වෙන ඓතිහාසික ස්ථානය කුමක් ද?

(ii) මාසට එරෙහිව මෙහි බලකොටුවක් ඉදි කර ගෙන සිටියේ කවුද?

(iii) මෙය පළමුවරට රාජධානියක් බවට පත් කර ගත්තේ කවුරුන් ද?



A

(ලකුණු 1 x 3 = 3)

(i) B වලින් දැක්වෙන ස්තූපය පිහිටා ඇති රට කුමක්ද?

(ii) මෙම ස්තූපය කුමක් ද?

(iii) මෙය ඉදිකර වූයේ කවුරුන් ද?



B

(ලකුණු 1 x 3 = 3)

02.(i) පළමුවන පරාක්‍රමබාහු රජුගේ මව්පියන් නම් කරන්න.

(ii) නිශ්ශංකමල්ල රජු මුහුණදුන් අභියෝග දෙකක් සඳහන් කරන්න.

(iii) පළමුවන පරාක්‍රමබාහු රජුගේ ආර්ථික ප්‍රතිපත්ති නිදසුන් දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 2 +4 +6 = 12)

03. (i) ආසියාතික රටවල බලය පිහිටුවාගත් යුරෝපීය රාජ්‍ය දෙකක් නම් කරන්න.

(ii) යුරෝපා ජාතීන්ට ආසියාවේ බලය ව්‍යාප්ත කර ගැනීමට අවශ්‍ය වූ හේතු දෙකක් සඳහන් කරන්න.

(iii) යුරෝපා ජාතීන්ට ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල බලය ගොඩනගා ගැනීමට හැකි වූ හේතු දෙකක් විස්තර කරන්න.

(ලකුණු 2 +4 +6 = 12)

04. (i) මගධයේ බලය ගොඩනගා ගත් ප්‍රධාන රාජවංශ දෙකක් නම් කරන්න.

(ii) බිම්බිසාර රජු අධිරාජ්‍ය බලය ගොඩනැගීමට අනුගමනය කළ ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න.

(iii) මගධ අධිරාජ්‍යා වූ අශෝක රජුගේ ධර්ම විජය ප්‍රතිපත්තිය නිදසුන් දෙකක් ඇසුරින් අගය කරන්න.

(ලකුණු 2 +4 +6 = 12)

05. (i) සීතාවක රාජ්‍ය පාලනය කළ ප්‍රධාන රජවරුන් දෙදෙනා කවුද?

(ii) පෘතුගීසි පාලනය නිසා මෙරට සංස්කෘතියේ ඇති වූ වෙනස්කම් දෙකක් සඳහන් කරන්න.

(iii) පෘතුගීසීන්ට උඩරට රාජ්‍ය ආක්‍රමණය කිරීමට නොහැකි වීම සඳහා බලපෑ හේතු දෙකක් පැහැදිලි කරන්න.

(ලකුණු 2 +4 +6 = 12)

06. (i) ග්‍රීක රාජ්‍ය සමයේජීවත් වූ දාර්ශනිකයන් දෙදෙනෙකුගේ නම් ලියන්න.

(ii) ග්‍රීක ශිෂ්ටාචාරයේ පරිහානියට බලපෑ හේතු දෙකක් සඳහන් කරන්න.

(iii) ග්‍රීක ශිෂ්ටාචාරයෙන් නූතන ලෝකයට ලැබී ඇති දායාදයන් දෙකක් පිළිබඳ විස්තර කරන්න.

(ලකුණු 2 +4 +6 = 12)

07. (i) ලන්දේසීන් ලංකාවේ දී අනුගමනය කළ ආර්ථික ප්‍රතිපත්තිය නිදසුන් තුනක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ii) ලන්දේසීන්ගෙන් මෙරට සමාජයට ඇති වූ බලපෑම් උදාහරණ තුනක් ඇසුරින් පෙන්වා දෙන්න.

(ලකුණු 6 +6 = 12)

08. පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් පිළිබඳ ඓතිහාසික වැදගත්කම පැහැදිලි කරන්න.

(i) පළමුවන විජයබාහු රජුගේ ආගමික සේවය

(ii) විජයබා කොල්ලය හා එහි ප්‍රතිඵල

(iii) රෝම ශිෂ්ටාචාරයේ පැවති බල ව්‍යාප්තිය

(iv) හයවන පරාක්‍රමබාහු රජුගේ සමයේ පිරිවෙන් අධ්‍යාපනය

(ලකුණු 6 +6 = 12)

# මූලික පිරිවෙන් මධ්‍යවාර පරීක්ෂණය 2018

## Primary Piriven Mid Year Tearm Test - 2018

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**04 ශ්‍රේණිය/**Grade **04**

ඉතිහාසය II
History II



# මූලික පිරිවෙන් මධ්‍යවාර පරීක්ෂණය - 2019

## Primary Piriven Mid Term Test - 2019

### 04 ශ්‍රේණිය/Grade 04

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

ඉතිහාසය I,II — කාලය : පැය තුන යි

History I,II — Time : Three Hours

ඉතිහාසය I

**උපදෙස්**

» **මෙම කොටස ප්‍රශ්න 40 කින් සමන්විත වේ.**

» **එය එක් එක් ප්‍රශ්නයට වරණ හතර බැගින් දී ඇත. නමුත් නිවැරදි පිළිතුර වන්නේ එක් වරණයක් පමණි. එම නිවැරදි වරණය තෝරා, දී ඇති උපදෙස් අනුව පිළිතුරු පත්‍රයෙහි ලකුණු කරන්න.**

» **මෙම කොටසට ලකුණු 40 ක් හිමි වේ.**

» අංක 01 සිට 15 තෙක් සෑම ප්‍රශ්නයකට ම ගැළපෙන පිළිතුර තෝරා ඊට අදාළ අංකය පිළිතුරු පත්‍රයෙහි ලකුණු කරන්න.

01. ප්‍රථමවරට ලක්දිව ක්‍රමවත් පරිපාලන තන්ත්‍රයක් ගොඩනගා ගත් පාලකයා කවුරුන්ද?

(i) පණ්ඩුකාභය රජු (ii) පස්වන මිහිඳු රජු

(iii) හතරවන මහින්ද රජු (iv) ඉලනාග රජු

02. අනුරාධපුර සිංහාසනය සඳහා නිරන්තර අරගල පැවති රාජවංස දෙක කුමක්ද?

(i) මෞර්ය හා ලම්භකර්ණ (ii) මෞර්ය හා පාණ්ඩ්‍ය

(iii) පාණ්ඩ්‍ය හා ලම්භකර්ණ (iv) කාලිංග හා නායක්කර්

03. පොළොන්නරු රාජධානිය හැඳින්වූ තවත් නමක් වන්නේ,

(i) සෙන්කඩගල නුවර ය. (ii) කඳවුරු නුවර ය.

(iii) කන්දෙ නුවර ය. (iv) මුන්මුඩි චෝල මණ්ඩලම් ය.

04. ක්‍රි. ව. 1017 දී රජරට ආක්‍රමණය කර පස්වන මිහිඳු සිරකරුවෙකු ලෙස ඉන්දියාවට රැගෙන ගිය රජු වූයේ,

(i) පළවන රාජේන්ද්‍ර යි. (ii) මහා රාජ යි.

(iii) එළාර යි. (iv) පීඨිය යි.

05. චෝලයන් අනුග්‍රහය දැක්වූ බෞද්ධ විහාරය,

(i) වෙල්ගම් වෙහෙර (ii) කිරි වෙහෙර

(iii) මහාබෝධි විහාරය (iv) ගිරිදන්ඩන වෙහෙර

06. පළමුවන විජයබාහු රජුගේ පුතු වන්නේ කවුරුන් ද?

(i) මානාභරණ (ii) කිත්සිරිමේඝ

(iii) සිරිවල්ලභ (iv) වික්‍රමබාහු

07. මහා පරාක්‍රමබාහු රජු පොළොන්නරුව අල්ලා ගැනීමට යන විට එහි පාලකයා වූයේ,

(i) පළවන විජයබාහු ය. (ii) දෙවන පරාක්‍රමබාහු ය.

(iii) දෙවන ගජබාහු ය. (iv) පළවන ජයබාහු ය.

08. පළවන පරාක්‍රමබාහු රජු ගේ වාරිමාර්ග කටයුතු අතර වැදගත්ම කාර්යය වූයේ,

(i) පරාක්‍රම සමුද්‍රය ඉදිකිරීම යි. (ii) නාච්චදූව වැව ඉදිකිරීම යි.

(iii) යෝධ වැව ඉදිකිරීම යි. (iv) මින්නේරිය වැව ඉදිකිරීම යි.

09. මෙරට වැඩි ම සෙල්ලිපි ප්‍රමාණයක් පිහිට වූ රජු වන්නේ,

(i) වසභ රජතුමා ය. (ii) මහසෙන් රජතුමා ය.

(iii) නිශ්ශංකමල්ල රජතුමා ය. (iv) ධාතුසේන රජතුමා ය.

10. දඹදෙණි රාජධානියේ ආරම්භක පාලකයා වන්නේ,

(i) දෙවන පරාක්‍රමබාහු රජතුමා ය. (ii) පළවන විජයබාහු රජතුමා ය.

(iii) තුන්වන විජයබාහු රජතුමා ය. (iv) හතරවන පරාක්‍රමබාහු රජතුමා ය.

11. හයවන පරාක්‍රමබාහු සමයේ විසූ ප්‍රකට පඬිවරයකු වන්නේ,

(i) සීලවංශ ධම්මකීර්ති හිමි ය. (ii) දිඹුලාගල කාශ්‍යප හිමි ය.

(iii) දිඹුලාගල මේධංකර හිමි ය. (iv) තොටගමුවේ රාහුල හිමි ය.

12. ආසියාවේ බලය පිහිට වූ යුරෝපීය රටක් වන්නේ,

(i) පෘතුගාලය යි. (ii) ස්පාඤ්ඤය යි.

(iii) ජර්මනිය යි. (iv) ඔස්ට්‍රියාව යි.

13. ධර්මපාල කුමරු කතෝලික ආගම වැළඳ ගැනීමත් සමග ම කළකිරීමට පත් ජනතාව දළදා වහන්සේ සඟවා තැබුවේ,

(i) කැළණි විහාරයේ ය. (ii) දෙල්ගමු විහාරයේ ය.

(iii) ගඩලාදෙණිය විහාරයේ ය. (iv) අත්තනගලු විහාරයේ ය.

14. 1519 දී යාපනයේ පරරාජසේකරම් රජු මරා බලයට පත් වූයේ කවුරුන්ද?

(i) සංකිලි (ii) එදිරිමාන්නසිංහම්

(iii) ආර්ය චක්‍රවර්තී (iv) රාජේන්ද්‍ර චෝළ

15. මෙරට පෘතුගීසී පාලනය නිසා ඇති වූ ආගමික බලපෑමක් වන්නේ,

(i) ආගමික මණ්ඩල පිහිටුවීම යි. (ii) සෙමනේරිය ඇති කිරීම යි.

(iii) කතෝලිකයන් මර්ධනය කිරීම යි. (iv) කතෝලික ආගමිකයන් බදුවලින් නිදහස් කිරීම යි.

» අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් හතර බැගින් ලබා දී ඇත. ඒවා අතරින් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග නොගැළපේ. එම නොගැලපෙන නාමයට අදාළ අංකය තෝරා පිළිතුරු පත්‍රයෙහි ලකුණු කරන්න.

16. (i) දන්තුරේ (ii) බලන
(iii) දුම්බර (iv) රන්දෙණිවෙල

17. (i) සොක්‍රටීස් (ii) ප්ලේටෝ
(iii) ඇරිස්ටෝටල් (iv) සීසර්

18. (i) අංග (ii) මධුරා
(iii) මගධ (iv) කෝසළ

19. (i) චන්ද්‍රගුප්ත (ii) බිංදුසාර
(iii) බිම්බිසාර (iv) අශෝක

20. (i) ත්‍රිකුණාමළය (ii) මීගමුව
(iii) ගාල්ල (iv) මාතර

» අංක 21 සිට 25 තෙක් ප්‍රශ්නවල පද යුගල හතර බැගින් ලබා දී ඇත. ඒවා අතුරෙන් එක් යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන පද යුගලය තෝරා ඊට අදාළ අංකය පිළිතුරු පත්‍රයෙහි ලකුණු කරන්න.

21. (i) පළවන විජයබාහු - පොළොන්නරුව (ii) දෙවන පරාක්‍රමබාහු - දඹදෙණිය
(iii) හතරවන බුවනෙකබාහු - යාපහුව (iv) හයවන පරාක්‍රමබාහු - කෝට්ටේ

22. (i) වජ්ජි - චම්පා (ii) මල්ල - කුසිනාරා
(iii) ගාන්ධාර - තක්ෂිලා (iv) අවන්ති - උදේනි

23. (i) මිනර්වා - අත්කම්වලට අධිපති දෙවඟන (ii) ජූනෝ - ඉතා ම වැදගත් දේවතාවිය
(iii) වීනස් - අහසට අධිපති දෙවියා (iv) නෙප්චූන් - මුහුදට අධිපති දෙවියා

24. (i) ඇරිස්ටොෆනීස් - සුඛාන්ත නාට්‍ය (ii) ඊස්කිලස් - ශෝකාන්ත නාට්‍ය
(iii) හෝමර් - මහා කාව්‍ය (iv) සොපොක්ලීස් - ගී කාව්‍ය

25. (i) ගෘහ භාණ්ඩ - අල්මාරිය (ii) සංගීතය - යාඥා
(iii) ඇඳුම් පැළඳුම් - බොත්තම් (iv) අධ්‍යාපනය - ගීතිකා

» අංක 26 සිට 30 තෙක් ප්‍රශ්නවලට දක්වා ඇති A , B ,C ,D යන ප්‍රතිචාර හතර අතුරෙන් දෙකක් නිවැරදි ය, එම නිවැරදි ප්‍රතිචාර දෙක සඳහන් පිළිතුර තෝරන්න.

26. අනුරාධපුර රාජධානිය සම්බන්ධ නිවැරදි ප්‍රකාශ දෙක වන්නේ,

A. සියවස් 15 ක් පමණ ශ්‍රී ලංකාවේ පාලන මධ්‍යස්ථානය වීම

B. මෙහි ආරම්භක පාලකයා පණ්ඩුකාභය රජතුමා ය.

C. අනුරාධපුරය කලා ඔය නිම්නයේ පිහිටා ඇත.

D. ආළාහන පිරිවෙන් සංකීර්ණය අනුරාධපුරයේ පිහිටා ඇත.

(i) A සහ B ය. (ii) B සහ C ය.

(iii) C සහ D ය. (iv) A සහ D ය.

27. නිශ්ශංකමල්ල රජතුමා සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ දෙක වන්නේ,

A. මෙතුමාගේ පියා මොග්ගල්ලාන නම් විය

B. මෙතුමා පාන්ඩ්‍ය වංශිකයෙකි

C. මෙතුමාගේ රාජ්‍ය කාලය වසර නවයකි

D. මෙතුමා පිළිබඳ තොරතුරු අධ්‍යයනයට පුරාවිද්‍යා මූලාශ්‍ර වැදගත් වේ

(i) A සහ B ය. (ii) B සහ C ය.

(iii) C සහ D ය. (iv) A සහ D ය.

28. ගම්පොළ යුගය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ වන්නේ,

A. තොටගමුවේ රාහුල හිමි මෙකල සිටි ප්‍රකට පඬිවරයෙකි

B. මේ යුගයේ ප්‍රභූ පවුල් දෙකක් දේශපාලන කටයුතුවලට සම්බන්ධ වී ඇත

C. හතරවන භුවනෙකබාහු ආරම්භක පාලකයා වේ

D. දෙවන පරාක්‍රමබාහු මෙහි සිටි ශ්‍රේෂ්ඨ පාලකයා වේ

(i) A සහ B ය. (ii) B සහ C ය.

(iii) C සහ D ය. (iv) A සහ D ය.

29. ලන්දේසී පාලනය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ වන්නේ,

A. 1638 දී දෙවන රාජසිංහ රජු ලන්දේසීන් සමග ගිවිසුමකට එළඹීම

B. දෝන් ජෙරෙනිමෝද අසවේදු ලන්දේසි ආණ්ඩුකාරවරයෙකි

C. ශ්‍රී ලංකාව යටත්කර ගත් ප්‍රථම යුරෝපා ජාතිය වේ

D. රෙපරමාදු ආගමිකයන්ට මුදලි, මුහන්දිරම් වැනි නිලතල වරප්‍රසාද ලබා දීම

(i) A සහ B ය. (ii) B සහ C ය.

(iii) C සහ D ය. (iv) A සහ D ය.

30. ක්‍රි. පූ. 6 වන සියවසයේ ඉන්දියාවේ සමාජ තත්ත්වය සම්බන්ධයෙන් කවර ප්‍රකාශ නිවැරදි වේද?

A. චතුර් වර්ණ අතරින් බ්‍රාහ්මණ වර්ණය ප්‍රමුඛත්වයට පත් වීම

B. ගෝත්‍ර සමාජ ක්‍රමය ක්‍රමිකව අභාවයට යාම

C. වෛශ්‍ය වර්ණයට අයත් සෙට්ඨි ගහපති වැනි කණ්ඩායම් සමාජයේ කැපී පෙනීම

D. සමාජයේ සියළුම පාර්ශ්වවලට ආගමික නිදහස නොලැබීම

(i) A සහ B (ii) B සහ C

(iii) C සහ D (iv) A සහ D

» අංක 31 සිට 35 දක්වා එක් එක් ප්‍රශ්නයෙහි නාම ප්‍රකාශන සමූහයක් X හා Y තීරුවල දී ඇත. එම ප්‍රකාශන කිසියම් ආකාරයකට ගැලපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙලට නොවේ. ඒවා ගැළපෙන අනු පිළිවෙලට සකස් කළ විට නිවැරදි වරණය තෝරන්න.

31.

| X | Y |
|---|---|
| I. බිම්බිසාර රජු | A - ධර්මවිජය ප්‍රතිපත්තිය අනුගමනය කිරීම |
| II. චන්ද්‍රගුප්ත රජු | B - අමිත්‍රඝාත ලෙස හැඳින්වීම |
| III. බින්දුසාර රජු | C - ඩෙකෑනය යටත්කර ගැනීම |
| IV. අශෝක රජු | D – අසල්වැසි රාජ්‍යයන් සමඟ විවාහ සබඳතා ඇති කර ගැනීම |

(i) BADC (ii) DBAC

(iii) DCBA (iv) CDBA

32.

| X | Y |
|---|---|
| I. පොළොන්නරුව | A - පළවන බුවනෙකබාහු රජු |
| II. දඹදෙණිය | B - තුන්වන විජයබාහු රජු |
| III. යාපහුව | C - නිශ්ශංකමල්ල රජු |
| IV. කුරුණෑගල | D – හතරවන පරාක්‍රමබාහු රජු |

(i) BDCA (ii) DABC

(iii) CBDA (iv) CBAD

33.

| X | Y |
|---|---|
| I. සැලළිහිණි සන්දේශය | A - වීදාගම මෛත්‍රී හිමි |
| II. බුදුගුණ අලංකාරය | B - දෙවන පරාක්‍රමබාහු |
| III. ගුත්තිල කාව්‍ය | C - තොටගමුවේ රාහුල හිමි |
| IV. කව්සිළුමිණ | D – වෑත්තෑවේ හිමි |

(i) CADB (ii) ADBC

(iii) BADC (iv) CDAB

34.

| X | Y |
|---|---|
| I. කෝට්ටේ | A - පද්මාවති පිරිවෙන |
| II. රයිගම | B - ඉරුගල් කුලතිලක පිරිවෙන |
| III. කෑරගල | C - පැරකුම්බා පිරිවෙන |
| IV. දෙවුන්දර | D – සනානන්ද පිරිවෙන |

(i) DABC (ii) ADCB

(iii) BADC (iv) CDAB

35.

| X | Y |
|---|---|
| I. ආලාහන පිරිවෙන | A - නිශ්ශංකමල්ල රජතුමා |
| II. රන්කොත් වෙහෙර | B - හතරවන පරාක්‍රමබාහු රජතුමා |
| III. සුනේත්‍රාදේවී පිරිවෙන | C - පළවන පරාක්‍රමබාහු රජතුමා |
| IV. දෙවුන්දර පඨිමාඝරය | D – හයවන පරාක්‍රමබාහු රජතුමා |

(i) DABC (ii) CADB

(iii) ABCD (iv) CABD

» ප්‍රශ්න අංක 36 සිට 40 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයෙහි ප්‍රකාශ දෙක බැගින් ඇතුළත් වේ. ඒ ඒ ප්‍රශ්නයට අදාළව දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැලපෙනුයේ පහත වගුවෙහි දක්වෙන I,II,III,IV යන කවර ප්‍රකාශ යුගලය දැයි තෝරාගෙන අදාළ අංකය පිළිතුරු පත්‍රයෙහි ලකුණු කරන්න.

| අංකය | පළමු වන ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| I | නිවැරදිය | නිවැරදිය |
| II | නිවැරදිය | වැරදිය |
| III | වැරදිය | වැරදිය |
| IV | වැරදිය | නිවැරදිය |

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය | පිළිතුරු |
|---|---|---|---|
| 36. | රෝමවරු ග්‍රීකයන් තරම් කෘෂි - කර්මාන්තයට දක්ෂ නොවිය. | පැරණි යුගයේ පෙර අපර දෙදිග වෙළඳාමෙන් රෝමයට විශාල ධනයක් උපයාගත හැකි විය. | (........) |
| 37. | ලන්දේසීන්ගේ පැමිණීමෙන් ලාංකික සමාජයට ලංසි නම් ජන කණ්ඩායම එකතු විය. | ලන්දේසී යුගයේ දී කතෝලික ආගම වැළඳගත් අයට විශේෂ වරප්‍රසාද හිමි විය. | (........) |
| 38. | පෘතුග්‍රීසීන් පැමිණෙන විට කෝට්ටේ පාලක-යා වුයේ හත්වන භුවනෙකබාහු රජතුමාය. | විජයබා කොල්ලයෙන් හත්වන භුවනෙකබා රජු මිය ගියේ ය. | (........) |
| 39. | නිශ්ශංකමල්ල රජතුමා විජාතික සම්භවයක් ඇති රජ කෙනෙකි. | ලෝකිතා දේවිය නිශ්ශංකමල්ල රජුගේ මව වේ. | (........) |
| 40. | කිත්සිරිමෙවන් රජුගෙන් පසු දක්ෂිණ දේශයේ පාලකයා වූයේ මහා පරාක්‍රමබාහු රජු ය. | මහා පරාක්‍රමබාහු රජුගේ වැදගත්ම ආර්ථික සේවාව පරාක්‍රම සමුද්‍රය ඉදිකිරීම යි. | (........) |

# මූලික පිරිවෙන් මධ්‍යවාර පරීක්ෂණය - 2019

## Primary Piriven Mid Term Test - 2019

**04 ශ්‍රේණිය/**Grade **04**

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

ඉතිහාසය I, II
History I, II

### ඉතිහාසය II

සැලකිය යුතුයි

- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- මෙම කොටසට ලකුණු 60 ක් හිමි වේ.

01.

I. ඔබට සපයා ඇති ලංකා සිතියමේ පහත සඳහන් සියලු ම ස්ථාන ලකුණු කර නම් කරන්න.

(1). කලා ඔය (2). කෝට්ටේ (3). දඹකොළපටුන

(4). බටදොඹලෙන (5). මහනුවර (6). සීගිරිය

(ලකුණු 1 x 6 = 6)

II. පහත දී ඇති රූප සටහන් ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



A රූපය

(අ). A වලින් දැක්වෙන්නේ කව්රුන් ද?

(ආ). මොහු කුමන ජාතිකයෙක් ද?

(ඉ). මොහු ආසියාවට පැමිණීමට බලපෑ හේතුවක් සඳහන් කරන්න.

(ලකුණු 1 x 3 = 3)

III.



B රූපය

(අ). B රූපයේ දැක්වෙන රූපය කුමක් ද?

(ආ). මෙය ඉදිකරන ලද්දේ කව්රුන් ද?

(ඉ). මෙහි සිංහාසනය සඳහා යොදාගෙන ඇති සත්ත්වයා නම් කරන්න.

(ලකුණු 1 x 3 = 3)

02. " අනුරාධපුරය සියවස් පහළොවක් පමණ ලංකාවේ පාලන මධ්‍යස්ථානය විය. "

(i). අනුරාධපුරයේ ආරම්භක හා අවසන් පාලකයින් දෙදෙනා නම් කරන්න.

(II). අනුරාධපුරයේ සිංහාසනය සඳහා නිරන්තර අරගල පැවති රාජ වංස දෙක නම් කරන්න.

(III). අනුරාධපුර රාජධානියේ පරිහානියට බලපෑ හේතු කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 2 +4 +6 = 12)

03. **"පොළොන්නරු රාජධානියේ සිටි ශ්‍රේෂ්ඨතම පාලකයා වන්නේ පළවැනි පරාක්‍රමබාහු රජතුමා ය."**

(I). පළවෙනි පරාක්‍රමබාහු රජු පොළොන්නරුවේ පාලකයා වීමට පෙර බලය පිහිටුවා ගත් පාලන මධ්‍යස්ථාන දෙකක් නම් කරන්න.

(II). පළවැනි පරාක්‍රමබාහු රජුගේ වාරිමාර්ග කටයුතු බෙදා දැක්විය හැකි අදියර දෙක නම් කරන්න.

(III). මෙතුමාගේ ආගමික සේවාව කරුණු දෙකක් යටතේ උදාහරණ මගින් පෙන්වා දෙන්න.

(ලකුණු 2 +4 +6 = 12)

04. **" පොළොන්නරු රාජධානිය බිඳ වැටීමත් සමඟ මෙරට රාජධානි නිරිත දෙසට සංක්‍රමණය විය."**

(I). නිරිත ප්‍රදේශයේ බිහි වූ ප්‍රථම රාජධානි දෙක නම් කරන්න.

(II). ගම්පොළ යුගයේ රජ වූ රජවරු දෙදෙනෙකු නම් කරන්න.

(III). සිංහල පද්‍ය සාහිත්‍යයේ ස්වර්ණමය යුගය කෝට්ටේ යුගය ලෙස සැලකීමට හේතු වූ කරුණු දෙකක් උදාහරණ මගින් පැහැදිලි කරන්න.

(ලකුණු 2 +4 +6 = 12)

05. **මෙරට"පෘතුගීසි, ලන්දේසි පාලන යුග ඇසුරින් පහත මාතෘකා විස්තර කරන්න."**

(I). පෘතුගීසි යුගයේ සමාජ හා සංස්කෘතික බලපෑම.

(II). ලන්දේසි යුගයේ ආගමික බලපෑම. (ලකුණු 6 +6 = 12)

06. (I). ග්‍රීසියේ පැවති පෞර රාජ්‍ය දෙකක් නම් කරන්න.

(II). ග්‍රීක යුගයේ සම්පාදනය වූ සාහිත්‍ය කෘති දෙකක් නම් කරන්න.

(III). රෝම යුගයේ සාහිත්‍ය පිළිබඳ කරුණු දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 2 +4 +6 = 12)

07) (I). සොළොස් මහා ජනපදවල ප්‍රධාන පාලන ක්‍රම දෙක නම් කරන්න.

(II). මෙකල පැවති සමූහාණ්ඩු දෙකක් නම් කරන්න.

(III). සොළොස් මහා ජනපද අතුරින් මගධ රාජ්‍යයේ නැගීමට බලපෑ හේතු දෙකක් උදාහරණ මගින් පෙන්වා දෙන්න.

(ලකුණු 2 +4 +6= 12)

08. පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් පිළිබඳ ඓතිහාසික තොරතුරු විස්තර කරන්න.

(I). හයවන පරාක්‍රමබාහු රජුගේ ආගමික සේවය

(II). ග්‍රීකයන්ගේ පාලන ක්‍රමය

(III). පොළොන්නරු රාජධානියේ බිඳ වැටීම

(iv). සප්ත අපරිහානීය ධර්ම (ලකුණු 6 +6 = 12)

# මූලික පිරිවෙන් මධ්‍යවාර පරීක්ෂණය - 2019

## Primary Piriven Mid Term Test - 2019

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**04 ශ්‍රේණිය/**Grade **04**

ඉතිහාසය II
History II



සියලුම හිමිකම් ඇවිරිණි]
KOg; gjpg;Gupik cilaJ]
All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය
கல்வி அமைச்சு _பிரிவெனாக்கள் கல்விப் பிரிவு
Ministry of Education – Division of Piriven Education

මධ්‍ය වාර පරීක්ෂණය - 2022
இரண்டாம் தவணைப் பரீட்சை- 2022
**Mid Year Term Test - 2022**

පැය එකයි

**ඉතිහාසය - I** විභාග අංකය : ........................................... **4 ශ්‍රේණිය**

**සැලකිය යුතුය.**
- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**
- **01 සිට 40 තෙක් ප්‍රශ්නවලට දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.**
- **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.**
- **එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැළකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.**

➢ අංක 01 සිට 15 තෙක් එක් එක් ප්‍රශ්නයට ගැළපෙන පිළිතුර තෝරන්න.

01. අනුරාධපුර රාජධානියේ ආරම්භක පාලකයා කවුරුන් ද?
1) ධාතුසේන රජතුමා 2) දේවානම්පියතිස්ස රජතුමා
3) පණ්ඩුකාභය රජතුමා 4) දුටුගැමුණු රජතුමා

02. අනුරාධපුර රාජධානියේ අග භාගයේ හමුවන වැදගත් ම පාලකයා වනුයේ,
1) පස්වන මිහිඳු රජු ය. 2) ඉලනාග රජු ය.
3) හතරවන මිහිඳු රජු ය. 4) වසභ රජු ය.

03. අනුරාධපුර රාජධානියේ අවසන් සමයේ දී මෙරට ආක්‍රමණය කළ චෝළ ආක්‍රමණිකයා කවුරුන් ද?
1) රාජ රාජ චෝළ 2) ශ්‍රී මාර ශ්‍රී වල්ලභ 3) රාජේන්ද්‍ර චෝළ 4) කාලිංග මාඝ

04. චෝළයන් විසින් අනුරාධපුර රාජධානිය මුලුමනින් ම බිඳ දැමීම සිදු කළේ කිනම් වර්ෂයක ද?
1) ක්‍රි.ව. 1017 2) ක්‍රි.ව. 1025 3) ක්‍රි.ව. 993 4) ක්‍රි.ව. 1070

05. පොළොන්නරු රාජධානියේ ආරම්භක පාලකයා කවුරුන් ද?
1) නිශ්ශංකමල්ල රජු 2) පළමුවන විජයබාහු රජු
3) පළමුවන පරාක්‍රමබාහු රජු 4) අටවන වීර බාහු රජු

06. පොළොන්නරුව රාජධානිය පාලනය කළ රජ කෙනෙකු නොවන්නේ මින් කවුරුන් ද?
1) පළමුවන විජයබාහු රජු 2) දෙවන පරාක්‍රමබාහු රජු
3) නිශ්ශංකමල්ල රජු 4) පළමුවන පරාක්‍රමබාහු රජු

07. පළමුවන විජයබාහු රජතුමාගේ ළමා කාලය පිළිබඳ තොරතුරු ඇතුළත් අභිලේඛනය කුමක් ද?
1) පනාකඩුව තඹ සන්නස 2) බදුලු වැව් ලිපිය
3) තෝනිගල සෙල්ලිපිය 4) වෙවැල්කැටිය ශිලා ලේඛනය

08. පළමුවන පරාක්‍රමබාහු රජු ප්‍රථමයෙන් ම රාජ්‍යත්වයට පත් වූයේ කුමන ප්‍රදේශයේ ද?
1) රෝහණ දේශයේ 2) මලය දේශයේ 3) දක්ඛිණ දේශයේ 4) දඹදෙණියේ

09. පළමුවන පරාක්‍රමබාහු රජු හා දෙවන ගජබාහු රජු අතර රාජ්‍යත්වය සඳහා ඇති වූ සමගි සන්ධානය තොරතුරු සඳහන් සෙල්ලිපිය කුමක් ද?
1) සංගමු විහාර සෙල්ලිපිය 2) ගල්පොත ශිලා ලේඛනය
3) හෝපිටිගමුව ශිලාලේඛනය 4) තෝනිගල ශිලා ලේඛනය



www.pirivena.lk

10. කොට්ට බද්ධ සූකර, සූකර නිජ්ජ, දෝරදන්තික යන ජල ව්‍යාපෘති තුන ආරම්භ කරන ලද්දේ කුමන ඔය හරහා අමුණු බැඳීමෙන් ද?
   1) කිරිදිඔය   2) දැදුරුඔය   3) යාන් ඔය   4) මල්වතු ඔය

11. අඹන් ගඟේ අංගමැඩිල්ල නම් ස්ථානයෙන් අමුණක් බැඳ ජලය ලබා ගෙන ඇත්තේ කුමන වැව සඳහා ද?
   1) මින්නේරිය වැව   2) තෝපා වැව   3) පරාක්‍රම සමුද්‍රය   4) කලා ඔය

12. පළමුවන පරාක්‍රමබාහු රජු විසින් කරවන ලද පිරිවෙන් සංකීර්ණය කුමක් ද?
   1) මයුර පිරිවෙන   2) ආලාහන පිරිවෙන   3) විජයබා පිරිවෙන   4) සුනේත්‍රාදේවි පිරිවෙන

13. නිශ්ශංකමල්ල රජු කරවූ ශිලා ලේඛනය කුමක් ද?
   1) ගල්පොත ශිලාලිපිය   2) තෝනිගල ශිලාලිපිය
   3) සොරබොර වැව ලිපිය   4) වේවැල්කැටිය ශිලාලිපිය

14. පොළොන්නරු රාජධානියේ අවසන් පාලකයා වූයේ කවුරුන් ද?
   1) සහස්සමල්ල රජු   2) පරාක්‍රම පාණ්ඩ්‍ය රජු   3) ධර්මපාල රජු   4) වීරබාහු රජු

15. පොළොන්නරු රාජධානියට කාලිංග මාඝ ආක්‍රමණය එල්ල වූයේ කුමන වර්ෂයක ද?
   1) ක්‍රි.ව. 1017   2) ක්‍රි.ව. 1215   3) ක්‍රි.ව. 1225   4) ක්‍රි.ව. 1232

➢ අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් හතර බැගින් ලබා දී ඇත. ඒ නම් අතරින් එක් නමක් කවර හෝ හේතුවක් නිසා නොගැළපේ. එම නාමය තෝරන්න.

16. 1) වසභ රජතුමා   2) දෙවන පරාක්‍රමබාහු රජතුමා
   3) හතරවන මිහිඳු රජතුමා   4) අසේල රජතුමා

17. 1) පොළොන්නරුව   2) දඹදෙණිය   3) යාපහුව   4) පඬුවස්නුවර

18. 1) හංස සන්දේශය   2) ගුත්තිල කාව්‍යය   3) ලෝවැඩ සඟරාව   4) කව් සිළුමිණ

19. 1) පෘතුගාලය   2) බ්‍රිතාන්‍ය   3) ජර්මනිය   4) ඕලන්දය

20. 1) භරණ   2) ඵුස්සදේව   3) සුරනිමල   4) දීඝජන්තු

➢ අංක 21 සිට 25 දක්වා ප්‍රශ්නවල නාම ප්‍රකාශන යුගල හතර බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක් යුගල පදයක් එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන පද යුගලයට අදාළ අංකය තෝරා ලකුණු කරන්න.

21. 1) දඹදෙණිය - තුන්වන විජයබාහු රජු   2) යාපහුව - පළමුවැනි බුවනෙකබාහු රජු
   3) ගම්පොළ - හතරවන පරාක්‍රමබාහු රජු   4) කෝට්ටේ - හයවන බුවනෙකබාහු රජු

22. 1) පරාක්‍රම සමුද්‍රය - පළමුවන පරාක්‍රමබාහු රජු   2) මහවිලච්චිය වැව - වසභ රජු
   3) මින්නේරිය වැව - වළගම්බා රජු   4) කන්තලේ වැව - දෙවන අග්බෝ රජු

23. 1) දන්තුරේ සටන - පළමුවන විමලධර්මසූරිය රජු
   2) බලන සටන - සෙනරත් රජු
   3) රන්දෙණිවල සටන - රාජසිංහ කුමරු
   4) මුල්ලේරියාව සටන - පළමුවන රාජසිංහ රජු

24. 1) ක්‍රි.ව. 1017 දී - චෝළ ආක්‍රමණ   2) ක්‍රි.ව. 1215 දී - කාලිංග මාඝ ආක්‍රමණය
   3) ක්‍රි.ව. 1521 දී - මුල්ලේරියා සටන   4) ක්‍රි.ව. 1594 දී - දන්තුරේ සටන

25. 1) උත්තරාරාමය - පළමුවන පරාක්‍රමබාහු
   2) ආලාහන පිරිවෙන - පළමුවන වීරබාහු රජු
   3) හැටදාගෙය - නිශ්ශංකමල්ල
   4) ලංකාතිලක විහාරය - හතරවන බුවනෙකබාහු රජු

➢ 26 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති A, B, C, D යන ප්‍රතිචාර හතරක් දී ඇත. ඒවා අතුරින් දෙකක් පමණක් නිවැරදි ය. එම නිවැරදි ප්‍රතිචාර දෙක තෝරා අදාළ පිළිතුරු සලකුණු කරන්න.

(A) හා (B) පමණක් නිවැරදි නම්, අංක **1** ද,
(B) හා (C) පමණක් නිවැරදි නම්, අංක **2** ද,
(C) හා (B) පමණක් නිවැරදි නම්, අංක **3** ද,
(A) හා (D) පමණක් නිවැරදි නම්, අංක **4** ද,

සලකුණු කරන්න.

26. පෘතුගීසි පාලනය නිසා ඇති වූ ප්‍රතිඵල සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය වන්නේ කුමක් ද?
(A) - බොහෝ ප්‍රදේශවල කතෝලික දේවස්ථාන ඇති වීම.
(B) - දෙමළ හා සිංහල භාෂාවලින් ආගම් ප්‍රචාරය ඇරඹීම.
(C) - යාපනයේ පැවති තේසවලාමේ නීති ක්‍රමය යාවත් කිරීම.
(D) - කෝට්ටේ රජ පවුල්වල අය කතෝලික ආගමට හරවා ගැනීම.

27. පෘතුගීසීන් හා උඩරට පාලකයන් අතර ඇති වූ සටන් සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය වන්නේ,
(A) - 1594 දන්තුරේ සටන
(B) - 1602 බලන සටන
(C) - 1638 රන්දෙනිවල සටන
(D) - 1630 ගන්නෝරුව සටන

28. යාපනයේ රාජ්‍ය පෘතුග්‍රීසීන් යටතට පත් වීම සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ මොනවා ද?
(A) - පාලකයා කතෝලික ආගම වැළඳ ගැනීම.
(B) - රාජ්‍ය උරුමකරුවන් අතර බල අරගල.
(C) - යාපනයේ කතෝලික ජනතාවගේ සහයෝගය පෘතුගීසීන්ට හිමි වීම.
(D) - පෘතුගීසීන් ජනතා පීඩාකාරී පාලනයක් ගෙන යාම.

29. යුරෝපා ජාතීන් පෙරදිගට පැමිණීම සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය වන්නේ,
(A) - කොන්ස්තන්තිනෝපල් වරාය තුර්කි මුස්ලිම්වරුන් යටතට පත් වීම.
(B) - ඉතා පහසුවෙන් ආසියාවෙන් කුළුබඩු ලබා ගැනීමට හැකි වීම.
(C) - තුර්කි මුස්ලිම්වරුන් විසින් භාණ්ඩ හිඟයක් ඇති කිරීම.
(D) - ආසියාතික රටවල් ඉතා පහසුවෙන් යටත් කර ගැනීමට හැකිවීම.

30. කෝට්ටේ යුගයේ ලියැවුණු සාහිත්‍ය කෘති පිළිබඳව නිවැරදි පිළිතුරු මොනවාද?
(A) - ගුත්තිල කාව්‍ය
(B) - පන්සිය පනස් ජාතක පොත
(C) - ලෝවැඩ සඟරාව
(D) - මහාවංසය

➢ අංක 31 සිට 35 දක්වා ප්‍රශ්න සඳහා X හා Y තීරුවල නාම ප්‍රකාශන සමූහයක් දී ඇත. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නොවේ. Y තීරය X තීරය සමඟ ගැළපෙන අනුපිළිවෙලට සකස් කළ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරා ලකුණු කරන්න.

31.

| X | Y |
|---|---|
| 1) පෘතුගීසින් | A. ප්‍රංශය |
| 2) ලන්දේසින් | B. බ්‍රිතාන්‍ය |
| 3) ප්‍රංශයින් | C. පෘතුගාලය |
| 4) ඉංග්‍රීසින් | D. ඕලන්දය |

1) A , C , D , B  2) C , D , A , B  3) D , C , B , A  4) B , C , A , D

32.

| X | Y |
|---|---|
| 1) දෙවන රාජසිංහ රජු | A. සීතාවක |
| 2) දෙවන පරාක්‍රමබාහු රජු | B. කෝට්ටේ |
| 3) පළමුවන රාජසිංහ රජු | C. දඹදෙණිය |
| 4) වීර පරාක්‍රමබාහු රජු | D. උඩරට |

1) D , C, A , B  2) C , A , B , D  3) B , A , C , D  4) A , B , D , C



www.pirivena.lk

33. X | Y

| X | Y |
|---|---|
| 1) බලන | A. 1638 |
| 2) රන්දෙනිවල | B. 1594 |
| 3) දන්තුරේ | C. 1602 |
| 4) ගන්නෝරුව | D. 1630 |

1) B , D , C , A 2) C , A , D , B 3) C , D , B , A 4) A , C , B , D

34.

| X | Y |
|---|---|
| 1) කුසුමාසන දේවිය | A. දොන් ජුවාන් |
| 2) යමසිංහ බණ්ඩාර | B. දොන් ජුවාන් ධර්මපාල |
| 3) කොනප්පු බණ්ඩාර | C. දෝනකතරිනා |
| 4) ධර්මපාල | D. දොන් පිලිප් |

1) C , D , A , B 2) A , B , D , C 3) C , A , B , D 4) D , A , B , C

35.

| X | Y |
|---|---|
| 1) සංගමු විහාර සෙල්ලිපිය | A. නිශ්ශංකමල්ල රජතුමා |
| 2) පනාකඩුව තඹ සන්නස | B. දෙවන පරාක්‍රමබාහු රජු |
| 3) ගල්පොත ලේඛනය | C. පළමුවන පරාක්‍රමබාහු රජු |
| 4) දඹදෙණි කතිකාවත | D. පළමුවන විජයබාහු රජු |

1) B , A , D , C 2) C , A , D , B 3) C , D , A , B 4) D , A , B , C

➢ අංක 36 සිට 40 තෙක් ප්‍රශ්නවලට ප්‍රකාශන දෙක බැගින් දී ඇත. ඒ ඒ ප්‍රශ්නයට දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙන්නේ පහත වගුවෙහි දැක්වෙන කවර ප්‍රකාශ යුගලයක් දැයි තෝරා, එහි අංකය සලකුණු කරන්න.

| වරණ අංකය | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 1 | නිවැරදි ය. | නිවැරදි ය. |
| 2 | නිවැරදි ය. | වැරදි ය. |
| 3 | වැරදි ය. | නිවැරදි ය. |
| 4 | වැරදි ය. | වැරදි ය. |

| | පළමු ප්‍රකාශය | දෙවෙනි ප්‍රකාශය |
|---|---|---|
| 36. | පොළොන්නරු රාජධානියේ ආරම්භක පාලකයා පළමුවෙනි විජයබාහු රජු ය. | පළමුවන විජයබාහු රජු මුල්ම පාලන මධ්‍යස්ථානය ලෙස තෝරාගත්තේ යාපහුව ය. |
| 37. | හතරවන පරාක්‍රමබාහු රජු කෝට්ටේ රාජධානිය සිටි වැදගත් පාලකයෙකි. | හතරවන පරාක්‍රමබාහු රජ විසින් තම මව සිහිවීම පිණිස පැපිලියානේ සුනේත්‍රාදේවී පිරිවෙන කරවා ඇත. |
| 38. | පෘතුගාලයේ හෙන්රි කුමරු දේශගවේශන ව්‍යාපාරයේ පුරෝගාමියා විය. | දේශගවේශනයේ මුලින්ම නිරත වූයේ ප්‍රංශය හා ඕලන්දය යි. |
| 39. | පළමුවන බුවනෙකබාහු රජු විසින් බෙලිගල දළදා මැදුරක් ඉදි කර ඇත. | පළමුවන බුවනෙකබාහු රජු ඊජිප්තු සුල්තාන්වරයා සමග රාජ්‍ය සම්බන්ධතා ඇති කර ගෙන ඇත. |
| 40. | ධර්මපාල රජු විසින් 1580 දී තෑගි ඔප්පුවක් මගින් කෝට්ටේ රාජ්‍යය පෘතුගීසීන්ට පවරා දී ඇත. | හිරිපිටියේ නිලමේ විසින් කෝට්ටේ තිබූ දළදා වහන්සේ සීතාවකට වැඩම කරවා ඇත. |

(ලකුණු 1 × 40 = 40)



www.pirivena.lk

සියලුම හිමිකම් ඇවිරිණි]
KOg; gjpg;Gupik cilaJ]
All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය
கல்வி அமைச்சு _பிரிவெனாக்கள் கல்விப் பிரிவு
Ministry of Education – Division of Piriven Education

**මධ්‍ය වාර පරීක්ෂණය - 2022**
**இரண்டாம் தவணைப் பரீட்சை- 2022**
**Mid Year Term Test - 2022**

පැය දෙකයි

**ඉතිහාසය - II** **4 ශ්‍රේණිය**

❖ **පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ද තෝරා ගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

01. I. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් ස්ථාන ලකුණු කර නම් කරන්න.

| | | |
|---|---|---|
| 1. කොළඹ | 2. කෝට්ටේ | 3. යාපනය |
| 4. ත්‍රිකුණාමලය | 5. මඩකලපුව | 6. මහනුවර |

(ලකුණු 06)

➢ පහත දී ඇති රූප සටහන් ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.


A රූපය

II. a. A රූපයෙන් දැක්වෙන්නේ කුමක් ද?

b. මෙය පිහිටි දිස්ත්‍රික්කය කුමක් ද?

c. මෙය ඉදිකරන ලද්දේ කවුරුන් විසින් ද?

(ලකුණු 03)


B රූපය

III. a. B රූපයෙන් දැක්වෙන චිත්‍රය කුමක් ද?

b. මෙම සිතුවම් පිළිබඳ ගවේෂණය කළ පුරාවිද්‍යාඥයා කවුරුන් ද?

c. මෙම චිත්‍ර දක්නට ලැබෙන ආලකමන්දාව නිර්මාණය කළ පාලකයා කවුරුන් ද?

(ලකුණු 03)

02. I. අනුරාධපුර රාජධානියේ ආරම්භක පාලකයා සහ අවසාන පාලකයා කවුරුන් ද? (ලකුණු 02)

II. අනුරාධපුර රාජධානිය බිඳ වැටීමට බලපෑ හේතු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

III. අනුරාධපුර යුගයේ පැවති වාරි තාක්ෂණය පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 06)

03. I. පොළොන්නරු රාජධානියේ රචිත කෘති දෙකක් නම් කරන්න. (ලකුණු 02)

II. මහා විජයබාහු රජතුමාගේ වාරි කර්මාන්ත දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

III. මෙම රජුගේ ආගමික මෙහෙවර කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)


www.pirivena.lk

04. I. නිශ්ශංකමල්ල රජු විසින් සිදු කරන ලද ආගමික සේවාවන් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

II. එම රජතුමාට මුහුණ දීමට සිදු වූ අභියෝග හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

III. මහා පරාක්‍රමබාහු රජුගේ ආර්ථික සේවාවන් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

05. I. කෝට්ටේ යුගයේ රචනා කළ සංදේශ කාව්‍ය දෙකක් නම් කරන්න. (ලකුණු 02)

II. මෙම රජතුමා පිළිබඳව අධ්‍යනය කිරීමට ඇති මූලාශ්‍ර හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

III. හයවන පරාක්‍රමබාහු රජතුමාගේ දේශපාලන හා ආගමික මෙහෙවර අගයන්න. (ලකුණු 06)

06. I. යුරෝපා ජාතීන්ට පෙරදිගට පැමිණීමට සිදු වූ ප්‍රධාන සාධක දෙකක් නම් කරන්න. (ලකුණු 02)

II. ආසියාවේ බලය පිහිටු වූ යුරෝපීය රටවල් හතරක් නම් කරන්න. (ලකුණු 04)

III. යුරෝපා ජාතීන් ශ්‍රී ලංකාවේ ආනයනය අපනයන වෙළදාම සඳහා යොමු වූ ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

07. I. උඩරට රාජ්‍යයේ පැවති විවාහ සම්ප්‍රදා දෙකක් නම් කරන්න. (ලකුණු 02)

II. පහත සඳහන් අය පෘතුගීසින් යටතේ බව්තීස්ම ලැබූ නාමයන් සඳහන් කරන්න. (ලකුණු 04)

1. ධර්මපාල රජු
2. කුසුමාසන දේවිය
3. යමසිංහ බණ්ඩාර
4. කොනප්පු බණ්ඩාර

III. පෘතුගීසින්ගේ උඩරට ආක්‍රමණ අසාර්ථක වීමට බලපෑ හේතු හතරක් සඳහන් කර, කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

(ලකුණු 06)

08. I. ලන්දේසීන් මෙරටට පැමිණීමට බලපෑ හේතු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

II. ලන්දේසි මුහුදුබඩ ප්‍රදේශ පාලනය සඳහා සකස් කළ කොමාන්ඩරි දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

III. ලන්දේසි නිසා මෙරට සමාජයට ඇති වූ බලපෑම කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)



www.pirivena.lk

සියලුම හිමිකම් ඇවිරිණි]
KOg; gjpg;Gupik cilaJ]
All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය
கல்வி அமைச்சு _பிரிவெனாக்கள் கல்விப் பிரிவு
Ministry of Education – Division of Piriven Education

මධ්‍ය වාර පරීක්ෂණය - 2022
இரண்டாம் தவணைப் பரீட்சை- 2022
**Mid Year Term Test - 2022**

පැය දෙකයි

**ඉතිහාසය - II** **4 ශ්‍රේණිය**

දෙවන පත්‍රයේ ප්‍රශ්න අංක 01 (i) ට පිළිතුරු සැපයීම සඳහා මෙම සිතියම භාවිතා කරන්න. පිළිතුරු සැපයීමෙන් පසුව මේ ඔබේ පිළිතුරු පත්‍රය සමග අමුණා භාර දෙන්න. විභාග අංකය. .............................






www.pirivena.lk

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

**අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය**
கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு
Ministry of Education – Division of Piriven Education

**මධ්‍ය වාර පරීක්ෂණය - 2023**
இரண்டாம் தவணைப் பரீட்சை - 2023
Mid Term Test – 2023

**පැය තුනයි**

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

**අමතර කියවීම් කාලය මිනිත්තු 10 යි.**

**ඉතිහාසය - I, II** **4 ශ්‍රේණිය**

## ඉතිහාසය - I

සැලකිය යුතුයි :
- ❖ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.
- ❖ අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ❖ ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.
- ❖ එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

- **අංක 01 සිට 15 තෙක් එක් එක් ප්‍රශ්නයට ගැළපෙන පිළිතුර තෝරන්න.**

01. අනුරාධපුර නගරය පිහිටියේ,
 1. කලා ඔය අසල ය. 2. මහවැලි ගඟ අසල ය. 3. යාන් ඔය අසල ය. 4. මල්වතු ඔය අසල ය.

02. මෙරට ඉතිහාසයේ දෙවන අගනුවර හැඳින්වූ නම කුමක් ද?
 1. ජනනාථපුර ය. 2. මාගම්පුර ය. 3. හස්තිසෛලපුර ය. 4. ජයවර්ධනපුර ය.

03. 'ගඟසිරිපුර' ලෙස හඳුන්වන්නේ මින් කුමක් ද?
 1. යාපහුව 2. පොළොන්නරුව 3. ගම්පොළ 4. කෝට්ටේ

04. ලම්බකරණ යනු,
 1. අනුරාධපුරයේ සිටි පාලකයෙකි. 2. රාජ්‍ය පෙළපතකි.
 3. රාජ්‍ය නිල නාමයකි. 4. ආක්‍රමණිකයෙකි.

05. අනුරාධපුර යුගයේ පල්ලවයන් සමඟ එකතු වී පාණ්ඩ්‍යයන්ට එරෙහිව සටන් කළ ලාංකික පාලකයා කවුද?
 1. දුටුගැමුණු රජු 2. මානවම්ම රජු
 3. පළමුවන විජයබාහු රජු 4. පස්වන මිහිඳු රජු

06. හතරවන දප්පුල රජු සමයේ රාජ්‍ය කකුද භාණ්ඩ ආරක්ෂා කිරීම සඳහා මෙරටේ තබා ගිය පාණ්ඩ්‍ය පාලකයා කවුද?
 1. දෙවන වරගුණවර්මන් ය. 2. දෙවන මාරවර්මන් ය.
 3. දෙවන චාර්වර්මන් ය. 4. දෙවන ගුණවර්මන් ය.

07. **'මුම්මුඩිචෝළ මණ්ඩලම්'** යනුවෙන් හඳුන්වන්නේ මින් කුමක් ද?,
 1. චෝළයන් යටතේ පැවති කේරළ ප්‍රදේශය යි.
 2. චෝළයන් යටතේ පැවති පාණ්ඩ්‍ය ප්‍රදේශය යි.
 3. චෝළයන් යටතේ වූ මාලදිවයින යි.
 4. චෝළයන් යටතේ වූ ලංකාවේ උතුරු ප්‍රදේශය යි.

08. **'රාජ රාජ පෙරුම් පල්ලිය'** ලෙස හැඳින්වෙන්නේ,
   1. පොළොන්නරුවේ කිරි වෙහෙර යි.
   2. ත්‍රිකුණාමලයේ ගෝකණ්ණ වෙහෙර යි.
   3. ත්‍රිකුණාමලයේ වෙල්ගම් වෙහෙර යි.
   4. දැදිගම කොටවෙහෙර යි.

09. **'ජනනාථ මංගලම්'** යනුවෙන් හඳුන්වනුයේ,
   1. අනුරාධපුරය 2. පොළොන්නරුව 3. යාපහුව 4. දඹදෙණිය

10. පළමුවන විජයබාහු රජුගේ මව කවුරුන් ද?
   1. අනුලා දේවිය 2. ලෝකිතා දේවිය 3. සුනේත්‍රා දේවිය 4. කුසුමාසන දේවිය

11. **'අහසින් වැටෙන එක දිය බිඳකුදු ප්‍රයෝජනයට නොගෙන මුහුදට ගලා යාමට ඉඩ නොදිය යුතු ය.'** මෙම ප්‍රකාශය කළේ කුමන රජු ද?
   1. දුටුගැමුණු රජු ය. 2. ධාතුසේන රජු ය.
   3. පළමුවන පරාක්‍රමබාහු රජු ය. 4. දෙවන පරාක්‍රමබාහු රජු ය.

12. **'දෙවනගල සෙල්ලිපිය'** කරවූයේ,
   1. හතරවන මිහිඳු රජතුමා ය. 2. පස්වන මිහිඳු රජතුමා ය.
   3. පළමුවන විජයබාහු රජතුමා ය. 4. පළමුවන පරාක්‍රමබාහු රජතුමා ය.

13. **'පාර්වතී දේවිය'** යනු,
   1. නිශ්ශංකමල්ල රජුගේ මව යි. 2. නිශ්ශංකමල්ල රජුගේ බිසව යි.
   3. නිශ්ශංකමල්ල රජුගේ සහෝදරිය යි. 4. නිශ්ශංකමල්ල රජුට සම්බන්ධයක් නැත.

14. **'හැටදාගෙය'** නම් දළඳ මන්දිරය ඉදි කළේ කවුරුන් ද?
   1. පළමුවන විජයබාහු රජු ය. 2. පළමුවන පරාක්‍රමබාහු රජු ය.
   3. නිශ්ශංකමල්ල රජු ය. 4. ලීලාවතී රැජිණ ය.

15. පෘතුගීසීන් ලංකාවට පැමිණෙන විට කෝට්ටේ රාජ්‍යයේ සිටි පාලකයා,
   1. හයවන පරාක්‍රමබාහු රජු ය. 2. අටවන වීර පරාක්‍රමබාහු රජු ය.
   3. හතරවන පරාක්‍රමබාහු රජු ය. 4. නමවන ධර්ම පරාක්‍රමබාහු රජු ය.

- **අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් හතර බැගින් ලබා දී ඇත. ඒවා අතුරින් එක් නමක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග නොගැළපේ. එම නොගැළපෙන නාමය තෝරන්න.**

16. 1. මුල්ලේරියා සටන 2. බලන සටන 3. දන්තුරේ සටන 4. රන්දෙනිවල සටන

17. 1. දිසාවේ 2. කෝරාළ 3. අතුකෝරාළ 4. ඔපර් හුට්ස්මන්

18. 1. සබරගමුව 2. යටිනුවර 3. දුම්බර 4. හේවාහැට

19. 1. පෘතුගාලය 2. ප්‍රංශය 3. ඕලන්දය 4. එංගලන්තය

20. 1. කොට්ටබද්ද 2. සූකරනිජ්ජර 3. කොට්ටල් බද්ද 4. දෝරදත්තික

- **අංක 21 සිට 25 තෙක් ප්‍රශ්නවල නාම/ප්‍රකාශන යුගල හතර බැගින් ලබා දී ඇත. ඒවා අතුරෙන් එක් නාම / ප්‍රකාශන යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන නාම / ප්‍රකාශන යුගලය තෝරන්න.**

21. 1. අනුරාධපුරය - පස්වන මිහිඳු 2. පොළොන්නරුව - කල්‍යාණවතී බිසව
   3. දඹදෙණිය - තුන්වන විජයබාහු 4. යාපහුව - හතරවන පරාක්‍රමබාහු

22. 1. ආලාහන පිරිවෙන - පළමුවන විජයබාහු
2. උත්තරාරාමය - පළමුවන පරාක්‍රමබාහු
3. රන්කොත් වෙහෙර - නිශ්ශංකමල්ල
4. ලංකාතිලක විහාරය - සේනාධිලංකාර සෙනෙවිරදුන්

23. 1. කුසුමාසන දේවිය - දෝන කතිරිනා
2. මායාදුන්නේ රජු - දොන් ජෙරනිමෝ ද අසවේදු
3. යමසිංහ බණ්ඩාර - දොන් පිලිප්
4. කොනප්පු බණ්ඩාර - දොන් ජුවාන්

24. 1. 1498 - වස්කෝද ගාමා ඉන්දියාවේ කැලිකට් වරායට පැමිණීම.
2. 1505 - ෆ්‍රැන්සිස්කෝද අල්මේදා ලංකාවේ ගාලු වරායට පැමිණීම.
3. 1580 - තෑගි ඔප්පුවක් මගින් කෝට්ටේ රාජ්‍ය පෘතුගීසින්ට පැවරීම.
4. 1619 - පෘතුගීසින් යාපන රාජ්‍යය යටත් කර ගැනීම.

25. 1. දන්තුරේ සටන - පේරෝ ලෝපෙස් ද සූසා
2. බලන සටන - දොන් ජෙරනිමෝ ද අසවේදු
3. රන්දෙනිවල සටන - කොන්ස්තන්තිනූ ද සා
4. ගන්නෝරුව සටන - වස්කෝද ගාමා

- **අංක 26 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති (A), (B), (C) හා (D) යන ප්‍රතිචාර හතරක් දී ඇත. ඒවා අතුරෙන් දෙකක් නිවැරදිය. එම නිවැරදි ප්‍රතිචාර දෙක තෝරන්න.**

**A හා B නිවැරදි නම්, අංක 1 ද, B හා C නිවැරදි නම්, අංක 2 ද,**
**B හා D නිවැරදි නම්, අංක 3 ද, A හා D නිවැරදි නම්, අංක 4 ද,**
**ලකුණු කරන්න.**

26. චෝළයින් පොළොන්නරුව පාලන මධ්‍යස්ථානය ලෙස තෝරා ගත්තේ,
A. රෝහණයත්, අනුරාධපුරයත් අතර ගමන් මාර්ගයේ පිහිටීම නිසා ය.
B. ගිරි දුර්ග, ජල දුර්ගවලින් සමන්විත වීම නිසා ය.
C. මහාතිත්ථ වරායට පහසුවෙන් යාමට ඒමට හැකි වීම නිසා ය.
D. කෘෂිකර්මාන්තය හා වාණිජමය වශයෙන් වැදගත් වීම නිසා ය.

27. අනුරාධපුර රාජධානිය බිඳ වැටීමට හේතු වූයේ,
A. අනුරාධපුර යුගයේ අවසාන භාගයේ සිදු වූ දේශපාලන හා ආර්ථික පරිහානිය
B. සිවිල් අරගල හා චෝළ ආක්‍රමණය
C. පාණ්ඩ්‍ය හා කාලිංග වංශිකයන් අතර බලය සඳහා වූ අරගල
D. කාලිංග මාඝගේ ව්‍යසනකාරී ආක්‍රමණය

28. නිශ්ශංකමල්ල රජුට මුහුණ පෑමට සිදු වූ අභියෝග වන්නේ,
A. ඔහු බුදුදහමට එරෙහි ව කටයුතු කිරීම.
B. නිශ්ශංකමල්ල කාලිංග වංශිකයකු වීම.
C. ආධිපාද, මහාධිපාද තනතුරු දරා තිබීම.
D. රාජ්‍ය නිළධාරින්ගෙන් එල්ල වූ තර්ජන

29. කෝට්ටේ යුගයේ සිටි ප්‍රකට පඬිවරු වන්නේ,

A. දෙවන පරාක්‍රමබාහු රජු
B. වෑත්තෑවේ හිමි
C. කැරගල වනරතන හිමි
D. දිඹුලාගල මේධංකර හිමි

30. 1638 උඩරට ලන්දේසි ගිවිසුමේ මූලික කරුණු දෙකක් වන්නේ,

A. පෘතුගීසීන් මෙරටින් පළවා හැරීමට රජුට සහය දීමට ලන්දේසීන් එකඟ වීම.
B. ඒ සඳහා යන සියලු වියදම් ලන්දේසීන් දරන බව.
C. ඇතුන් හැර උඩරට සෙසු වෙළඳ ද්‍රව්‍ය පිළිබඳ ඒකාධිකාරය රජුට ලබා දෙන බව.
D. පෘතුගීසීන්ගෙන් අල්ලා ගන්නා ලද බලකොටුවල රජු කැමති නම් ලන්දේසි හමුදාව නතර කරවීමට එකඟ වීම.

- **31 - 35 තෙක් දක්වා ඇති නාම / ප්‍රකාශන සමූහයක් X හා Y තීරුවල දී ඇත. X තීරුවේ දී ඇති නාම / ප්‍රකාශන Y තීරුවේ නාම / ප්‍රකාශන සමඟ කිසියම් ආකාරයට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නොවේ. X තීරුවේ ඒවා Y තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.**

31.

| X | Y |
|---|---|
| 1. අටවන වීරපරාක්‍රමබාහු රජු | A. අද්මිරාල් වෙස්ටර් වෝල්ඩ් |
| 2. පළමුවන විමලධර්මසූරිය රජු | B. ලොරෙන්සෝ ද අල්මේදා |
| 3. දෙවන රාජසිංහ රජු | C. විලේම් ෆල්ක් |
| 4. කීර්ති ශ්‍රී රාජසිංහ රජු | D. ජෝරිස් වැන් ස්පීල්බර්ජන් |

1. A B C D  2. B D A C  3. C D A B  4. D A B C

32.

| X | Y |
|---|---|
| 1. 1639 | A. මන්නාරම හා යාපනය |
| 2. 1652 | B. කොළඹ කොටුව |
| 3. 1656 | C. කළුතර අඟුරුවාතොට |
| 4. 1658 | D. ත්‍රිකුණාමලය |

1. A B C D  2. B C A D  3. C D B A  4. D C B A

33.

| X | Y |
|---|---|
| 1. කෝට්ටේ රාජ්‍යය | A. රයිගම් බණ්ඩාර |
| 2. සීතාවක රාජ්‍යය | B. සේනාසම්මත වික්‍රමබාහු |
| 3. රයිගම් රාජ්‍යය | C. හත්වන බුවනෙකබාහු |
| 4. මහනුවර රාජ්‍යය | D. මායාදුන්න |

1. A C B D  2. B A C D  3. C D A B  4. D A B C

34.

| X | Y |
|---|---|
| 1. කිත්ති කුමරු | A. දෙවන පරාක්‍රමබාහු රජු |
| 2. කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත | B. පළමුවන රාජසිංහ රජු |
| 3. කන්ද උඩරට ද්‍රෝහියා | C. පළමුවන විජයබාහු රජු |
| 4. ටිකිරි කුමරු | D. පළමුවන විමලධර්මසූරිය රජු |

1. A B C D  2. B D C A  3. C A D B  4. D A C B

35. **X** **Y**

1. තේසවලාමේ නීතිය — A. යාපනයේ නීතිය
2. රාද්වෑන් ජස්ටිට් — B. සිවිල් උසාවිය
3. ලෑන්ඩ්රාද් — C. මහාධිකරණය
4. සිවිල්රාද් — D. ඉඩම් උසාවිය

1. A C D B  2. B A C D  3. D A B C  4. C A B D

- **36 සිට 40 දක්වා ඇති එක් එක් ප්‍රශ්නයෙහි ප්‍රකාශ දෙක බැගින් ඇතුළත් වේ. ඒ ඒ ප්‍රශ්නයට දී ඇති ප්‍රකාශ යුගලයට ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන කවර ප්‍රකාශ යුගලය දැයි තෝරා එහි අංකය සලකුණු කරන්න.**

| වරණ අංකය | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 1 | නිවැරදි ය. | නිවැරදි ය. |
| 2 | නිවැරදි ය. | වැරදි ය. |
| 3 | වැරදි ය. | වැරදි ය. |
| 4 | වැරදි ය. | නිවැරදි ය. |

| | පළමුවන ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 36. | අනුරාධපුර රාජධානිය වසර 1500 ක් පමණ පැවති අතර ක්‍රි.ව.1017 දී එය බිඳ වැටුණි. | පොළොන්නරු රාජධානිය වසර 500 ක් පමණ පැවති අතර එය ක්‍රි.ව.1300 දී බිඳ වැටුණි. |
| 37. | පළමුවන විජයබාහු රජු කතරගම ලෝකේශ්වර මරා මුලින්ම එහි රජ විය. | පළමුවන පරාක්‍රමබාහු මුලින්ම දක්ඛිණ දේශයේ පාලකයා බවට පත් විය. |
| 38. | 16 වන සියවසේ ලංකාවේ පැවති දේශපාලන තත්ත්වය ලන්දේසීන්ට මෙරට බලය අල්ලා ගැනීමට විශාල පිටුවහලක් විය. | දෙවන රාජසිංහ රජු 1638 පෘතුගීසීන් සමඟ ගිවිසුමට අත්සන් කළේ ලන්දේසීන් පළවා හැරීමට ය. |
| 39. | පෘතුගීසි පාලන සමයේ රෙපරමාදු ආගමත් සමඟ ඔවුන්ගේ සංස්කෘතිය මෙරටේ ප්‍රචලිත විය. | ලන්දේසීන් කතෝලිකයන් මර්දනය සඳහා විවිධ අණපනත් ගෙන ආ අතර නිල බලය ද භාවිත කළහ. |
| 40. | පෘතුගීසීන් මෙරට පැවති පාලන ක්‍රමය එලෙසම පවත්වාගෙන යමින් තම ආර්ථික ලාභ උපයා ගත් හ. | ලන්දේසීන් පහතරට ප්‍රදේශ පාලනය කිරීමේ දී '**කොමන්ඩරි**' නමින් පාලන බල ප්‍රදේශ තුනකට බෙදන ලදී. |


www.pirivena.lk

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය
கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு
Ministry of Education – Division of Piriven Education

**මධ්‍ය වාර පරීක්ෂණය - 2023**
இரண்டாம் தவணைப் பரீட்சை - 2023
Mid Term Test – 2023

**ඉතිහාසය - II** **4 ශ්‍රේණිය**

**සැලකිය යුතුයි :**
- **පළමුවන ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

01. I. ඔබට සපයා ඇති ශ්‍රී ලංකා ආකෘති සිතියමේ පහත සඳහන් ස්ථාන ලකුණු කර නම් කරන්න.

| | | |
|---|---|---|
| 1. ගෝකණ්ණතිත්ථ | 2. කැලණි ගඟ | 3. දෙවිනුවර |
| 4. යාපහුව | 5. නාගදීපය | 6. ගම්පොළ |

(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 × 6 = 06)

II. පහත A හා B රූප සටහන් අධ්‍යයනය කොට ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(අ) A අක්ෂරයෙන් දැක්වෙන රූපය කුමක් ද?

(ආ) එය රාජධානිය කරගත් පළමු පාලකයා කවුද?

(ඉ) මෙම රාජධානි සමයේ මෙරටට එල්ල වූ විදේශීය ආක්‍රමණය කුමක් ද?



A රූපය
(ලකුණු 1 × 3 = 3)

III. (අ) B රූපයෙන් දැක්වෙන්නේ කවු ද?

(ආ) ඔහු ව්‍යාප්ත කළේ කුමන ශිෂ්ටාචාරයේ අංග ලක්ෂණ ද?

(ඉ) එතුමා විසින් ආක්‍රමණය කළ රාජ්‍යයක් නම් කරන්න.



B රූපය
(ලකුණු 1 × 3 = 3)

02. I. අනුරාධපුර රාජධානිය බිඳ වැටීමට හේතු වූ කරුණු දෙකක් නම් කරන්න. (ලකුණු 02)

II. චෝළයින්, පොලොන්නරුව තම පාලන මධ්‍යස්ථානය ලෙස තෝරා ගැනීමට හේතු වූ කරුණු හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

III. පොලොන්නරුවේ බලයට පත් පළමුවන විජයබාහුගේ වැදගත්කම කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)



www.pirivena.lk

03. I. පළමුවන විජයබාහු පොලොන්නරුව තම පාලන මධ්‍යස්ථානය වශයෙන් තෝරා ගැනීමට හේතු වූ කරුණු දෙකක් නම් කරන්න. (ලකුණු 02)

II. පළමුවන පරාක්‍රමබාහු රජු ඉදි කළ ආගමික ඉදිකිරීම් හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

III. පළමුවන පරාක්‍රමබාහු රජු කෘෂි ආර්ථික සංවර්ධනයට දැක් වූ අනුග්‍රහය කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

04. I. නිශ්ශංකමල්ල රජුගේ මව්පියන් නම් කරන්න. (ලකුණු 02)

II. නිශ්ශංකමල්ල රජුගේ ආගමික සේවාවන් දෙකක් දක්වන්න. (ලකුණු 04)

III. එතුමාට මෙරට සිහසුන දැරීමේ දී මුහුණ දීමට සිදු වූ අභියෝග තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

05. I. දඹදෙණි යුගයේ දෙවන පරාක්‍රමබාහු රජතුමා විසින් ලියූ ග්‍රන්ථ දෙකක් නම් කරන්න. (ලකුණු 02)

II. දෙවන පරාක්‍රමබාහු රජුගේ ආගමික සේවාවන් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

III. කෝට්ටේ යුගයේ 6 වන පරාක්‍රමබාහු රජුගේ රාජ්‍ය කාලයේ වැදගත්කම කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

06. I. ක්‍රි.ව.1505 පෘතුගීසින් එනවිට ලංකාවේ පැවති රාජ්‍ය අතරින් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

II. යුරෝපීයන් පෙරදිග ලෝකයට පැමිණීමේ අරමුණු දෙකක් දක්වන්න. (ලකුණු 04)

III. පෘතුගීසින්ගේ උඩරට ආක්‍රමණයන් අසාර්ථක වීමට හේතු වූ කරුණු දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

07. I. ලන්දේසි පාලන සමයේ උඩරට රාජ්‍යයේ සිටි පාලකයන් දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු 02)

II. ලන්දේසීන් විසින් අල්ලාගත් නගර හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

III. ලන්දේසි පාලනය නිසා ඇති වූ ආගමික හා සමාජ බලපෑම් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

08. පහත සඳහන් මාතෘකා අතරින් **දෙකක්** පිළිබඳ ඓතිහාසික කෙටි සටහන් ලියන්න.

I. යාපහුව රාජධානිය

II. IV වන පරාක්‍රමබාහු රජතුමා

III. පෘතුගීසි සමයේ සමාජ සංස්කෘතික බලපෑම්

IV. 1638 උඩරට ලන්දේසි ගිවිසුම

(ලකුණු 6 × 2 = 12)



www.pirivena.lk

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය
கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு
Ministry of Education – Division of Piriven Education

**මධ්‍ය වාර පරීක්ෂණය - 2023**

இரண்டாம் தவணைப் பரீட்சை - 2023

Mid Term Test – 2023

**ඉතිහාසය - II**

**සැලකිය යුතුයි :**

❖ දෙවන ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න අංක 01 (I) ට පිළිතුරු සැපයීම සඳහා මෙම සිතියම භාවිත කරන්න. පිළිතුරු සැපයීමෙන් පසුව මෙය ඔබේ පිළිතුරු පත්‍රය සමඟ අමුණා බාර දෙන්න.






www.pirivena.lk

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය පිරිවෙන් අධ්‍යාපන අංශය -/Ministry of Education - Division of Piriven Education / கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு

# පිරිවෙන් මධ්‍ය වාර පරීක්ෂණය -2024
## 4 ශ්‍රේණිය

| 07 | S | I,II |
|---|---|---|

## (07) ඉතිහාසය - I,II

පැය තුනයි.

අමතර කියවීම් කාලය - විනාඩි 10

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

### ඉතිහාසය - I පතය

**සැලකිය යුතුයි :**

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.
- එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

---

➢ **අංක 01 සිට 15 තෙක් එක් එක් ප්‍රශ්නයට ගැළපෙන පිළිතුර තෝරන්න.**

01. අනුරාධපුර රාජධානියේ සිටි අවසන් පාලකයා කවුරුන් ද?
 (1) පස්වන මිහිඳු රජු (2) ඉලනාග රජු
 (3) හතරවන මහින්ද රජු (4) පණ්ඩුකාභය රජු

02. අනුරාධපුර යුගයේ සිංහාසනය සඳහා නිරන්තර බල අරගල පැවති රාජවංශ දෙක කුමක් ද?
 (1) පාණ්ඩ්‍ය හා ලම්භකර්ණ (2) මෞර්ය හා ලම්භකර්ණ
 (3) කාලිංග හා නායක්කාර (4) මෞර්ය හා පාණ්ඩ්‍ය

03. පොලොන්නරුව අගනුවරක් ලෙස පැවති රාජ්‍ය වර්ෂය කුමක් ද?
 (1) (1055 – 1110) (2) (1017 – 1055) (3) (1017 – 1215) (4) (1055 – 1215)

04. චෝළයන් විසින් අනුග්‍රහය දක්වන ලද බෞද්ධ විහාරය කුමක් ද?
 (1) කිරිවෙහෙර (2) අවුකන විහාරය (3) මහාබෝධි විහාරය (4) වෙල්ගම් වෙහෙර

05. පළමුවන විජයබාහු රජු ආර්ථික සබඳතා ඇති කර ගත් විදේශීය රට කුමක් ද?
 (1) ජපානය (2) කොරියාව (3) බුරුමය (4) වියට්නාමය

06. පළමුවන පරාක්‍රමබාහු රජු තිස්තුන් වසරක රාජ්‍ය කාලය තුළ නිර්මාණය කළ ඇළවල් සංඛ්‍යාව කීය ද?
 (1) 3910 කි. (2) 3944 කි. (3) 3920 කි. (4) 3915 කි.

07. ලක්දිව වැඩි ම ශිලා ලේඛන ප්‍රමාණයක් පිහිට වූ පාලකයා කවුරුන් ද?
 (1) මහා පරාක්‍රමබාහු රජු (2) කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල රජු
 (3) මහා විජයබාහු රජු (4) භාතිකාභය රජු

08. **"කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත"** යන උපාධි නාමයෙන් හැඳින් වූ පාලකයා කවු ද?

(1) තුන්වන විජයබාහු රජු (2) පළමුවන පරාක්‍රමබාහු රජු

(3) දෙවන පරාක්‍රමබාහු රජු (4) පළමුවන බුවනෙකබාහු රජු

09. **"පන්සිය පනස් ජාතක පොත"** සිංහල භාෂාවෙන් ලිවීමට අනුග්‍රහය දැක් වූ රජතුමා කවු ද?

(1) දෙවන බුවනෙකබාහු රජු (2) තුන්වන පරක්‍රමබාහු රජු

(3) පළමුවන බුවනෙකබාහු රජු (4) සිවුවන පරක්‍රමබාහු රජු

10. ක්‍රි.ව.1505 ලංකාවට පෘතුගීසීන් පැමිණෙන විට සිටි කෝට්ටේ පාලකයා කවු ද?

(1) හත්වන බුවනෙකබාහු රජු (2) හයවන විජයබාහු රජු

(3) අටවන වීර පරාක්‍රමබාහු රජු (4) දෙවන පරාක්‍රමබාහු රජු

11. කෝට්ටේ රාජ්‍යය තෑගි ඔප්පුවක් මගින් පෘතුගීසීන්ට පවරා දුන් පාලකයා කවු ද?

(1) ධර්මපාල රජු (2) දෙවන රාජසිංහ රජු

(3) යමසිංහ බණ්ඩාර (4) පළමු විමලධර්මසූරිය රජු

12. **"කන්ද උඩරට ද්‍රෝහියා"** යන ආක්‍රෝශ නාමයෙන් පෘතුගීසීන් විසින් හඳුන්වන ලද පාලකයා කවු ද?

(1) පළමුවන රාජසිංහ රජු (2) කොනප්පු බණ්ඩාර

(3) දෙවන රාජසිංහ රජු (4) දෙවන විමලධර්මසූරිය රජු

13. යාපනයේ පරරාජසේකරම් මරා ක්‍රි.ව.1519 බලයට පත් වූයේ කවුරුන් ද?

(1) සංකිලි (2) එදිරිමාන්න සිංහම් (3) ආර්ය චක්‍රවර්ති (4) රාජ රාජ චෝළ

14. ලන්දේසීන් විසින් කළුතර අඟුරුවාතොට බලකොටුව අල්ලා ගත් වර්ෂය කුමක් ද?

(1) ක්‍රි.ව.1639 (2) ක්‍රි.ව.1652 (3) ක්‍රි.ව.1640 (4) ක්‍රි.ව.1656

15. කෝට්ටේ තැන්පත් කර තිබූ දළදා වහන්සේ හිරිපිටියේ නිළමේ විසින් සීතාවකට වැඩමවා තැන්පත් කර තිබූ විහාරය කුමක් ද?

(1) දෙල්ගමුව විහාරය (2) අත්තනගලු විහාරය

(3) කඳුරුගොඩ විහාරය (4) කැලණි විහාරය

➢ **අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් හතර බැගින් ලබා දී ඇත. ඒවා අතුරින් එක් නමක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග නො ගැළපේ. එම නො ගැළපෙන නාමය තෝරන්න.**

16. (1) කෝකිල සන්දේශය (2) සැළලිහිණි සන්දේශය

(3) හංස සන්දේශය (4) මයූර සන්දේශය

17. (1) තොටගමුවේ ශ්‍රී රාහුල හිමි (2) වැත්තෑවේ හිමි

(3) විල්ගම්මුල හිමි (4) ධර්මසේන හිමි

18. (1) දෝසි (2) අච්චාරු (3) බත් (4) සලාද

19. (1) වසභ රජු (2) මහා පරාක්‍රමබාහු රජු

(3) මහා විජයබාහු රජු (4) කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල රජු

20. (1) මඩකලපුව කොමාන්ඩරිය (2) ගාල්ල කොමාන්ඩරිය

(3) යාපනය කොමාන්ඩරිය (4) කොළඹ කොමාන්ඩරිය

➢ **අංක 21 සිට 25 තෙක් ප්‍රශ්නවල නාම / ප්‍රකාශන යුගල හතර බැගින් ලබා දී ඇත. ඒවා අතුරින් එක් නාම / ප්‍රකාශන යුගලයක පද එකිනෙකට නො ගැළපේ. එම නො ගැළපෙන නාම / ප්‍රකාශන යුගලය තෝරන්න.**

21. (1) සද්ධර්මරත්නාවලිය - ධර්මසේන හිමි (2) මහාවංසය - මහානාම හිමි
(3) බුදුගුණ අලංකාරය - වීදාගම හිමි (4) ලෝවැඩ සඟරාව - වැත්තැවෙ හිමි

22. (1) ධාතුසේන රජු - කලා වැව (2) මහසෙන් රජු - මින්නේරිය වැව
(3) පණ්ඩුකාභය රජු - ගාමිණී වැව (4) දෙවන අග්බෝ රජු - මාමිණිය වැව

23. (1) බලන සටන - ක්‍රි.ව.1602 (2) රන්දෙණිවල සටන - ක්‍රි.ව.1630
(3) මුල්ලේරියා සටන - ක්‍රි.ව.1568 (4) දන්තුරේ සටන - ක්‍රි.ව.1594

24. (1) අධ්‍යාපනය - අංක ගණිතය (2) ලෙඩ රෝග - පරංගි
(3) වාස්තු විද්‍යාව - කනප්පු (4) සංගීතය - කපිරිඤ්ඤා

25. (1) ඔපර් හුෆ්ඩ්මන් - ඉඩම් ආදායම් දෙපාර්තමේන්තුව
(2) සිවිල් රාද් - සිවිල් උසාවිය
(3) ලැන්ඩ්රාද් - ඉඩම් උසාවිය
(4) රාද්වැන් ජස්ටිට් - මහාධිකරණය

➢ **අංක 26 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති (A) , (B) , (C) හා (D) යන ප්‍රතිචාර හතරක් දී ඇත. ඒවා අතුරෙන් දෙකක් නිවැරදි ය. එම නිවැරදි ප්‍රතිචාර දෙක තෝරන්න.**

(A) සහ (B) පමණක් නිවැරදි නම් අංක 1 ද,
(B) සහ (C) පමණක් නිවැරදි නම් අංක 2 ද,
(C) සහ (D) පමණක් නිවැරදි නම් අංක 3 ද,
(A) සහ (D) පමණක් නිවැරදි නම් අංක 4 ද, සලකුණු කරන්න.

26. අනුරාධපුර රාජධානියේ බිඳ වැටීම සම්බන්ධ නිවැරදි ප්‍රකාශ දෙක වන්නේ,
A. වාරි කර්මාන්තය හා කෘෂිකර්මාන්තය බිඳ වැටීම යි.
B. කාලිංග මාඝගේ ආක්‍රමණ.
C. මහසෙන් හා ධාතුසේන වැනි පාලකයන්ගේ ක්‍රියා කලාපයන් ය.
D. අනුරාධපුර යුගයේ ඇතැම් පාලකයන් අනුගමනය කළ විදේශ ප්‍රතිපත්ති.

27. පළමුවන විජයබාහු රජු සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ දෙක වන්නේ,
A. මෙතුමාගේ රාජ්‍ය කාලය වසර නවයකි.
B. මොහුගේ පියා මොග්ගල්ලාන හෙවත් මුගලන් ය.
C. දියණිවරුන් පස් දෙනෙක් සහ වික්‍රමබාහු යනුවෙන් පුතෙක් ද වූහ.
D. උතුරු ප්‍රදේශයේ ලෝකේශ්වර නම් ප්‍රාදේශීය නායකයේ බලයට පත් විය.

28. කුරුණෑගල යුගය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ වන්නේ,
A. සේනාධිලංකාර සෙනෙවිරදුන් ලංකාතිලක විහාරය කරවා ඇත.
B. හතරවන බුවනෙකබාහු රජු පාලන මධ්‍යස්ථානය ලෙස තෝරා ගත්තේ ය.
C. මහනුවර අස්ගිරි සේනාසනය බිහි කිරීමට දායක වීම.
D. වීදාගම ශ්‍රී ඝණානන්ද පිරිවෙන් විහාරය කරවීම.

29. පෘතුගීසීන් හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වන්නේ,
   A. පෘතුගීසීන් ලංකාවට පැමිණෙන විට කෝට්ටේ පාලකයා තුන්වන වික්‍රමබාහු රජු ය.
   B. පෘතුගීසි පාලන ප්‍රදේශයේ ප්‍රධානියා වූයේ සීබල් ද මාර්ටි ය.
   C. ලොරෙන්සෝ ද අල්මේදා ඇතුළු පිරිස ලංකාවේ ගාලු වරායට සේන්දු වී ඇත.
   D. අධ්‍යාපනය සමග කතෝලික ආගම පැතිරවීම.

30. ක්‍රි.ව.1638 උඩරට ලන්දේසි ගිවිසුමට සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වන්නේ,
   A. ඇතුන් හැර උඩරට සෙසු වෙළෙඳ ද්‍රව්‍ය පිළිබඳ ඒකාධිකාරය ලන්දේසීන්ට ලැබීම.
   B. පෘතුගීසීන් මෙරටින් පළවා හැරීමට උඩරට රජුට සහය දීමට ලන්දේසීන් එකඟ වීම.
   C. ලන්දේසීන්ට වැය වන මුදල් වෙළෙඳ ද්‍රව්‍ය මගින් නො ගෙවීම.
   D. පෘතුගීසීන්ගෙන් අල්ලා ගන්නා ලද බලකොටුවල ලන්දේසි හමුදාව නතර නො කිරීමට එකඟ වීම.

➢ **අංක 31 සිට 36 තෙක් දක්වා ඇති නාම / ප්‍රකාශන සමූහයක් X හා Y තීරුවල දී ඇත. X තීරුවේ දී ඇති නාම / ප්‍රකාශන Y තීරුවේ නාම / ප්‍රකාශන සමග කිසියම් ආකාරයට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නොවේ. X තීරුවේ ඒවා Y තීරුව සමග ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.**

31.

| X | Y |
|---|---|
| 1. කුරුණෑගල | A. ගඟසිරිපුර |
| 2. ගම්පොළ | B. ජනනාථපුරම් |
| 3. යාපහුව | C. සුභපබ්බත |
| 4. පොලොන්නරුව | D. හස්ති ශෛලපුර |

(1) A B C D (2) D A C B (3) C A D B (4) D A B C

32.

| X | Y |
|---|---|
| 1. වැත්තෑවේ හිමි | A. සැළලිහිණි සන්දේශය |
| 2. තොටගමුවේ රාහුල හිමි | B. ගුත්තිල කාව්‍යය |
| 3. දෙවන පරාක්‍රමබාහු රජු | C. කව්සිළුමිණ |
| 4. වීදාගම මෛත්‍රී හිමි | D. බුදුගුණ අලංකාරය |

(1) A B C D (2) B C D A (3) B A C D (4) B A D C

33.

| X | Y |
|---|---|
| 1. කොනප්පු බණ්ඩාර | A. ඔස්ට්‍රියාවේ දොන් ජුවාන් |
| 2. යමසිංහ බණ්ඩාර | B. දොන් ජුවාන් පෙරිය බණ්ඩාර |
| 3. ධර්මපාල කුමරු | C. දෝන කැතිරිනා |
| 4. කුසුමාසන දේවිය | D. දොන් පිලිප් |

(1) A D B C (2) B C D A (3) B A C D (4) A D C B

34.

| X | Y |
|---|---|
| 1. ලන්දේසීන් | A. ප්‍රංශය |
| 2. ප්‍රංශයින් | B. ඕලන්දය |
| 3. ඉංග්‍රීසීන් | C. පෘතුගාලය |
| 4. පෘතුගීසීන් | D. බ්‍රිතාන්‍යය |

(1) A B C D (2) B C D A (3) B A C D (4) B A D C

35. X Y

| | X | | Y |
|---|---|---|---|
| 1. | ගල්පොත ලේඛනය | A. | පළමු විජයබා රජතුමා |
| 2. | දඹදෙණි කතිකාවත | B. | පළමු පරාක්‍රමබාහු රජතුමා |
| 3. | සංගමු විහාර ලිපිය | C. | දෙවන පරාක්‍රමබාහු රජතුමා |
| 4. | පනාකඩු තඹ සන්නස | D. | නිශ්ශංකමල්ල රජතුමා |

(1) A B C D (2) B A C D (3) D C A B (4) D C B A

➢ **අංක 36 සිට 40 දක්වා ඇති එක් එක් ප්‍රශ්නයෙහි ප්‍රකාශ දෙක බැගින් ඇතුළත් වේ. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1, 2, 3, 4 යන කවර ප්‍රකාශ යුගලය දැ යි තෝරා ඊට අදාළ අංකය සලකුණු කරන්න.**

| වරණ අංකය | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 1 | නිවැරදි ය. | නිවැරදි ය. |
| 2 | නිවැරදි ය. | වැරදි ය. |
| 3 | වැරදි ය. | වැරදි ය. |
| 4 | වැරදි ය. | නිවැරදි ය. |

| | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 36. | නිශ්ශංකමල්ල රජුගේ පියා ශ්‍රී ජයගෝප බවත් මව පාර්වතී බවත් මූලාශ්‍ර මගින් අනාවරණය වේ. | නිශ්ශංකමල්ල රජුට මුහුණ දීමට සිදු වූ අභියෝගයකි රෝහණයෙන් එල්ල වූ තර්ජන. |
| 37. | හයවන පරාක්‍රමබාහු රජතුමා දිවයින අවසන්වරට ඒක්සේසත් කළ සිංහල පාලකයා ය. | සිංහල පද්‍ය සාහිත්‍යයේ ස්වර්ණමය යුගය ගම්පොළ යුගය වේ. |
| 38. | විජයබා කොල්ලය ඇති වූ වර්ෂය ක්‍රි.ව.1522 දී ය. | විජයබා කොල්ලයෙන් පසු කෝට්ටේ රාජ්‍යය බෙදී ගිය කොටස් හතරකි. |
| 39. | දෙවන විමලධර්මසූරිය රජු ලන්දේසීන්ගේ සහය ඇතිව බුරුමයෙන් භික්ෂූන් වහන්සේලා වැඩමවා ලක්දිව උපසම්පදාව ඇති නො කිරීම. | පෘතුගීසීන් ආගමික මෙහෙවරක් ලෙස ක්‍රිස්තියානි දේශකයන් හා දේව ගැතිවරුන් පුහුණු කිරීම සඳහා සෙමනේරි ඇති කිරීම. |
| 40. | ක්‍රි.ව.1739 දී මුද්‍රණ ශිල්පය හඳුන්වාදීම නිසා බයිබලය සිංහලයට පරිවර්තනය විය. | ලංකාවේ පැවති කුල ක්‍රමය රාජකාරී ක්‍රමය ලන්දේසීන්ගේ ආර්ථික අරමුණු ඉටු කර ගැනීම සඳහා භාවිත කර ඇත. |

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය පිරිවෙන් අධ්‍යාපන අංශය -/Ministry of Education - Division of Piriven Education / கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு

| 07 | S | I I |
|---|---|---|

# පිරිවෙන් මධ්‍ය වාර පරීක්ෂණය - 2024
## 4 ශ්‍රේණිය

පැය දෙකයි.

## (07) ඉතිහාසය - II පත්‍රය

සැ.යු.

- ❖ **පළමුවන ප්‍රශ්නය අනිවාර්යය වේ.**
- ❖ **පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**
- ❖ **මෙම කොටසට ලකුණු 60 ක් හිමි වේ.**

01. I. ඔබට සපයා ඇති ලංකා ආකෘති සිතියමේ පහත සඳහන් ස්ථාන ලකුණු කර, නම් කරන්න.

1. පොලොන්නරුව 2. සෙංකඩගල 3. පරාක්‍රම සමුද්‍රය
4. දඹකොළ පටුන 5. මහියංගනය 6. මල්වතු ඔය

(නිවැරදි ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු $1 \times 6 = 06$)

II. (අ) A රූපයෙන් දැක්වෙන්නේ කුමක් ද?

(ආ) එය ඉදි කළ රජතුමා කවුරුන් ද?

(ඉ) මෙය පිහිටි ඓතිහාසික නගරය කුමක් ද?

(ලකුණු 03)



A රූපය

III. (අ) B රූපයෙන් දැක්වෙන්නේ කවුරුන් ද?

(ආ) එතුමා පුරෝගාමීව කටයුතු කළේ කුමක් සඳහා ද?

(ඉ) ඔහුගේ රට කුමක් ද?

(ලකුණු 03)



B රූපය

02. I. අනුරාධපුර යුගයේ ඉදි කළ මහ වැව් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

II. අනුරාධපුර යුගයේ වාරි මාර්ග ඉදි කිරීම සඳහා රාජ්‍ය අනුග්‍රහය ලබා දුන් පාලකයන් සිව් දෙනෙකු සඳහන් කරන්න. (ලකුණු 04)

III. මෙම රාජධානිය පරිහානියට හා බිඳ වැටීමට බලපෑ හේතු දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

03. I. අතීතයේ දී පොලොන්නරුව හැඳින්වීම සඳහා යොදා ගත් නම් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

II. මහා විජයබාහු රජු විසින් ප්‍රතිසංස්කරණය කරන ලද වැව් හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

III. පළමුවන විජයබාහු රජුගේ ආගමික කටයුතු දෙකක් නිදසුන් සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 06)

04. I. මහා පරාක්‍රමබාහු රජුගේ දෙමව්පියන් නම් කරන්න. (ලකුණු 02)

II. රාජ්‍යත්වය තහවුරු කර ගැනීම සඳහා නිශ්ශංකමල්ල රජුට මුහුණ දීමට සිදු වූ අභියෝග හතරක් දක්වන්න. (ලකුණු 04)

III. නිශ්ශංකමල්ල රජුගේ ආගමික සේවා දෙකක් නිදසුන් සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 06)

05. I. දඹදෙණි යුගයේ සිටි රජවරුන් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 02)

II. දඹදෙණි යුගයේ රචිත සාහිත්‍ය කෘති හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

III. සිව්වන පරාක්‍රමබාහු රජුගේ ආගමික කටයුතු දෙකක් නිදසුන් සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 06)

06. I. කෝට්ටේ යුගයේ රචනා කළ සන්දේශ කාව්‍ය දෙකක් නම් කරන්න. (ලකුණු 02)

II. හයවන පරාක්‍රමබාහු රජුගේ කාලයේ විසූ ප්‍රකට පඬිවරුන් හතර දෙනෙකු සඳහන් කරන්න. (ලකුණු 04)

III. හයවන පරාක්‍රමබාහු රජතුමා වැඩි දියුණු කළ පූජනීය ස්ථාන දෙකක් පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 06)

07. I. ආසියාවේ යුරෝපා බල ව්‍යාප්තියට බලපෑ හේතු දෙකක් නම් කරන්න. (ලකුණු 02)

II. ආසියාවේ දේශපාලන බලය පිහිට වූ යුරෝපීය රටවල් හතරක් දක්වන්න. (ලකුණු 04)

III. පෘතුග්‍රීසීන්ගේ උඩරට ආක්‍රමණ අසාර්ථක වීමට බලපෑ හේතු දෙකක් නිදසුන් සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 06)

08. පහත දැක්වෙන මාතෘකා **<u>දෙකක්</u>** ගැන කෙටි ඓතිහාසික සටහන් ලියන්න.

I. දන්තුරේ සටන
II. විජයබා කොල්ලය
III. යාපහුව රාජධානිය
IV. පොලොන්නරුව ගල් විහාරය

(ලකුණු $6 \times 2 = 12$)


www.pirivena.lk

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය පිරිවෙන් අධ්‍යාපන අංශය -/Ministry of Education · of Piriven Education / கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு

# පිරිවෙන් මධ්‍ය වාර පරීක්ෂණය - 2024

## 4 ශ්‍රේණිය

| 07 | S | I I |
|---|---|---|

පැය දෙකයි.

## (07) ඉතිහාසය - II පත්‍රය

සැලකිය යුතුයි :

❖ දෙවන ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න අංක 1 (i) ට පිළිතුරු සැපයීම සඳහා මෙම සිතියම භාවිත කරන්න. පිළිතුරු සැපයීමෙන් පසුව මෙය ඔබේ පිළිතුරු පත්‍රය සමග අමුණා බාර දෙන්න.



# ඉතිහාසය

## අවසාන වාර ප්‍රශ්න පත්‍ර - 4 ශ්‍රේණිය



www.pirivena.lk

# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය 2018

## Primary Piriven End Year Term Test - 2018

### 04 ශ්‍රේණිය/Grade 04

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**ඉතිහාසය I, II** කාලය : පැය තුන යි

**History I, II** **Time : Three Hours**

**ඉතිහාසය I**

සැලකිය යුතුයි :

i. සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ii. අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (i), (ii), (iii), (iv) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න. (මෙම කොටස සඳහා ලකුණු 40ක් හිමි වේ.)

iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරයෙහි අංකයට සැසඳෙන කවය තුළ X ලකුණ යොදන්න.

iv. එම පිළිතුරු පත්‍රයේ පිටුපස, දී ඇති අනෙක් උපදෙස් ද, සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

**අංක 01 සිට අංක 15 තෙක් සෑම ප්‍රශ්නයකට ම ගැළපෙන පිළිතුර තෝරා ඊට අදාළ අංකය පිළිතුරු පත්‍රයෙහි ලකුණු කරන්න.**

01. අනුරාධපුර රාජධානියේ ආරම්භක පාලකයා වූයේ,

i. මුටසීව රජතුමා ය.
ii. පණ්ඩුකාභය රජතුමා ය.
iii. දේවානම්පියතිස්ස රජතුමා ය.
iv. විජය රජතුමා ය.

02. චෝළයන් පොළොන්නරුව පාලන මධ්‍යස්ථානය ලෙස තෝරා ගැනීමට බලපෑ හේතුවක් වන්නේ,

i. රෝහණයත් අනුරාධපුරයත් අතර ගමන් මාර්ගයක පිහිටා තිබීම ය.
ii. පොළොන්නරුව මල්වතු ඔය ආශ්‍රිත ව පිහිටි නගරයක් වීම ය.
iii. මහාතිත්ථ වරායට ආසන්නයේ පිහිටා තිබීම ය.
iv. පොළොන්නරුවේ දෙමළ ජනයා වැඩි වශයෙන් පදිංචි වී සිටීම ය.

03. පළමුවන විජයබාහු රජතුමා කුඩා කල හැඳින් වූ නම කුමක් ද?

i. ටිකිරි කුමරු
ii. අම්බුළුගල කුමරු
iii. කිත්ති කුමරු
iv. අස්ථාන කුමරු

04. පළමුවන පරාක්‍රමබාහු රජු පොළොන්නරුව ආක්‍රමණය කරන විට එහි පාලකයා වූයේ,

i. පළමුවන ගජබාහු රජු ය.
ii. දෙවන ගජබාහු රජු ය.
iii. මානාභරණ රජු ය.
iv. පළමුවන අග්බෝ රජු ය.

05. නිශ්ශංකමල්ල රජුගේ රාජවංශය කුමක් ද?

i. මෞර්ය
ii. පාණ්ඩ්‍ය
iii. ලම්භකර්ණ
iv. කාලිංග

06. ''කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත'' යන උපාධි නාමයෙන් පිදුම් ලැබූ රජු කවුද?

i. පළමුවන පරාක්‍රමබාහු රජතුමා
ii. දෙවන පරාක්‍රමබාහු රජතුමා
iii. හත්වන බුවනෙකබාහු රජතුමා
iv. අටවන වීර පරාක්‍රමබාහු රජතුමා

07. කෝට්ටේ රාජධානිය පිළිබඳ ව තොරතුරු ලබා ගත හැකි කෘතිය කුමක් ද?

i. කව්සිළුමිණ
ii. දළදා සිරිත
iii. සද්ධර්මාලංකාරය
iv. සද්ධර්ම රත්නාකරය

08. පෘතුගීසීන් ලංකාවට ගොඩබසින විට කෝට්ටේ රාජධානියේ පාලකයා වූයේ,

i. සේනාසම්මත වික්‍රමබාහු රජු ය.
ii. හය වන ගජබාහු රජු ය.
iii. හත්වන බුවනෙකබාහු රජු ය.
iv. අටවන වීර පරාක්‍රමබාහු රජු ය.

09. දේශගවේෂණයේ යෙදුණු ප්‍රථම යුරෝපා රටවල් දෙක කුමක් ද?

i. පෘතුගාලය හා ස්පාඤ්ඤය
ii. ස්පාඤ්ඤය හා ප්‍රංශය
iii. පෘතුගාලය හා බ්‍රිතාන්‍යය
iv. බ්‍රිතාන්‍යය හා ප්‍රංශය

10. පෘතුගීසි බසට අවනත ව කතෝලික ආගම වැලඳ ගත් කෝට්ටේ පාලකයා කවුද?

i. මායාදුන්නේ රජු
ii. ධර්මපාල රජු
iii. බුවනෙකබාහු රජු
iv. විජයබාහු රජු

11. ධර්මපාල කුමාරයාගේ පියා ලෙස සැලකෙන්නේ කවුද?

i. යමසිංහ බණ්ඩාර
ii. කොනප්පු බණ්ඩාර
iii. කරලියද්දේ බණ්ඩාර
iv. වීදිය බණ්ඩාර

12. කෝට්ටේ දළදා මැදුරේ තැන්පත් කර තිබූ දළදා වහන්සේ වැඩමවා ආරක්ෂාව පතා සඟවා තැබුවේ,

i. බෙලිගල ය.
ii. දඹදෙණියේ ය.
iii. දෙල්ගමුවේ ය.
iv. කොත්මලයේ ය.

13. දේශගවේෂණ ව්‍යාපාරයේ පුරෝගාමියා ලෙස සැලකෙන පෘතුගාල ජාතිකයා කවුද?

i. නාවික හෙන්රි
ii. ෆ්‍රැන්සිස්කෝ ද අල්මේදා
iii. වස්කෝද ගාමා
iv. ක්‍රිස්ටෝපර් කොළොම්බස්

14. සිල්වා, ප්‍රනාන්දු, ෆොන්සේකා වැනි පුද්ගල නාම මෙරට සමාජයට එක් වූයේ,

i. පෘතුගීසීන්ගෙන් ය.
ii. ලන්දේසීන්ගෙන් ය.
iii. ඉංග්‍රීසීන්ගෙන් ය.
iv. ප්‍රංශයන්ගෙන් ය.

15. 1602 ජූලි මාසයේ දී ලංකාවට පැමිණි ලන්දේසි දූතයා කවුද?

i. වෙස්ටර් වෝල්ඩ්
ii. විලේම් ෆල්ක්
iii. දියෝගෝ ද මේලෝ
iv. ජෝරිස් වැන් ස්පිල්බර්ජන්

**අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් හතර බැගින් ලබා දී ඇත. ඒවා අතරින් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග නොගැළපේ. එම නොගැළපෙන නාමයට අදාළ අංකය තෝරා පිළිතුරු පත්‍රයෙහි ලකුණු කරන්න.**

16.

i. ඉස්තෝප්පුව

ii. ඉස්කුරුප්පුව

iii. සොල්දරය

iv. කනප්පුව

17.

i. දන්තුරේ

ii. බලන

iii. මාදිවෙල

iv. රන්දෙණිවෙල

18.

i. දිඹුලාගල මේධංකර හිමි

ii. වැත්තෑවේ හිමි

iii. වීදාගම මෛත්‍රිය හිමි

iv. තොටගමුවේ රාහුල හිමි

19.

i. මහාධිකරණය

ii. දිසා අධිකරණය

iii. ඉඩම් උසාවිය

iv. සිවිල් උසාවිය

20.

i. සොක්‍රටීස්

ii. ප්ලේටෝ

iii. සීසර්

iv. ඇරිස්ටෝටල්

**අංක 21 සිට 25 තෙක් ප්‍රශ්නවල පද යුගල හතර බැගින් ලබා දී ඇත. ඒවා අතුරෙන් එක් යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන පද යුගලය තෝරා ඊට අදාළ අංකය තෝරා පිළිතුරු පත්‍රයෙහි ලකුණු කරන්න.**

21.

i. ජුපිටර් - අහසට අධිපති දෙවියා

ii. වීනස් - ආලයට අධිපති දෙවියා

iii. මිනර්වා - අත්කම්වලට අධිපති දෙවියා

iv. නෙප්චූන් - සාරවත් අස්වැන්නට අධිපති දෙවියා

22.

i. අංග - බරණැස

ii. වජ්ජි - වේසාලි

iii. මල්ල - කුසිනාරා

iv. වත්ස - කොසඹෑ

23.

i. ගෘහ භාණ්ඩ - බංකු

ii. ලෙඩ රෝග - පරංගි

iii. අධ්‍යාපනය - ගීතිකා

iv. සංගීතය - යාඥා

24.

i. කුසුමාසන දේවිය - දෝන කතිරිනා

ii. යමසිංහ බණ්ඩාර - දොන් පිලිප්

iii. වීදිය බණ්ඩාර - දොන් කොස්තා

iv. කොනප්පු බණ්ඩාර - දොන් ජුවන්

www.pirivena.lk

25.

i. කෝට්ටේ - වික්‍රමබාහු

ii. යාපනය - පරරාජසේකරම්

iii. රයිගම - රයිගම් බණ්ඩාර

iv. සීතාවක - මායාදුන්නේ

**අංක 26 සිට 30 තෙක් ප්‍රශ්නවලට දක්වා ඇති A, B, C, D යන ප්‍රකාශ හතර අතුරෙන් දෙකක් නිවැරදිය ය. එම නිවැරදි ප්‍රකාශ දෙක සඳහන් පිළිතුර තෝරන්න.**

A සහ B **නිවැරදි නම් 01 ද**

B සහ C **නිවැරදි නම් 02 ද**

C සහ D **නිවැරදි නම් 03 ද**

A සහ D **නිවැරදි නම් 04 ද** **ලකුණු කරන්න.**

26. රෝම ශිෂ්ටාචාරයේ සාහිත්‍යය හා අධ්‍යාපනය, සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශ නිවැරදි වේ ද?

A රෝම සාහිත්‍ය කෘති ලිව්වේ ලතින් භාෂාවෙනි.

B වර්ජිල් නම් කවියා ලුක් රීටස් නම් කෘතිය රචනා කළේ ය.

C ජුවෙල්නා ඊඩිනා කාව්‍ය කෘති රචනා කළේ ය.

D සෙනේකා නාට්‍ය කෘති රචනා කළේ ය.

i. A සහ B

ii. B සහ C

iii. C සහ D

iv. A සහ D

27. ක්‍රි. පූ. 6 වන සියවසේ දී උතුරු ඉන්දියාවේ සමාජ තත්ත්වය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශ නිවැරදි වේ ද?

A ගෝත්‍ර සමාජ ක්‍රමය ක්‍රමයෙන් වර්ධනය වෙමින් පැවතීම.

B චතුර්වර්ණ අතරින් ක්ෂත්‍රිය වර්ණය ප්‍රමුඛත්වයට පැමිණීම.

C කාන්තාවට වඩාත් උසස් තත්ත්වයක් හා සමාජ පිළිගැනීමක් ඇති වීම.

D සමාජයේ සියලු ම පාර්ශ්වවලට ආගමික නිදහස හිමි නොවීම.

i. A සහ B

ii. B සහ C

iii. C සහ D

iv. A සහ D

28. දෙවන පරාක්‍රමබාහු රජුට ජය ගැනීමට සිදු වූ අභියෝග සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශ නිවැරදි වේ ද?

A රුහුණේ පාලකයා වූ මානාභරණ රජුගෙන් එල්ල වූ ආක්‍රමණය

B දෙවන ගජබා රජුගෙන් එල්ල වූ ආක්‍රමණය

C චන්ද්‍රභානු නම් ආක්‍රමණිකයාගෙන් එල්ල වූ ආක්‍රමණය

D මාඝ නම් ආක්‍රමණිකයාගේ ආක්‍රමණය

i. A සහ B

ii. B සහ C

iii. C සහ D

iv. A සහ D

29. 1638 ලන්දේසි ගිවිසුම සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ වන්නේ,

A ලන්දේසීන් විසින් අල්ලා ගන්නා ලද පෘතුගීසි බලකොටු ලන්දේසීන්ට ලබා දිය යුතු වීම.

B ලන්දේසීන්ට වැය වන මුදල් වෙළඳ ද්‍රව්‍ය මගින් ගෙවීමට රජු එකඟ වීම.

C ඇතුන් හැර උඩරට සෙසු වෙළඳ ද්‍රව්‍ය පිළිබඳ ඒකාධිකාරය ලන්දේසීන් සතු වීම.

D උඩරට රෙපරමාදු ආගම ප්‍රචාරයට ඉඩ ලබාදීම.

i. A සහ B ii. B සහ C

iii. C සහ D iv. A සහ D

30. කොරියානු බුදුදහමේ වර්තමාන තත්ත්වය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශ නිවැරදි වේ ද?,

A බෞද්ධ ජනගහනය 25%ක් පමණ වීම.

B භික්ෂුණී ශාසනයට වැදගත් තැනක් හිමිවීම.

C වෙහෙර විහාරවලට රාජ්‍ය අනුග්‍රහය ලැබීම.

D සෙන් භාවනා ක්‍රමය ව්‍යාප්ත වීම.

i. A සහ B ii. B සහ C

iii. C සහ D iv. A සහ D

**අංක 31 සිට 35 තෙක් ප්‍රශ්නයෙහි නාම ප්‍රකාශන සමූහයක් X හා Y තීරුවල දී ඇත. එම ප්‍රකාශන කිසියම් ආකාරය කට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නොවේ. ඒවා ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට නිවැරදි වරණය තෝරන්න.**

31.

| X | Y |
|---|---|
| 01. බුරුමය | A. මීරුක් විහාරය |
| 02. කාම්බෝජය | B. බෝරෝබුදූර් විහාරය |
| 03. ඉන්දුනීසියාව | C. ආනන්ද විහාරය |
| 04. කොරියාව | D. අන්කෝර්වට් විහාරය |

i. BADC ii. DBAC

iii. ABDC iv. CDBA

32.

| X | Y |
|---|---|
| 01. තුන්වන විජයබාහු | A. පැපිලියාන සුනේත්‍රාදේවී පිරිවෙණ |
| 02. හයවන පරාක්‍රමබාහු | B. දෙවුන්දර පටිමාඝරය |
| 03. හතරවන පරාක්‍රමබාහු | C. යාපහුව දළදා මාලිගය |
| 04. පළමුවන බුවනෙකබාහු | D. දඹදෙණිය විජේසුන්දරාරාමය |

i. BADC ii. DABC

iii. ABDC iv. CABD

www.pirivena.lk

33. X | Y

01. ගුත්තිල කාව්‍ය — A. රාහුල හිමි

02. කාව්‍යශේඛරය — B. වැත්තෑවේ හිමි

03. ලෝවැඩ සඟරාව — C. දෙවැනි පරාක්‍රමබාහු

04. කව්සිළුමිණ — D. වීදාගම මෛත්‍රිය හිමි

i. CBAD
ii. ADBC
iii. BADC
iv. CADB

34. X | Y

01. මොරටුව — A. උළු කර්මාන්තය

02. කැලණිය — B. රෙදි සායම් කිරීමේ කර්මාන්තය

03. යාපනය — C. රෙදි විවීමේ කර්මාන්තය

04. පුත්තලම — D. වඩු කර්මාන්තය

i. DABC
ii. ADCB
iii. ABCD
iv. CDAB

35. X | Y

01. පණ්ඩුකාභය — A. පොළොන්නරුව

02. පළමුවන විජයබාහු — B. දඹදෙණිය

03. තුන්වන විජයබාහු — C. අනුරාධපුරය

04. හයවන පරාක්‍රමබාහු — D. කෝට්ටේ

i. DABC
ii. ADCB
iii. ABCD
iv. CABD

**අංක 36 සිට 40 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයෙහි ප්‍රකාශ දෙක බැගින් ඇතුළත් වේ. ඒ ඒ ප්‍රශ්නයට අදාළ ව දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන කුමන ප්‍රකාශය දැයි තෝරා ගෙන අදාළ අංකය පිළිතුරු පත්‍රයෙහි ලකුණු කරන්න.**

| අංකය | පළමුවන ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| i. | නිවැරදි ය. | නිවැරදි ය. |
| ii. | නිවැරදි ය. | වැරදි ය. |
| iii. | වැරදි ය. | වැරදි ය. |
| iv. | වැරදි ය. | නිවැරදි ය. |

| අංක | පළමුවන ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
| --- | --- | --- |
| 36 | දිවයින අවසන් වරට එක්සේසත් කළ පාලකයා හයවෙනි පරාක්‍රමබාහු රජු ය. | විසුද්ධිමග්ග මහා සන්නය හයවෙනි පරාක්‍රමබාහු රජුගේ ප්‍රබන්ධයනි. |
| 37 | සිත කය දියුණු කිරීම ආගමික කටයුත්තක් ලෙස ග්‍රීකයෝ සිතූහ. | ග්‍රීක යුගයේ බහු දේව වාදය පැවතුණි. |
| 38 | සොක්‍රටීස්ගේ දක්ෂතම ගෝලයා වූයේ ඇරිස්ටෝටල් ය. | ඇරිස්ටෝටල් ඇකඩමීය නමින් අධ්‍යාපන ආයතනයක් පිහිටු විය. |
| 39 | ස්වේදගොන් චෛත්‍යය තායිලන්තයේ පිහිටා ඇත. | ප්‍රාචින් පුරි තායිලන්තයේ ඉපැරණි බෞද්ධ නගරයකි. |
| 40 | ජපානයට පිවිසි බුදුදහම ස්ථාවර වන්නට වූයේ සුසිකෝ අධිරාජිනියගේ කාලයෙහි ය. | සෙන් බුදුදහම මුලින් ම බිහි වූයේ ජපානයේ ය. |

# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2018

## Primary Piriven Year End Term Test - 2018

### 04 ශ්‍රේණිය/Grade 04

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**ඉතිහාසය I, II**
**History I, II**

**ඉතිහාසය II**

**සැලකිය යුතුයි :**

i. පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
ii. පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
iii. මෙම කොටසට ලකුණු 60ක් හිමි වේ.

---

01.

i. ඔබට සපයා ඇති ශ්‍රී ලංකා ආකෘති සිතියමේ පහත සඳහන් ස්ථාන ලකුණු කර නම් කරන්න.

(1). ගෝකණ්ණ තිත්ථ (2). අනුරාධපුරය (3). සීගිරිය (4). ගාල්ල

(5). පරාක්‍රම සමුද්‍රය (6). වලවේ ගඟ (ලකුණු 06)

ii. පහත දී ඇති රූපසටහන් ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



A රූපය

(අ). A වලින් දැක්වෙන කුමක් ද?

(ආ). එය කර වූ පාලකයා කවුරුන් ද?

(ඉ). මෙම නිර්මාණය දැකගත හැකි රාජධානිය නම් කරන්න.

(ලකුණු 03)



B රූපය

(අ). මෙහි දැක්වෙන්නේ කවුද?

(ආ). මොහුගේ රට කුමක් ද?

(ඉ). මොහුගෙන් ඉටු වූ සේවය කුමක් ද?

(ලකුණු 03)

02. " ශ්‍රී ලංකාවේ දෙවන රාජධානිය පොළොන්නරුව යි "

i. පොළොන්නරු රාජධානිය හැඳින් වූ වෙනත් නම් දෙකක් සඳහන් කරන්න.

ii. පොළොන්නරු රාජධානිය පාලනය කළ ශ්‍රේෂ්ඨ පාලකයින් දෙදෙනෙකු නම් කරන්න.

iii. පොළොන්නරු රාජධානියේ වර්ධනය සඳහා පළමුවන විජයබාහු රජුගෙන් ඉටු වූ සේවාව කරුණු දෙකක් මගින් පෙන්වා දෙන්න.

(ලකුණු 2 + 4 + 6 = 12)

03. "දේශගවේෂණයේ ප්‍රතිඵලයක් වූයේ ශ්‍රී ලංකාව යුරෝපීයන්ගේ යටත් විජිතයක් බවට පත්වීම යි''

i. ආසියාවේ යුරෝපා බල ව්‍යාප්තියට බලපෑ හේතු දෙකක් සඳහන් කරන්න.

ii. ශ්‍රී ලංකාවට පෘතුගීසීන් පැමිණි වර්ෂය හා ප්‍රථම පෘතුගීසි ජාතිකයා නම් කරන්න.

iii. පෘතුගීසි ආගමනය නිසා ඇති වු ආගමික බලපෑම කරුණු දෙකක් මගින් පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 4 + 6 = 12)

04. "ක්‍රිස්තු පූර්ව 6 වන සියවස පමණ වන විට ඉන්දියාවේ ප්‍රබල ජනපද දහසයක් බිහි විය"

i. සොළොස් මහා ජනපදවල ප්‍රධාන පාලන ක්‍රම දෙක නම් කරන්න.

ii. සප්ත අපරිහානීය ධර්ම දෙකක් සඳහන් කරන්න.

iii. ක්‍රිස්තු පූර්ව 6 වන සියවසේ දී ඉන්දියාවේ පැවැති ආර්ථික තත්ත්වය උදාහරණ දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 4 + 6 = 12)

05. ග්‍රීක රෝම ශිෂ්ටාචාරය ඇසුරින් පහත මාතෘකා විස්තර කරන්න.

i. ග්‍රීකයේ සමාජය හා ජන ජීවිතය

ii. රෝම ශිෂ්ටාචාරයේ ආගමික විශ්වාස (ලකුණු 6 + 6 = 12)

06.

i. ක්‍රිස්තු වර්ෂ පස්වන සියවස පමණ වන විට බුරුමයේ සිටි ප්‍රධාන ජන වර්ග දෙක නම් කරන්න.

ii. බුරුමයේ ථේරවාදී බුදුදහමේ පුනරුදය සඳහා කටයුතු කළ පාලකයන් දෙදෙනෙකු නම් කරන්න.

iii. බුරුමය හා ශ්‍රී ලංකාව අතර පැවති ආගමික සබඳතා උදාහරණ දෙකක් මගින් පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 4 + 6 = 12)

07.

i. තායිලන්තයේ පැවති පැරණි බෞද්ධ නගර දෙකක් නම් කරන්න.

ii. කොරියාවෙන් බෞද්ධ සංස්කෘතියට සිදු වූ සේවාවන් දෙකක් සඳහන් කරන්න.

iii. චීනයේ බුදුදහම පැතිරී යෑම කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න.

(ලකුණු 2 + 4 + 6 = 12)

08. පහත සඳහන් මාතෘකා දෙකක් පිළිබඳව ඓතිහාසික තොරතුරු කෙටියෙන් ලියන්න.

i. දෙවන පරාක්‍රමබාහු රජගේ ආගමික සේවය.

ii. කෝට්ටේ යුගයේ සාහිත්‍යය.

iii. අශෝක අධිරාජයාගේ ධර්ම විජය ප්‍රතිපත්තිය.

iv. ජපානයේ සෙන් බුදුදහම. (ලකුණු 6 + 6 = 12)

# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2019

## Primary Piriven Year End Tearm Test - 2019

### 04 ශ්‍රේණිය/Grade 04

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

ඉතිහාසය I, II
History I, II

කාලය : පැය තුන යි
Time : Three Hours

ඉතිහාසය I

සැලකිය යුතුයි :

i. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම කොටසට ලකුණු 40ක් හිමිවේ.
ii. අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (i), (ii), (iii), (iv) යන පිළිතුරුවලින් නිවරැදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.
iv. එම පිළිතුරු පත්‍රයේ පිටුපස, දී ඇති අනෙක් උපදෙස් ද, සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

- අංක 01 සිට 15 දක්වා එක් එක් ප්‍රශ්නයට ගැළපෙන පිළිතුර තෝරන්න. (ලකුණු 1 × 40 × 40)

01. අනුරාධපුර රාජධානියේ ආරම්භක පාලකයා සේ සැලකෙන්නේ,

i. දුටුගැමුණු රජතුමා ii. පණ්ඩුකාභය රජතුමා
iii. දේවානම් පියතිස්ස රජතුමා iv. වසභ රජතුමා

02. ඉන්දිය කුලී හමුදාවන්ගේ සහයෝගයෙන් මෙරට බලයට පත් ප්‍රථම පාලකයා වන්නේ,

i. ඉලනාග රජතුමා ii. අභයනාග රජතුමා
iii. මුගලන් රජතුමා iv. කාශ්‍යප රජතුමා

03. චෝළයන් විසින් පොළොන්නරුව අල්ලා ගැනීමෙන් පසු එය හැඳින්වූයේ,

i. රජරට ii. ගඟසිරිපුර
iii. ජනනාථපුරම් iv. වල්ලිපුරම්

04. පළමුවන විජයබා රජු කුඩා කල හැඳින් වූයේ,

i. කිත්ති කුමරු නමින් ය ii. සපුමල් කුමරු නමින් ය
iii. අස්ථාන කුමරු නමින් ය iv. අම්බුළුගල කුමරු නමින් ය

05. මහා පරාක්‍රමබාහු රජු දක්ඛිණ දේශයේ පාලකයා ව සිටියදී එහි අගනුවර වූයේ,

i. කුරුණෑගල ii. පඩුවස් නුවර
iii. ගම්පොළ iv. දඹදෙණිය

06. කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත යන ගෞරව උපාධි නාමයෙන් හැඳින් වූයේ,

i. පළමුවන පරාක්‍රමබාහු රජු ය ii. දෙවන පරාක්‍රමබාහු රජු ය
iii. තුන්වන පරාක්‍රමබාහු රජු ය iv. සිව්වන පරාක්‍රමබාහු රජු ය

07. පළමුවන භුවනෙකබාහු රජුගේ ආගමික සේවාවක් වන්නේ,

i. යාපහුවේ විසිතුරු මන්දිරයක් ඉදිකොට දළදා වහන්සේ එහි තැම්පත් කිරීම ය.

ii. නටබුන්ව පැවති තොටගමු වෙහෙර පිළිසකර කිරීම ය.

iii. කැරගල පද්මාවතී, දෙව්නුවර ඉරුගල් කුලතිලක පිරිවෙන් කරවීම ය.

iv. කුරුණෑගල විචිත්‍ර දළදා මාලිගයක් කරවා දළදා වහන්සේ එහි තැම්පත් කිරීම

08. අටවන වීර පරාක්‍රමබාහු රාජ්‍ය සමයේ ශ්‍රී ලංකාවට පැමිණි යුරෝපා ජාතිය වන්නේ,

i. පෘතුගීසීන් ය. ii. ලන්දේසින් ය.

iii. ඉංග්‍රීසීන් ය. iv. ප්‍රංශ ජාතිකයන් ය.

09. ආරක්ෂාව පතා දෙල්ගමු විහාරයේ කුරහන් ගලක දළදා වහන්සේ සඟවා තැබුවේ කවුරුන් විසින්ද?

i. ධර්මපාල කුමරු විසින් ii. මායාදුන්නේ රජු විසින්

iii. හිරිපිටියේ නිළමේ විසින් iv. පතිරාජ සෙනෙවි විසින්

10. පෘතුගීසී බලය කොළඹ කොටුවට පමණක් සීමාකිරීමට සමත් වූ පාලකයා,

i. පළමුවන භුවනෙකබාහු රජතුමා ය. ii. පළමුවන රාජසිංහ රජතුමා ය.

iii. දෙවන රාජසිංහ රජතුමා ය. iv. පළමුවන විමලධර්ම සූරිය රජතුමා ය.

11. ඔලිම්පස් කන්ද පිහිටා ඇත්තේ,

i. රෝමයේ ය. ii. සියමයේ ය.

iii. ඊජිප්තුවේ ය. iv. ග්‍රීසියේ ය.

12. මෙරටට රෝම ලන්දේසි නීති ක්‍රමය මගින් හඳුන්වා දෙනු ලැබූ උසාවි පද්ධතියට අයත් නොවූයේ,

i. මහාධිකරණය යි. ii. ඉඩම් උසාවිය යි.

iii. සිවිල් උසාවිය යි. iv. කම්කරු උසාවිය යි.

13. රෝම ශිෂ්ටාචාරය ආරම්භ වූයේ,

i. ටයිබර් නදිය අසල ය. ii. අයෝනික් මුහුද අසල ය.

iii. ඇමසන් නදිය අසල ය. iv. ගංගා නම්නදිය අසල ය.

14. කාවේරි ගඟ පිහිටා ඇත්තේ,

i. තායිලන්තයේ ය. i. බුරුමයේ ය.

iii. ඉන්දියාවේ ය. iv. ඉන්දුනීසියාවේ ය.



www.pirivena.lk

15. බුරුමයේ සුප්‍රකට ස්වේද ගොන් චෛත්‍ය ඉදිකරවන ලද්දේ,

i. අනුරුද්ධ රජු ය. ii. ධම්ම චේතිය රජු ය.

iii. ධර්මාශෝක රජු ය. iv. ධනනන්ද රජු ය.

- අංක16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් හතර බැගින් ලබා දී ඇත. ඒවා අතරින් එක් නමක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග නොගැළපේ. එම නොගැළපෙන නාමය තෝරන්න.

16. i. අනුරාධපුරය ii. පොළොන්නරුව iii. දඹදෙනිය iv. රයිගම

17. i. යාපනය ii. කෝට්ටේ iii. කොළඹ iv. කන්ද උඩරට

18. i. අංක ගණිතය ii. ගීතිකා iii. ලතින් බස iv. බයිලා

19. i. පෘතුගාලය ii. ඕලංදය iii. බ්‍රිතාන්‍ය iv. ස්පාඤ්ඤ

20. i. මහාධිකරණය ii. දිසා අධිකරණය iii. ඉඩම් උසාවිය iv. සිවිල් උසාවිය

- අංක 21 සිට 25 තෙක් ප්‍රශ්නවල නාම / ප්‍රකාශන යුගල හතර බැගින් දී ඇත. ඒවා අතුරින් එක් නාම / ප්‍රකාශන යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන නාම / ප්‍රකාශන යුගලය තෝරන්න.

21. i. කෝට්ටේ හයවන බුවනෙකබාහු ii. මහනුවර හයවන විජයබාහු

iii. රයිගම රයිගම් බංඩාර iv. සීතාවක මායාදුන්නේ

22. i. මුල්ලේරියා සටන දියෝගෝද මෙලෝ ii. දන්තුරේ සටන පේරෝලෝපේස් ද සූසා

iii. බලන සටන දොන් ජෙරනිමෝ ද අසවේදු iv. රන්දෙණි වෙළ සටන කොන්ස්තන්තිනු ද සා

23. i. බුරුමය ස්වේදගොන් චෛත්‍යය ii. තායිලන්තය බෝරෝබුදූර් විහාරය

iii. කාම්බෝජය අන්කෝර්වට් විහාරය iv. කොරියාව මිරුක්විහාරය

24. i. චන්ද්‍රගුප්ත රජු නන්ද රාජවංශය පරාජය කිරීම ii. බිංදුසාර රජු අමිත්‍රඝාත ලෙස හැඳින්වීම

iii. බිම්බිසාර රජු ඩෙකෑනය යටත්කර ගැනීම iv. අශෝකරජු කාලිංගය අල්ලා ගැනීම

25. i. ශාක්‍යයන් කපිලවස්තු ii. මල්ලයන් රාමගාම

iii. ලිච්ඡවීන් වෛසාලි iv. විදේහයන් මිථිලා

- අංක 26 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති (A), (B), (C) හා (D) යන ප්‍රතිචාර හතරක් දී ඇත. ඒවා අතුරෙන් දෙකක් නිවැරැදිය. එම නිවැරැදි ප්‍රතිචාර දෙක තෝරා,

(A) සහ (B) පමණක් නිවැරැදි නම් අංක 1 ද,

(B) සහ (C) පමණක් නිවැරැදි නම් අංක 2 ද,

(C) සහ (D) පමණක් නිවැරැදි නම් අංක 3 ද,

(A) සහ (D) පමණක් නිවැරැදි නම් අංක 4 ද, සලකුණු කරන්න.


www.pirivena.lk

26. යාපනය රාජධානිය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ දෙක වන්නේ

A : පෘතුගීසීන් පැමිණෙන විට යාපනය පරරාජසේකරම් විසින් පාලනයකිරීම

B : යාපනය රාජ්‍ය තුළ කතෝලික ආගම පැතිරවීම පෘතුගීසීන්ගේ අරමුණ වීම

C : යාපනය රාජ්‍යයේ ආරම්භක පාලකයා සපුමල් කුමරුය.

D : ස්වාභාවික ආරක්ෂාව නිසා යාපනය පෘතුග්‍රීසීන් සතු නොවිය

i. A සහ B | ii. B සහ C | iii. C සහ D | iv. A සහ D

27. ධාතුසේන රාජ්‍ය සමය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශ නිවැරදි වේ ද?

A : විමලධර්ම සූරිය රජුගේ ඉල්ලීම මත ජෝර්ජ් වැන් ස්පිල්බර්ජන් මෙරටට පැමිණීම

B : දෙවන රාජසිංහ රජු හා ලන්දෙසීන් අතර 1638 දී ගිවිසුමක් අත්සන් කිරීම

C : දෙමළ හා සිංහල භාෂාවෙන් ආගම ප්‍රචාරය කිරීම

D : බොහෝ 'ප්‍රදේශවල කතෝලික දේවස්ථාන ඇති වීම

i. A සහ B | ii. B සහ C | iii. C සහ D | iv. A සහ D

28. ග්‍රීක ශිෂ්ටාචාරය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ වන්නේ,

A : බටහිරින් අයෝනික් මුහුදවත් නැගෙනහිරින් ඊජියන් මුහුදටත් මැදිව පිහිටා තිබේ

B : ග්‍රීසියේ උස් කඳුවැටි අතර ඔලිසපස් කන්ද කැපීපෙනේ

C : මගස්ට් සීසර් ග්‍රීසියේ සිටි ප්‍රබල අධිරාජ්‍යයෙකි

D : පොම්පෙ නගරය ග්‍රීසියේ පිහිටා ඇති ඓතිහාසික නගරයකි

i. A සහ B | ii. B සහ C | iii. C සහ D | iv. A සහ D

29. ක්‍රි.පූ හයවන සියවසේ උතුරු ඉන්දියාව සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ වන්නේ

A : ක්‍රි.පූ හයවන සියවසේ ඉන්දීය ඉතිහාසය හැදෑරීමේදී උපයෝගී කරගත හැකි ප්‍රධාන මූලාශ්‍රය වන්නේ බ්‍රාහ්මීය ග්‍රන්ථයි.

B : ඉන්දියාවට සංක්‍රමණය වූ ආර්යන් මුලින්ම පදිංචි වූයේ රජගහ නුවරය.

C : සොළොස්මහා ජනපද අතරින් වින්ධ්‍යා කඳුවැටියෙන් දකුණු ප්‍රදේශයේ අස්මක ජනපදය පිහිටියේ ය.

D : සොළොස් මහාජනපදවල ප්‍රධාන පාලන ක්‍රම දෙකක් පැවතුනි.

i. A සහ B | ii. B සහ C | iii. C සහ D | iv. A සහ D

30. අශෝක අධිරාජ්‍යයාගේ ධර්ම විජය ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ වන්නේ

A : නිග්‍රොධ සාමණේරයන්ගෙන් බණ අසා බුදුදහම වැලඳ ගැනීම

B : ධර්මය ප්‍රචාරය කිරීමට ධර්ම මහා මාත්‍යවරු පත් කිරීම

C : දෙවන ධර්ම සංගායනාව පැවැත්වීම සඳහා අනුග්‍රහය දැක්වීම

D : චීනයට බුදුදහම හඳුන්වා දීම

i. A සහ B　　ii. B සහ C　　iii. C සහ D　　iv. A සහ D

- අංක31 සිට 35 තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන සමූහයක් x සහ y තීරුවල දී ඇත. x තීරුවේ දී ඇති නාම / ප්‍රකාශන සමග කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නොවේ. y තීරුව, x තීරුව සමග ගැළපෙන අනුපිළිවෙලට සකස් කළ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

31.

| x | | y |
|---|---|---|
| 01. අංග | - | A රජගහ නුවර |
| 02. මගධ | - | B බරණැස |
| 03. කාසි | - | C චම්පා |
| 04. කෝසල | - | D කුසාවතී |

i. BADC　　ii. DBAC　　iii. CDBA　　iv. CABD

32.

| x | | y |
|---|---|---|
| 01. බුරුමය | - | A මිරුක් විහාරය |
| 02. කොරියාව | - | B බෝරෝ බුදූර් විහාරය |
| 03. ජාවා | - | C අන්කෝර්වට් විහාරය |
| 04. කාම්බෝජය | - | D ආනන්ද විහාරය |

i. BDCA　　ii. DABC　　iii. CBDC　　iv. DCBA

33.

| x | | y |
|---|---|---|
| 01. පණ්ඩුකාභය | - | A යාපහුව |
| 02. පළමුවන විජයබාහු | - | B අනුරාධපුරය |
| 03. පළමුවන භුවනෙකබාහු | - | C පොළොන්නරුව |
| 04. හයවන පරාක්‍රමබාහු | - | D කෝට්ටේ |

i. CADB　　ii. ADBC　　iii. BCAD　　iv. CDAB

www.pirivena.lk

30. අශෝක අධිරාජ්‍යයාගේ ධර්ම විජය ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ වන්නේ

A : නිග්‍රොධ සාමණේරයන්ගෙන් බණ අසා බුදුදහම වැලඳ ගැනීම

B : ධර්මය ප්‍රචාරය කිරීමට ධර්ම මහා මාත්‍යවරු පත් කිරීම

C : දෙවන ධර්ම සංගායනාව පැවැත්වීම සඳහා අනුග්‍රහය දැක්වීම

D : චීනයට බුදුදහම හඳුන්වා දීම

i. A සහ B    ii. B සහ C    iii. C සහ D    iv. A සහ D

- අංක31 සිට 35 තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන සමූහයක් x සහ y තීරුවල දී ඇත. x තීරුවේ දී ඇති නාම / ප්‍රකාශන සමග කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නොවේ. y තීරුව, x තීරුව සමග ගැළපෙන අනුපිළිවෙලට සකස් කළ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

31.

| x | | y |
|---|---|---|
| 01. අංග | - | A රජගහ නුවර |
| 02. මගධ | - | B බරණැස |
| 03. කාසි | - | C චම්පා |
| 04. කෝසල | - | D කුසාවතී |

i. BADC    ii. DBAC    iii. CDBA    iv. CABD

32.

| x | | y |
|---|---|---|
| 01. බුරුමය | - | A මිරුක් විහාරය |
| 02. කොරියාව | - | B බෝරෝ බුදූර් විහාරය |
| 03. ජාවා | - | C අන්කෝර්වට් විහාරය |
| 04. කාම්බෝජය | - | D ආනන්ද විහාරය |

i. BDCA    ii. DABC    iii. CBDC    iv. DCBA

33.

| x | | y |
|---|---|---|
| 01. පණ්ඩුකාභය | - | A යාපහුව |
| 02. පළමුවන විජයබාහු | - | B අනුරාධපුරය |
| 03. පළමුවන භුවනෙකබාහු | - | C පොළොන්නරුව |
| 04. හයවන පරාක්‍රමබාහු | - | D කෝට්ටේ |

i. CADB    ii. ADBC    iii. BCAD    iv. CDAB


www.pirivena.lk

| | |
|---|---|
| | **මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2019** |
| | Primary Piriven Year End Term Test - 2019 |
| | **04 ශ්‍රේණිය/Grade 04** |
| සියලු ම හිමිකම් ඇවිරිණි<br>All Rights Reserved | ඉතිහාසය I, II<br>History I, II |

ඉතිහාසය II

සැලකිය යුතුයි :

i. පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ද තෝරාගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

01.

i ඔබට සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි පහත සඳහන් සියලු ම ස්ථාන ලකුණු කර නම් කරන්න.

1. මල්වතු ඔය    2. ගෝකණ්ණතිත්ත    3.කෝට්ටේ

4. පාහියංගල    5. සෙන්කඩගල    6. මීගමුව

(ලකුණු 1 × 6 = 6)

ii. පහත දී ඇති රූප සටහන් ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(අ) A වලින් දැක්වෙන්නේ කව්රුන් ද?

(ආ) මෙම හමුවීම සිදු වූ වර්ෂය කුමක්ද?

(ඉ) මෙම හමුවීමේ අරමුණ කුමක්ද?



(ලකුණු 1 × 3 = 3)

iii. (අ) B රූපයෙන් දැක්වෙන රූපය කුමක්ද?

(ආ) මෙතුමා අධිපතීත්වය දැක්වූයේ කුමකටද?

(ඉ) මෙය අයත්වන ශිෂ්ටාචාරය කුමක ද?



(ලකුණු 1 × 3 = 3)

02 "පොළොන්නරුව ශ්‍රී ලංකාවේ දෙවන පාලන මධ්‍යස්ථානය විය."

i පොළොන්නරුව රාජධානිය අතීතයේ හඳුන්වා ඇති නම් දෙකක් සඳහන් කරන්න.



www.pirivena.lk

ii පොළොන්නරුව රාජධානිය පාලනය කළ ශ්‍රේෂ්ඨ පාලකයින් දෙදෙනෙකු නම් කරන්න.

iii පොළොන්නරු රාජධානියේ පිරිහීමට හා පරිහානියට බලපෑ හේතු කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 4 + 6 - 12)

03 "මෙරට නිරිතදිග ප්‍රදේශයේ බිහි වූ ප්‍රථම රාජධානිය දඹදෙණිය යි."

i දඹදෙණියේ දක්නට ඇති ආගමික ගොඩනැගිලි දෙකක් නම් කරන්න.

ii දෙවන පරාක්‍රමබාහු රජු පිළිබඳ තොරතුරු ලබාගත හැකි මූලාශ්‍රය දෙකක් නම් කරන්න.

iii දෙවන පරාක්‍රමබාහු රජු දඹදෙනියේ සිටි ශ්‍රේෂ්ඨ පාලකයා බව කරුණු දෙකක් යටතේ උදාහරණ මගින් පෙන්වා දෙන්න.

(ලකුණු 2 + 4 + 6 - 12)

04 " ශ්‍රී ලංකාවට පැමිණි ප්‍රථම යුරෝපා ජාතිය වන්නේ පෘතුගීසීන් ය."

i යුරෝපා ජාතීන් පෙරදිගට පැමිණීමට බලපෑ සාධක දෙකක් දක්වන්න.

ii පෘතුගීසීන් පැමිණෙන විට මෙරට පැවති ප්‍රධාන පාලන ඒකක දෙකක් නම් කරන්න.

iii කෝට්ටේ රාජ්‍ය හා පෘතුගීසීන් අතර සබඳතා කරුණු දෙකක් මගින් පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 4 + 6 - 12)

05 "ග්‍රීක හා රෝම ශිෂ්ටාචාර ඇසුරින් පහත මාතෘකා විස්තර කරන්න."

i ග්‍රීකයන්ගේ ආගමික ඇදහිලි හා විශ්වාස.

ii රෝම ශිෂ්ටාචාරයේ පැවති පාලන ක්‍රමය.

(ලකුණු 2 × 6 - 12)

06

i සොළොස් මහා ජනපද අතර පැවති සමූහාණ්ඩු දෙකක් නම් කරන්න.

ii මෙ කල පැවති සප්ත අපරිහාණීය ධර්ම දෙකක් සඳහන් කරන්න.

iii මෞර්ය යුගයේ පැවති වාස්තු විද්‍යාව හා කලා නිර්මාණ පිළිබඳව කරුණු දෙකක් මගින් පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 4 + 6 - 12)

07

i ක්‍රි.ව පස්වන සියවස වනවිට බුරුමයේ ජිවත් වූ ප්‍රධාන ජනවර්ග දෙක නම් කරන්න.

ii තායිලන්තයේ පැරණි බෞද්ධ නගර දෙකක් නම් කරන්න.

iii සියමය හා ලංකාව අතර පැවති බෞද්ධ සබදතා කරුණු දෙකක් මගින් පෙන්වා දෙන්න

(ලකුණු 2 + 4 + 6 - 12)

08 පහත සදහන් මාතෘකා අතුරින් දෙකක් පිළිබද ඓතිහාසික තොරතුරු දක්වන්න.

i පළමුවන විජයබාහු රජතුමා

ii 1638 උඩරට ලන්දේසි ගිවිසුම

iii මෞර්ය අධිරාජ්‍යයේ බිද වැටීම

iv සෙන් බුදු දහම

(ලකුණු 2 × 6 - 12)

| | |
|---|---|
| සියලු ම හිමිකම් ඇවිරිණි<br>All Rights Reserved | **මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය 2020**<br>**Primary Piriven Year End Test - 2020**<br>**04 ශ්‍රේණිය/Grade 04**<br>ඉතිහාසය I, II — කාලය : පැය තුන යි<br>History I, II — Time : Three Hours |

**ඉතිහාසය I**

සැලකිය යුතු යි :

i. සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම කොටසට ලකුණු 40ක් හිමි වේ.

ii. අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට අදාළ කවය තුළ (X) ලකුණ යොදන්න.

iv. එම පිළිතුරු පත්‍රයේ පිටුපස, දී ඇති අනෙක් උපදෙස් ද, සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

01. ලම්භකර්ණ රාජවංශයේ ආරම්භක පාලකයා සේ සැලකෙන්නේ,

1. දේවානම්පියතිස්ස රජතුමා යි.
2. වසභ රජතුමා යි.
3. මහසෙන් රජතුමා යි.
4. විජය රජතුමා යි.

02. අනුරාධපුර යුගයේ වැදගත් අවසන් පාලකයා වන්නේ”

1. හතරවන මහින්ද රජතුමා යි.
2. පළමුවන සේන රජතුමා යි.
3. පළමුවන අග්බෝ රජතුමා යි.
4. පස්වන මහින්ද රජතුමා යි.

03. ඕනෑ ම රාජ්‍යයක ශක්තිමත් බව රඳා පවතින්නේ,

1. සංස්කෘතිය මත ය.
2. දේශපාලනය මත ය.
3. සමාජය මත ය.
4. ආර්ථිකය මත ය.

04. ලංකාවේ ගම්බිම් කිහිපයක් දකුණු ඉන්දියාවේ පිහිටි දේවාලයකට ගම්වර ලෙස ප්‍රදානය කළේ,

1. පළමුවන රාජ රාජ යි.
2. මහා රාජ රාජ යි.
3. රාජේන්ද්‍ර චෝළ යි.
4. චන්ද්‍රගුප්ත යි.

05. අතීතයේ පුලතිසිපුර ලෙස හැඳින්වූ නගරය මින් කුමක් ද?

1. අනුරාධපුරය
2. පඬුවස්නුවර
3. පොලොන්නරුව
4. දඹදෙණිය

06. බුරුමයේ අනුරුද්ධ රජු සමග ආර්ථික සබඳතා පැවැත්වූ රජ තුමාගේ නම කුමක් ද?

1. පළමුවන විජයබා රජතුමා
2. නිශ්ශංකමල්ල රජතුමා
3. තුන්වන පරාක්‍රමබාහු රජතුමා
4. ධාතුසේන රජතුමා

07. පොලොන්නරු රාජධානියේ තෙවරක් බලයට පත් වූයේ,

1. කල්‍යාණවතී රැජින ය.
2. ලීලාවතී රැජින ය.
3. අනුලා බිසව රැජින ය.
4. චූල සීවලි රැජින ය.

08. 1215 දී මෙරටට එල්ල වූ දකුණු ඉන්දියානු ආක්‍රමණය දැක්වෙන නිවැරදි පිළිතුර තෝරන්න.

1. සේන හා ගුත්තික ආක්‍රමණය.
2. එළාරගේ ආක්‍රමණය.
3. කාළිංග මාඝගේ ආක්‍රමණය.
4. ෂඩ් ද්‍රවිඩ ආක්‍රමණය.

09. දෙවන රාජසිංහ රජතුමා 1638 දී ගිවිසුමක් ඇති කර ගනු ලැබූ යුරෝපා ජාතිය දැක්වෙන පිළිතුර කුමක් ද?

1. පෘතුගීසීන්
2. ලන්දේසීන්
3. ඉංග්‍රීසීන්
4. ප්‍රංශයන්

10. පෘතුගීසීන්ගේ උඩරට ආක්‍රමණය අසාර්ථක වීමට බලපෑ ප්‍රධාන හේතුවක් වූයේ,

1. පෘතුගීසීන්ට ප්‍රමාණවත් තරම් අවි ආයුධ නොමැති වීම.
2. උඩරට රජුට ඉංග්‍රීසීන්ගෙන් ලැබුණු සහය.
3. පෘතුගිසීන් සතුව දක්ෂ හමුදාවක් නොසිටීම.
4. උඩරට රාජධානියේ භූගෝලීය පිහිටීම.

11. ලන්දේසීන් පෙරදිගට පැමිණීමට බලපෑ ප්‍රධාන හේතුවක් වූයේ,

1. පෘතුගීසීන් පෙරදිග කුළුබඩු වෙළෙඳාමෙන් අධික ලාභයක් ලබා ගැනීම.
2. යුරෝපයේ ජනගහනය වැඩිවීම නිසා ජනාවාස පිහිටුවීම.
3. කතෝලික ආගම ප්‍රචාරයට ලන්දේසීන්ට තිබූ අවශ්‍යතාව.
4. ඉංග්‍රීසින් සතු ව තිබූ පෙරදිග වෙළෙඳ බලය බිඳ දැමීමට අවශ්‍ය වීම.

12. මිනෝවාන් මාළිගය පිහිටා ඇත්තේ,

1. රෝමයේ ය.
2. ග්‍රීසියේ ය.
3. චීනයේ ය .
4. බුරුමයේ ය.

13. ඔගස්ටස් සීසර් ප්‍රසිද්ධ වී ඇත්තේ,

1. අධිරාජයෙකු ලෙස ය.
2. හමුදා නායකයෙකු ලෙස ය.
3. පූජකවරයෙකු ලෙස ය.
4. ආණ්ඩුකාරවරයෙකු ලෙස ය.

14. ඉන්දියාවේ පැවති සමූහාණ්ඩු පාලනයට නිදසුනක් වන්නේ,

1. බරණැස යි.
2. කුසිනාරාව යි.
3. රජගහ නුවර යි.
4. පාටලීපුත්‍ර යි.

www.pirivena.lk

15. සෙන් බුදු දහම මුලින්ම බිහි වූයේ,

1. ජපානයේ ය.
2. කාම්බෝජයේ ය.
3. චීනයේ ය
4. ඉන්දියාවේ ය.

- අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් හතර බැගින් ලබා දී ඇත. ඒවා අතරින් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග නොගැළපේ. එම නොගැළපෙන පිළිතුර තෝරන්න.

16. 1. පළමුවන විජයබාහු
2. පළමුවන පරාක්‍රමබාහු
3. හතරවන මිහිඳු
4. නිශ්ශංකමල්ල

17. 1. චන්ද්‍රගුප්ත
2. බිංදුසාර
3. අශෝක
4. ධන නන්ද

18. 1. පාවා
2. මගධ
3. අංග
4. කාසි

19. 1. සිංදු නදී
2. වනවාහිනී නදී
3. ක්‍රිෂ්ණ නදී
4. ගෝධාවරී නදී

20. 1. දිසාවනි
2. කෝරළ
3. පත්තු
4. බලකොටු

- අංක 21 සිට 25 තෙක් ප්‍රශ්නවල පද යුගල හතර බැගින් ලබා දී ඇත. ඒවා අතරින් එක් යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන යුගලය අඩංගු පිළිතුර තෝරන්න.

21. 1. ජුපීටර් - අහසට අධිපති දෙවියන්
2. මිනාර්වා - ඉතා වැදගත් දෙවඟන
3. වීනස් - ආලයට අධිපති දෙවඟන
4. නෙප්චූන් - මුහුදට අධිපති දෙවියන්

22. 1. ගෘහ භාණ්ඩ - අල්මාරිය
2. ඇඳුම් පැළඳුම් - කලිසම්
3. ලෙඩ රෝග - පරංගි
4. අධ්‍යාපනය - ගීතිකා

23. 1. අමාවතුර - ධර්මසේන හිමි

2. ගුත්තිල කාව්‍යය - වැත්තැවේ හිමි

3. ලෝවැඩ සඟරාව - වීදාගම මෛත්‍රී හිමි

4. කව් සිළුමිණ - දෙවන පරාක්‍රමබාහු

24. 1. කෝට්ටේ - හත්වන බුවනෙකබාහු

2. කන්ද උඩරට - දෙවන පරාක්‍රමබාහු

3. රයිගම - රයිගම් බණ්ඩාර

4. සීතාවක - මායාදුන්නේ

25. 1. බුරුමය - ස්වේදගොන්

2. සියමය - ප්‍රාචීන් පුරි

3. කාම්බෝජය - අන්කොර්වට්

4. ලාඕසය - බොරෝබුදූර්

- අංක 26 සිට 30 තෙක් ප්‍රශ්නවල දක්වා ඇති ්ල ්ල ක හා ෘ යන ප්‍රකාශ අතරින් දෙකක් නිවැරදි ය. එම පිළිතුරු-වලින් නිවැරදි ප්‍රකාශ දෙක තෝරා

**A සහ B පමණක් නිවැරදි නම් අංක 1 ද,** **B සහ C පමණක් නිවැරදි නම් අංක 2 ද,**

**C සහ D පමණක් නිවැරදි නම් අංක 3 ද,** **A සහ D පමණක් නිවැරදි නම් අංක 4 ද,**

**පිළිතුරු පත්‍රයෙහි ලකුණු කරන්න.**

26. සොළොස් මහා ජනපද සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශ නිවැරදි වේ ද?

A රාජාණ්ඩු පාලනය යනු රජුගේ ප්‍රධානත්වයෙන් පැවැති පාලනය යි.

B සප්ත අපරිහාණීය ධර්මවලට අනුව කටයුතු කිරීම ලිච්ඡවීන්ගේ ඉහළ ගුණාංගයකි.

C සමූහාණ්ඩු පාලනයේ දී ව්‍යවස්ථාදායක විධායක අධිකරණ බලතල රජු සතුවිය.

D මගධය හා කෝසලය බලසම්පන්න සමූහාණ්ඩු වේ.

27. ලන්දේසීන්ගේ ආගමික කටයුතු සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශ නිවැරදි වේ ද?

A කොළඹ, යාපනය, ගාල්ල, මන්නාරම ආදි මධ්‍යස්ථානවල ආගමික මණ්ඩල පිහිටුවීම.

B රෙපරමාදු ආගමිකයන් මර්දනය සඳහා විවිධ අණපනත් පැනවීම.

C කතෝලික ආගමිකයන්ට මුදළි, මුහන්දිරම් වැනි නිලතල වරප්‍රසාද ලබා දීම.

D දෙමළ හා සිංහල භාෂාවලින් ආගම ප්‍රචාරය කිරීම.

28. යුරෝපා ජාතීන් පෙරදිගට පැමිණීමට බලපෑ සාධක සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශ නිවැරදි වේද?

A රත්රන් ලබා ගැනීම.

B මුස්ලිම්වරු සතු වූ ආසියාවේ වෙළඳ ඒකාධිකාරය ලබා ගැනීම.

C යටත් විජිත ඇතිකර ගැනීම.

D ඉඩම් අහිමි යුරෝපීයන් ආසියාවේ පදිංචි කරවීම.

29. සෙංකඩගල රාජධානිය සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශ නිවැරදි වේ ද?

A පළමුවන රාජසිංහ රජු උඩරට රාජධානියේ ආරම්භක පාලකයා වීම.

B ටිකිරි කුමරු පළමුවන විමලධර්මසූරිය නමින් උඩරට පාලකයා බවට පත් වීම.

C කුසුමාසන දේවිය උඩරට රාජධානියේ නීත්‍යානුකූල හිමිකාරිය වීම.

D යමසිංහ බණ්ඩාර දොන් පිලිප් නමින් බෞතීස්ම ලැබීම.

30. අශෝක රජු සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශ නිවැරදි වේ ද?

A අශෝක චන්ද්‍රගුප්ත රජුගේ පුත්‍රයා ය.

B රාජ්‍යත්වය ස්ථාපිත කරගැනීම සඳහා දරුණු ක්‍රියාමාර්ග අනුගමනය කිරීම.

C දෙවනපිය යන විරුද නාමයෙන් හැඳින්වීම.

D මිසරය ග්‍රීසිය වැනි රටවල් සමග තානාපති සබඳතා පැවැත්වීම.

- අංක 31 සිට 35 දක්වා එක් එක් ප්‍රශ්නයෙහි නාම ප්‍රකාශන සමූහයක් ඕ හා ශ තීරුවල දී ඇත. එම ප්‍රකාශන කිසියම් ආකාරයට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නොවේ. ඒවා ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට නිවැරදි වරණය තෝරා පිළිතුරු පත්‍රයෙහි ලකුණු කරන්න.

31.

| | X | | Y |
|---|---|---|---|
| 1. | ශාක්‍ය | A | කුසිනාරා |
| 2. | මල්ල | B | මිථිලා |
| 3. | ලිච්ඡවීන් | C | කපිලවස්තු |
| 4. | විදේහයන් | D | වේසාලි |

1. B, A ,D, C  2. D, B ,A ,C

3. C, A, D, B  4. C, A, B, D

32. X Y

| | X | | Y |
|---|---|---|---|
| 1. | කෝට්ටේ | A | සේනාසම්මත වික්‍රමබාහු |
| 2. | රයිගම | B | මායාදුන්නේ |
| 3. | සීතාවක | C | මද්දුම බණ්ඩාර |
| 4. | උඩරට | D | හත්වන බුවනෙකබාහු |

1. B, D, C, A 2. D, A, B, C 3. C, B, D, C 4. D, C, B, A

33.

| | X | | Y |
|---|---|---|---|
| 1. | වජ්ජි | A | උදේනිය |
| 2. | වත්ස | B | ද්වාරකපුරය |
| 3. | අවන්ති | C | විශාලා |
| 4. | කාම්බෝජ | D | කොසඹෑ |

1. C, D, A, B 2. A, D, B C 3. B C A D 4. C A D B

34.

| | X | | Y |
|---|---|---|---|
| 1. | මල්වතු ඔය | A | ගෝණ නදී |
| 2. | කලා ඔය | B | කප්පරකන්ද නදී |
| 3. | මහවැලි ගඟ | C | කදම්භ නදී |
| 4. | මැණික් ගඟ | D | මහා වාලුකා නදී |

1. D, A, B, C 2. A, D, C, B 3. B, A, D, C 4. C, A, D, B

35.

| | X | | Y |
|---|---|---|---|
| 1. | පරාක්‍රමබාහු | A | අභය වැව |
| 2. | ධාතුසේන | B | මහවිලච්චිය |
| 3. | වසභ | C | කලා වැව |
| 4. | පණ්ඩුකාභය | D | පරාක්‍රම සමුද්‍රය |

1. D, C, B, A 2. C, A, D, B 3. A, B, C, D 4. C, A, B, D

- අංක 36 සිට 40 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයෙහි ප්‍රකාශ දෙක බැගින් ඇතුළත් වේ. ඒ ඒ ප්‍රශ්නවලට අදාළ ව දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන ප්‍රකාශය දැ යි තෝරා ගෙන අදාළ අංකය පිළිතුරු පත්‍රයෙහි ලකුණු කරන්න.

| වරණ අංකය | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 1 | නිවැරදි ය. | නිවැරදි ය. |
| 2 | නිවැරදි ය. | වැරදි ය. |
| 3 | වැරදි ය. | වැරදි ය. |
| 4 | වැරදි ය. | නිවැරදි ය. |

| | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 36 | ආලාහන පිරිවෙන ඉදි කිරීම පළමුවන පරාක්‍රමබාහු රජුගේ වැදගත් ආගමික සේවාවකි. | ආලාහන පිරිවෙනේ සුභද්‍රා, රූපවතී යනුවෙන් ස්ථූප දෙකක් ඉදි කර ඇත. |
| 37 | දෙවන පරාක්‍රමබාහු රජු කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත'' යන උපාධි නාමයෙන් හැඳින්වීය. | ගුත්තිල කාව්‍ය දෙවන පරාක්‍රමබාහු රජු විසින් රචිත කෘතියකි. |
| 38 | පළමුවන විජයබාහු රජුගේ මෑණියන් සිහි වීම පිණිස පැපිළියාන සුනේත්‍රාදේවී පිරිවෙන කරවීම. | තොටගමුවේ ශ්‍රී රාහුල හිමි පළමුවන විජයබාහු රජුගේ කාලයේ විසූ ප්‍රකට පඬිවරයෙකි. |
| 39 | ග්‍රීක සමාජය පුරවැසියන් හා වහලුන් යනුවෙන් ප්‍රධාන කොටස් දෙකකින් සමන්විත විය. | ග්‍රීක සමාජයේ බහු දේව වාදයක් පැවතුණි. |
| 40 | අශෝක කාලිංග යුද්ධයෙන් පසු අවිහිංසාවාදි ප්‍රතිපත්තියක් අනුගමනය කළේ ය. | අශෝක ආගමික සහනශීලී ප්‍රතිපත්තියක් අනුගමනය කළේ ය. |

| | |
|---|---|
| | **මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය 2020** |
| | **Primary Piriven Year End Test - 2020** |
| | **04 ශ්‍රේණිය/Grade 04** |
| සියලු ම හිමිකම් ඇවිරිණි<br>All Rights Reserved | **ඉතිහාසය** I, II<br>**History Science** I, II |

**ඉතිහාසය II**

සැලකිය යුතු යි :

i. අංක 01 ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් තෝරා ගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

ii. මෙම කොටසට ලකුණු 60ක් හිමි වේ.

---

01.

i. ඔබට සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි පහත සඳහන් සියලු ම ස්ථාන ලකුණු කර නම් කරන්න.

| | | | |
|---|---|---|---|
| 1. | කලා ඔය | 2. | මහාතිත්ථ |
| 3. | සීගිරිය | 4. | කතරගම |
| 5. | අනුරාධපුරය | 6. | සෙංකඩගල |

(ලකුණු 1 × 6 = 6)

ii. පහත දී ඇති රූප සටහන් ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. A වලින් දැක්වෙන රූපය හඳුන්වන නම කුමක් ද ?
2. මෙහි දැකිය හැකි ප්‍රතිමාවක් නම් කරන්න.
3. මෙය පිහිටා ඇති රට කුමක් ද ?



A

(ලකුණු 1 × 3 = 3)

iii. 1. B වලින් දැක්වෙන රූපය කුමක් ද ?

2. මෙය අයත් වූ රාජධානිය නම් කරන්න.

3. මෙම රාජධානියෙ ආරම්භක පාලකයාගේ නම කුමක් ද?



B

(ලකුණු 1 × 3 = 3)

02

I අනුරාධපුර රාජධානියේ ආරම්භක පාලකයා සහ අවසාන පාලකයා නම් කරන්න. (ලකුණු 02)

II අනුරාධපුර යුගයේ රජකම උරුම වූ ක්‍රම දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

III අනුරාධපුර රාජධානියේ පරිහානියට හා බිඳවැටීමට බලපෑ හේතු සාධක දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

03 "මෙරට නිරිතදිග ප්‍රදේශයේ බිහිවූ ප්‍රථම රාජධානිය දඹදෙණිය යි"

I දෙවන පරාක්‍රමබාහු රජතුමා පිළිබඳ තොරතුරු ලබාගත හැකි මූලාශ්‍රය දෙකක් නම් කරන්න (ලකුණු 02)

II තුන්වන විජයබාහු රජතුමාගේ ආගමික සේවා දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

III දෙවන පරාක්‍රමබාහු රජතුමාගේ දේශපාලනික හා ආගමික සේවා දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

04 "සිංහල සාහිත්‍යයේ ස්වර්ණමය යුගය සේ සැලකෙන්නේ කෝට්ටේ යුගය යි."

I කෝට්ටේ යුගයේ විසූ ප්‍රකට පඬිවරුන් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 02)

II මෙම යුගයේ රචනා වූ සංදේශ කාව්‍ය හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

III හයවන පරාක්‍රමබාහු රජතුමාගේ රාජ්‍ය කාලයේ දී ආගමික, සාහිත්‍යය හා අධ්‍යාපනික වශයෙන් විශාල දියුණුවක් ඇති විය. කරුණු දෙකක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

05 අග්නිදිග ආසියාවේ බෞද්ධ සංස්කෘතිය පහත මාතෘකා දෙක ඇසුරින් විස්තර කරන්න.

I බුරුමයේ ථෙරවාද බුදු දහම. (ලකුණු 06)

II ජපානයේ බුදු දහම ව්‍යාප්ත වීම. (ලකුණු 06)

06

I චීනයට බුදු දහම හඳුන්වා දුන් භික්ෂූන් වහන්සේලා දෙනම නම් කරන්න.

(ලකුණු 02)

II චීනයේ පැවති බෞද්ධ නිකායන් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

III  සියම හා ශ්‍රී ලංකාව අතර පැවති ආගමික සම්බන්ධතාව නිදසුන් දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

07

I  මගධ අධිරාජ්‍යයේ වර්ධනයට හා ව්‍යාප්තියට බලපෑ හේතු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

II  අශෝක අධිරාජ්‍යයා ධර්මයෙන් රටවල් හා ජනතාව දිනා ගැනීම සඳහා ගත් ක්‍රියාමාර්ග දෙකක් ලියන්න.

(ලකුණු 04)

III  මෞර්ය අධිරාජ්‍යයේ පරිහානියට බලපෑ හේතු දෙකක් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

08 පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් පිළිබඳ ව ඓතිහාසික තොරතුරු විස්තර කරන්න.

I  මහා පරාක්‍රමබාහු රජතුමා.

II  පෘතුගීසින්ගේ උඩරට ආක්‍රමණය

III  ලන්දේසි පාලනය.

Iv  රෝම ශිෂ්ටාචාරයේ ආර්ථිකය.

(එක් කොටසකට ලකුණු 6 බැගින්)

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

දහම් පාසල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
அறநெறிப் பள்ளிகள், பிரிவேனாக்கள் மற்றும் பிக்கு கல்வி மாநில அமைச்சகம் - பிரிவேனா கல்விக் கிளை
State Ministry of Dhamma Schools, Pirivenas and Bhikku Education – Piriven Educational Branch

**වර්ෂාවසාන පරීක්ෂණය - 2021 (2022)**
**ஆண்டிறுதிப் பரீட்சை - 2021 (2022)**
Year End Term Test – 2021 (2022)

පැය තුනයි

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

අමතර කියවීම් කාලය මිනිත්තු 10 යි.

**ඉතිහාසය - I, II** **4 ශ්‍රේණිය**

## ඉතිහාසය - I

සැලකිය යුතුයි :
- ❖ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.
- ❖ අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ❖ ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.
- ❖ එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

- අංක 1 සිට 15 තෙක් එක් එක් ප්‍රශ්නයට ගැළපෙන පිළිතුර තෝරන්න.

01. පොළොන්නරු රාජධානියේ අවසාන පාලකයා කවුරුන් ද?
1. වීරබාහු රජු 2. නිශ්ශංකමල්ල රජු 3. පරාක්‍රම පාණ්ඩ්‍ය රජු 4. ධර්මාශෝක රජු

02. මහා පරාක්‍රමබාහු රජු ඉදිකළ පිරිවෙන් ආයතනයක් වන්නේ මින් කුමක් ද?
1. මහාවිහාර පිරිවෙන 2. ආලාහණ පිරිවෙන
3. දික්සඳ සෙනෙවියා පිරිවෙන 4. මයුර පිරිවෙන

03. "කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත" යන නාමයෙන් හැඳින්වූ රජතුමා කවරෙක් ද?
1. මහා පරාක්‍රමබාහු රජතුමා 2. තුන්වන විජයබාහු රජතුමා
3. පළමුවන බුවනෙකබාහු රජතුමා 4. දෙවන පරාක්‍රමබාහු රජතුමා

04. කුරුණෑගල විචිත්‍ර දළදා මාලිගයක් ඉදිකළ රජතුමා කවුද?
1. සිවුවන පරාක්‍රමබාහු රජු ය. 2. හතරවන බුවනෙකබාහු රජු ය.
3. තුන්වන පරාක්‍රමබාහු රජු ය. 4. දෙවන පරාක්‍රමබාහු රජු ය.

05. ගඩලාදෙණිය විහාරය ඉදිකරන ලද්දේ කුමන රාජධානි සමයේ දී ද?
1. දඹදෙණි යුගය 2. මහනුවර යුගය 3. ගම්පොළ යුගය 4. සීතාවක යුගය

06. කෝට්ටේ යුගයේ දී රචිත සන්දේශ කාව්‍යයක් නොවන්නේ මින් කුමක් ද?
1. තිසර සන්දේශය 2. හංස සන්දේශය 3. සැළලිහිණි සන්දේශය 4. කෝකිල සන්දේශය

07. දේශගවේෂණ ව්‍යාපාරයේ පුරෝගාමියා ලෙස සැලකෙන පෘතුගාල ජාතිකයා කවරෙක් ද?
1. නාවික හෙන්රි 2. ලොරෙන්සෝ ද අල්මේදා
3. ෆ්‍රැන්සිස්කෝ ද අල්මේදා 4. වස්කෝද ගාමා

08. විජයබා කොල්ලය නම් ඓතිහාසික සිදුවීම සිදු වූ වර්ෂය කුමක් ද?
1. ක්‍රි.ව. 1521 2. ක්‍රි.ව. 1505 3. ක්‍රි.ව. 1597 4. ක්‍රි.ව. 1658

09. කැරගල පද්මාවතී පිරිවෙන ඉදිකරන ලද්දේ කුමන යුගයේ දී ද?
1. දඹදෙණිය 2. ගම්පොළ 3. කුරුණෑගල 4. කෝට්ටේ

10. ක්‍රි.ව. 1602 දී පළමුවන විමලධර්මසූරිය රජු මුණගැසුණු ලන්දේසි දූතයා කවුද?
   1. හියුබොයිඩ්   2. 12 යි.   3. ජොරිස් වැන් ස්පිල් බර්ජන්   4. ජෝන් පයිබස්

11. ඇලෙක්සැන්ඩර්ගේ ආක්‍රමණවලින් පසු ග්‍රීක සංස්කෘතිය හැඳින්වෙන නම කුමක් ද?
   1. හෝමරික   2. හෙලනිස්ටික්   3. ඇක්රෝපොලිස්   4. ප්ලේබියන්

12. **"ස්වභාවික ඉතිහාසය"** නම් කෘතිය රචනා කළ ලේඛකයා කවරෙක් ද?
   1. ප්ලිනි   2. ටොලමි   3. හමුරාබි   4. වර්ජිල්

13. මෞර්ය අධිරාජ්‍යයේ අගනුවර කුමක් ද?
   1. බරණැස   2. පුරුෂපුරය   3. පාඨලීපුත්‍ර   4. මධුරාපුරය

14. ස්වේදගොන් චෛත්‍ය ඉදිකළ පාලකයා කවුද?
   1. ධම්මචේතිය රජ   2. ධර්මරාජලිදයිය රජ   3. ජයවර්මන් රජ   4. අනවරථ රජ

15. අන්කෝර්වට් හි විහාරය පිහිටා ඇති රට කුමක් ද?
   1. චීනය   2. ඉන්දුනීසියාව   3. කාම්බෝජය   4. තායිලන්තය

- **අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් හතර බැගින් ලබාදී ඇත. ඒවා අතුරින් එක් නමක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග නොගැළපේ. එම නොගැළපෙන නාමය තෝරන්න.**

16. 1. කොළඹ කොමාන්ඩරිය   2. යාපනය කොමාන්ඩරිය
   3. මීගමු කොමාන්ඩරිය   4. ගාල්ල කොමාන්ඩරිය

17. 1. ගුත්තිල කාව්‍ය   2. කාව්‍යශේඛරය   3. කෝකිල සන්දේශය   4. කව්සිළුමිණ

18. 1. පළමුවන පරාක්‍රමබාහු   2. දෙවන පරාක්‍රමබාහු
   3. කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල   4. පළමුවන විජයබාහු

19. 1. දන්තුරේ   2. බලන   3. වෙල්ලස්ස   4. ගන්නෝරුව

20. 1. මිනෝවන්   2. ඇතැන්ස්   3. ස්පාර්ටා   4. ඇකේඩියා

- **අංක 21 සිට 25 තෙක් ප්‍රශ්නවල නාම / ප්‍රකාශන යුගල හතර බැගින් ලබා දී ඇතග ඒවා අතුරෙන් එක් නාම / ප්‍රකාශන යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන නාම / ප්‍රකාශන යුගලය තෝරන්න.**

21. 1. වීනස් - ආලයට අධිපති දෙවඟන   2. ජුපිටර් - අහසට අධිපති දෙවියා
   3. මාර්ස් - මව් දෙවඟන   4. නෙප්චූන් - මුහුදට අධිපති දෙවියා

22. 1. කෝට්ටේ - හත්වන බුවනෙකබාහු   2. සීතාවක - මායාදුන්න
   3. රයිගම - පළමුවන රාජසිංහ   4. උඩරට - ජයවීර බණ්ඩාර

23. 1. රජරට - පළමුවන විජයබාහු   2. රෝහණය - පළමුවන වික්‍රමබාහු
   3. දක්ඛිණ දේශය - මානාභරණ   4. යාපනය - යමසිංහ බණ්ඩාර

24. 1. තුන්වන විජයබාහු රජු - ලංකාතිලකය   2. පළමුවන විජයබාහු රජු - අටදාගෙය
   3. පළමුවන පරාක්‍රමබාහු රජු - වටදාගෙය   4. නිශ්ශංකමල්ල රජු - හැටදාගෙය

25. 1. මුල්ලේරියා සටන - අපොන්සු පෙරෙයිරා ද ලසර් දා
   2. බලන සටන - දියෝගෝ ද මේලෝ ද කැස්ත්‍රෝ
   3. රන්දෙණිවල සටන - කොන්ස්තන්තිනු ද සා
   4. දන්තුරේ සටන - පේරෝලෝපේස් ද සූසා

- අංක 26 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා (A), (B), (C) හා (D) යන ප්‍රතිචාර හතරක් දී ඇත. ඒවා අතුරෙන් දෙකක් නිවැරදි ය. එම නිවැරදි ප්‍රතිචාර දෙක තෝරන්න.

**(A) සහ (B) පමණක් නිවැරදි නම්, අංක 1 ද,**
**(B) සහ (C) පමණක් නිවැරදි නම්, අංක 2 ද,**
**(C) සහ (D) පමණක් නිවැරදි නම්, අංක 3 ද,**
**(A) සහ (D) පමණක් නිවැරදි නම්, අංක 4 ද, සලකුණු කරන්න.**

26. ආසියාව සහ යුරෝපය අතර පැවති වෙළෙඳ මාර්ග සම්බන්ධයෙන් පහත කවර ප්‍රකාශ නිවැරදි වේ ද?
A. කොන්ස්තන්තිනෝපල් වරායේ සිට චීනය දක්වා ගොඩබිම් සේද මාවත පැවතීම.
B. කොන්ස්තන්තිනෝපල් වරායේ සිට ඉන්දියානු සාගරය හරහා මුහුදු සේද මාවත වැටී තිබීම.
C. කේන්ස්තන්තිනෝපල් වරායේ සිට ගොඩබිම් සේද මාවතක් පමණක් වැටී තිබීම.
D. කොන්ස්තන්තිනෝපල් වරායේ සිට මුහුදු සේද මාවතක් පමණක් වැටී තිබීම.

27. පහත යුගවල බිහි වූ සාහිත්‍ය කෘති අතරින් කවර ප්‍රකාශ නිවැරදි වේ ද?
A. පොලොන්නරු යුගයේ දී වංසත්ථප්පකාසිනී රචනා කිරීම
B. අනුරාධපුර යුගයේ දී රසවාහිනිය රචනා කිරීම
C. කුරුණෑගල යුගයේ දී සිංහල ජාතකපොත රචනා කිරීම
D. දඹදෙණි යුගයේ දී පූජාවලිය රචනා කිරීම

28. ක්‍රි. පූ. හයවන සියවසේ උතුරු ඉන්දියාව පිළිබඳ කවර ප්‍රකාශ නිවැරදි වේ ද?
A. සොළොස්මහා ජනපදවලින් ප්‍රබලම ජනපදය බවට පත්වූයේ කෝසලය යි.
B. සිසුනාග පෙළපතේ කැපී පෙනෙන පාලකයා අශෝක රජු ය
C. රාජාණ්ඩු හා සමූහාණ්ඩු පාලන ක්‍රමයක් පැවතීම.
D. ලිච්ඡවී පාලකයන් සතුව සප්ත අපරිහාණීය ධර්ම පැවතීම.

29. අශෝක අධිරාජ්‍යයාගේ ධර්ම විජය ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් කවර ප්‍රකාශ නිවැරදි වේ ද?
A. ධර්ම මහාමාත්‍රවරුන් පත්කිරීම.
B. සියලු රට වැසියන් තමාගේ දරුවන් ලෙස සැලකීම.
C. යාගහෝම බිලි පූජාවන්ට රාජ්‍ය අනුග්‍රහය ලබාදීම.
D. දෙවන ධර්ම සංගායනාවට අනුග්‍රහය ලබාදීම.

30. ලංකාව හා බුරුමය අතර සම්බන්ධතා සම්බන්ධයෙන් කවර ප්‍රකාශ නිවැරදි වේ ද?
A. පළමුවන විජයබාහු රජ දවස බුරුමය හා ලංකාව අතර වාණිජ සබඳතා ඇතිවීම.
B. හයවන පරාක්‍රමබාහු රජ දවස බුරුමය සමඟ ආගමික සබඳතා ඇති වීම.
C. බුරුම දේශ ආක්‍රමණයෙන් පරාක්‍රමබාහු රජු පරාජය වීම.
D. නිශ්ශංකමල්ල රජතුමා සිය දියනියක් බුරුමයට විවාහ කරදීම.

- **අංක 31 සිට 35 තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම/ප්‍රකාශන සමූහයක් X සහ Y තීරුවල දී ඇත. Y තීරුවේ දී ඇති නාම/ප්‍රකාශන X තීරුවේ දී ඇති නාම/ප්‍රකාශන සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නොවේ. Y තීරුවේ ඒවා X තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.**

31.

| X | Y |
|---|---|
| 1. දෙවන රාජසිංහ | A. සීතාවක |
| 2. නිශ්ශංකමල්ල | B. මහනුවර |
| 3. වසභ | C. පොලොන්නරුව |
| 4. පළමුවන රාජසිංහ | D. අනුරාධපුරය |

1. A D B C   2. D A C B   3. B C A D   4. B C D A

32. **X** **Y**

1. ශාක්‍ය
2. ලිච්ඡවී
3. වේදේහ
4. කෝලිය

A. වේසාලි
B. රාමගාම
C. කපිලවස්තු
D. මිථිලා

1. A D C B  2. C B A D  3. C A D B  4. D C A B

33. **X** **Y**

1. බලන
2. රන්දෙණිවල
3. දන්තුරේ
4. ගන්නෝරුව

A. 1638
B. 1594
C. 1602
D. 1630

1. B D A C  2. C B D A  3. B C A D  4. C A B D

34. **X** **Y**

1. පළමුවන පරාක්‍රමබාහු
2. දෙවන පරාක්‍රමබාහු
3. සිවුවන පරාක්‍රමබාහු
4. අටවන පරාක්‍රමබාහු

A. කෝට්ටේ
B. පොළොන්නරුව
C. කුරුණෑගල
D. දඹදෙණිය

1. A D C B  2. B A D C  3. B D A C  4. B D C A

35. **X** **Y**

1. කුසුමාසන දේවිය
2. යමසිංහ බණ්ඩාර
3. කොනප්පු බණ්ඩාර
4. ධර්මපාල

A. දොන් පිලිප්
B. දොන් ජුවන් පෙරිය බණ්ඩාර
C. දෝන කතිරිනා
D. ඔස්ට්‍රියාවේ දොන් ජුවාන්

1. A B C D  2. C A D B  3. C D B A  4. D C A B

- **අංක 36 සිට 40 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයෙහි ප්‍රකාශ දෙක බැගින් ඇතුළත් වේ. ඒ ඒ ප්‍රශ්නයට දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන කවර ප්‍රකාශ යුගලය දැයි තෝරා එහි අංකය සලකුණු කරන්න.**

| වරණ අංකය | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 1 | නිවැරදි ය. | නිවැරදි ය. |
| 2 | නිවැරදි ය. | වැරදි ය. |
| 3 | වැරදි ය. | වැරදි ය. |
| 4 | වැරදි ය. | නිවැරදි ය. |

| | පළමුවන ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 36. | යාපහුව රාජධානියේ ආරම්භක පාලකයා පළමුවන භුවනෙකබාහු රජු ය. | පළමුවන භුවනෙකබාහු රජු යාපහුවේ දළදා මන්දිරයක් තැනවී ය. |
| 37. | ලන්දේසීන් විසින් රෝමානු කතෝලික ආගම ප්‍රචාරය කරන ලදී. | ලන්දේසීන්ගේ පෙරදිග වෙළෙඳ මධ්‍යස්ථානය වූයේ ජාවා දූපතේ බතාවිය යි. |
| 38. | පර්සියාවේ ඩේරියස් රජු ග්‍රීසිය දක්වා තම බලය ව්‍යාප්ත කරන ලදී. | පෞර රාජ්‍ය යනු ඉන්දියාවේ පැවති දේශපාලන ඒකක විශේෂයකි. |
| 39. | පියුනික් යුද්ධ ඇති වූයේ රෝමවරු හා ග්‍රීකවරු අතර ය. | උතුරු හා දකුණු රෝම අධිරාජ්‍යය වශයෙන් ප්‍රධාන කොටස් දෙකකට වෙන් කෙරිණි. |
| 40. | චන්ද්‍රගුප්ත මෞර්ය රජුගේ උපදේශකයා වූයේ ඇලෙක්සැන්ඩර් ය. | බින්දුසාර රජු මිසරය හා ග්‍රීසිය සමඟ තානාපති සබඳතා පැවැත්වීය. |

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

**දහම් පාසල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන ශාඛාව**
அறநெறிப் பள்ளிகள், பிரிவேனாக்கள் மற்றும் பிக்கு கல்வி மாநில அமைச்சகம் - *பிரிவேனா கல்விக் கிளை*
State Ministry of Dhamma Schools, Pirivenas and Bhikku Education – Piriven Educational Branch

**වර්ෂාවසාන පරීක්ෂණය - 2021 (2022)**
**ஆண்டிறுதிப் பரீட்சை - 2021 (2022)**
Year End Term Test – 2021 (2022)

**ඉතිහාසය - I, II** **4 ශ්‍රේණිය**

## ඉතිහාසය - II

**සැලකිය යුතුයි :**

❖ **පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ද තෝරාගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

01. i. **ඔබට සපයා ඇති ශ්‍රී ලංකා ආකෘති සිතියමේ පහත සඳහන් ස්ථාන ලකුණු කර නම් කරන්න.**

1. කැලණිය 2. දූදුරුඔය 3. ගොඩවාය
4. පොළොන්නරුව 5. සීගිරිය 6. දඹකොළපටුන

(නිවැරදිව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගින්)

ii. **පහත A හා B රූප සටහන් අධ්‍යයනය කොට, ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(අ) A වලින් දැක්වෙන රූපය කුමක් ද?
(ආ) මෙම ස්තූපය පිහිටි ස්ථානය දක්වන්න.
(ඉ) මෙය ඉදිකරන ලද්දේ කවුරුන් විසින් දැයි නම් කරන්න.


A

(ලකුණු 1 × 3 = 3)

iii. (අ) B රූපයෙන් දක්වා ඇති ලාංඡනය කුමක් ද?
(ආ) මෙය අයත් වෙළෙඳ සමාගම කුමක් ද?
(ඉ) එම වෙළෙඳ සමාගම හැඳින්වූ කෙටි නාමය දක්වන්න.


B

(ලකුණු 1 × 3 = 3)

02. i. පළමුවන විජයබාහු රජු විසින් ප්‍රතිසංස්කරණය කළ වාරිමාර්ග දෙකක් නම් කරන්න. (ලකුණු 02)
ii. ආගමික වශයෙන් පළමුවන විජයබාහු රජු විසින් සිදුකළ කාර්යයන් පිළිබඳ කරුණු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)
iii. පළමුවන විජයබාහු රජුගේ වැදගත් දේශපාලන කාර්යයන් දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

03. i. දඹදෙණි රාජධානියේ ආරම්භක පාලකයා හා ශ්‍රේෂ්ඨතම පාලකයා නම් කරන්න. (ලකුණු 02)
ii. දඹදෙණි යුගයේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිවීම පිළිබඳ කරුණු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)
iii. ආගමික වශයෙන් දඹදෙණි යුගයේ ඇති වූ දියුණුව කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

04. i. කෝට්ටේ යුගයේ දී බිහි වූ පිරිවෙන් ආයතන දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii. හයවන පරාක්‍රමබාහු රජුගේ දේශපාලන ජයග්‍රහණ පිළිබඳ කරුණු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. කුරුණෑගල හා ගම්පොළ යුගවල දී සංස්කෘතික වශයෙන් ඇති වූ ප්‍රබෝදය පිළිබඳ කරුණු දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

05. i. උඩරට රාජධානිය ආක්‍රමණය කළ පෘතුගීසි කපිතාන් ජෙනරාල්වරු දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 02)

ii. පෘතුගීසීන් උඩරට රාජධානිය යටත් කරගැනීම සඳහා කළ ආක්‍රමණ අසාර්ථක වීමට හේතු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. පෘතුගීසීන් නිසා මෙරට සමාජයට හා සංස්කෘතියට සිදු වූ බලපෑම පිළිබඳව කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

06. i. ලන්දේසීන් ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ පරිපාලනය කිරීමේ දී භාවිතයට ගත් කොමාන්ඩරි දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii. ලන්දේසි ආර්ථික ප්‍රතිපත්තිය පිළිබඳ කරුණු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. ලන්දේසීන් නිසා මෙරට සමාජයට හා සංස්කෘතියට සිදු වූ බලපෑම කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

07. ග්‍රීක ශිෂ්ටාචාරය පහත සඳහන් මාතෘකා දෙක ඇසුරින් විස්තර කරන්න.

i. ග්‍රීක සාහිත්‍යය (ලකුණු 06)

ii. ග්‍රීක නාට්‍ය කලාව (ලකුණු 06)

08. පහත සඳහන් මාතෘකා අතුරින් **දෙකක්** පිළිබඳ ඓතිහාසික සටහන් ලියන්න.

i. සොළොස්මහා ජනපද

ii. බුරුමය හා ලංකාව අතර පැවති සබඳතා

iii. අශෝක රජු

iv. කාලිංග මාඝ ආක්‍රමණය

(ලකුණු 6 × 2 = 12)

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

**දහම් පාසල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන ශාඛාව**
அறநெறிப் பள்ளிகள், பிரிவேனாக்கள் மற்றும் பிக்கு கல்வி மாநில அமைச்சகம் - *பிரிவேனா கல்விக் கிளை*
State Ministry of Dhamma Schools, Pirivenas and Bhikku Education – Piriven Educational Branch

**වර්ෂාවසාන පරීක්ෂණය - 2021 (2022)**
**ஆண்டிறுதிப் பரீட்சை - 2021 (2022)**
Year End Term Test – 2021 (2022)

**ඉතිහාසය - II**

සැලකිය යුතුයි :

- දෙවන ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න අංක 1 (i) ට පිළිතුරු සැපයීම සඳහා මෙම සිතියම භාවිත කරන්න. පිළිතුරු සැපයීමෙන් පසුව මෙය ඔබේ පිළිතුරු පත්‍රය සමඟ අමුණා බාර දෙන්න.

0



සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය
கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு
Ministry of Education – Division of Piriven Education

වර්ෂාවසාන වාර පරීක්ෂණය - 2022 (2023)
ஆண்டிறுதிப் பரீட்சை - 2022 (2023)
Year End Term Test – 2022 (2023)

පැය තුනයි

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න

අමතර කියවීම් කාලය මිනිත්තු 10 යි.

**ඉතිහාසය - I, II** **4 ශ්‍රේණිය**

# ඉතිහාසය - I

සැලකිය යුතුයි :

- ❖ **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. මෙම කොටසට ලකුණු 40 ක් හිමි වේ. (1 × 40 = 40)**
- ❖ **අංක 01 සිට 40 තෙක් ඇති ප්‍රශ්නවල , දී ඇති (1) , (2) , (3) , (4) යන වරණ අතරින් නිවැරදි හෝ වඩාත් යෝග්‍ය වරණය තෝරා ඔබට ලැබී ඇති පිළිතුරු පත්‍රයේ අදාල කවය තුළ (×) ලකුණ යොදන්න.**

➢ **අංක 01 සිට 15 තෙක් එක් එක් ප්‍රශ්නයට ගැළපෙන පිළිතුර තෝරන්න.**

01. කුරුණෑගල රාජධානියේ ශ්‍රේෂ්ඨතම පාලකයා කවුරුන් ද?
    (1) හතරවන බුවනෙකබාහු රජු (2) හතරවන පරාක්‍රමබාහු රජු
    (3) පළමුවන බුවනෙකබාහු රජු (4) පළමුවන පරාක්‍රමබාහු රජු

02. පළමුවන පරාක්‍රමබාහු හා දෙවන ගජබාහු යන රජුන් අතර ඇති වූ සමගි සන්ධානය පිළිබඳ සඳහන් වන ඓතිහාසික ලිපිය කුමක් ද?
    (1) සංගමු විහාර ලිපිය (2) ගල්පොත ලිපිය
    (3) අඹගමුව ලිපිය (4) දඹුලු විහාර ලිපිය

03. ''කලිකාල සාහිත්‍යය සර්වඥ පණ්ඩිත" යන උපාධි නාමයෙන් පිදුම් ලද රජු කවුද?
    (1) පළමුවන පරාක්‍රමබාහු රජු (2) තුන්වන විජයබාහු රජු
    (3) නිශ්ශංකමල්ල රජු (4) දෙවන පරාක්‍රමබාහු රජු

04. දිවයින අවසන්වරට එක්සේසත් කළ කෝට්ටේ පාලකයා කවුද?
    (1) තුන්වන විජයබාහු රජු ය. (2) හයවන පරාක්‍රමබාහු රජු ය.
    (3) ධර්මපාල රජු ය. (4) හත්වන බුවනෙකබාහු රජු ය.

05. ජපානයේ අශෝක ලෙස හැඳින්වෙන බුදුදහමට උසස් මෙහෙවරක් සිදු කළ කුමරු කවුරුන් ද?
    (1) හුපාර්ථව (2) ෆාහියන් (3) ෂෝතොකු (4) වජ්‍රබෝධි

06. රෝම ජන සමාජයේ සිටි ප්‍රභුවරු හඳුන්වන ලද නාමය කුමක් ද?
    (1) පැට්‍රිෂියන්වරු (2) අයෝනියන්වරු (3) ප්ලේබියන්වරු (4) ඩෝරියන්වරු

07. පළමුවන විමලධර්මසූරිය රජු මුණගැසුණු ලන්දේසි ජාතික දූතයා කවුරුන් ද?
    (1) ජෝන් පයිබස් (2) රොබට් ඇන්ඩෲස්
    (3) ස්පීල් බර්ජන් (4) ජෙරනිමෝද් අසවේදු

08. රෝම ඉතිහාසය නම් කෘතිය රචනා කළ රචකයා කවුරුන් ද?
(1) ලිවී ය. (2) සෙනෙකා ය. (3) වර්ජිල් ය. (4) හොරස් ය.

09. ආළාහන පිරිවෙන ඉදි කරන ලද්දේ කුමන රජු විසින් ද?
(1) පළමුවන පරාක්‍රමබාහු රජු (2) පළමුවන විජයබාහු රජු
(3) වළගම්බා රජු (4) නිශ්ශංකමල්ල රජු

10. බෙලිගල වැඩසිටි දළදා වහන්සේ දඹදෙණියට වැඩමවා එහි මාලිගාවක දළදා වහන්සේ තැන්පත් කළ රජු කවුරුන් ද?
(1) තුන්වන විජයබාහු රජු (2) සිවුවන පරාක්‍රමබාහු රජු
(3) දෙවන පරාක්‍රමබාහු රජු (4) පළමුවන බුවනෙකබාහු රජු

11. ''ස්වභාවික ඉතිහාසය'' කෘතිය රචනා කළ රචකයා කවුද?
(1) ප්ලිනී (2) ප්ලේටෝ (3) ඇරිස්ටෝටල් (4) සොක්‍රටීස්

12. මගධ බලවර්ධනයේ උච්චතම අවධියේ දී මගධයට යටත් කරගත් රාජ්‍යය කුමක් ද?
(1) බෙංගාලය (2) කාලිංගය (3) ඩෙකෑනය (4) පාඨලීපුත්‍රය

13. පෘතුගීසින් ලංකාවට පැමිණෙන විට කෝට්ටේ පාලකයා වූයේ,
(1) හත්වන බුවනෙකබාහු රජු ය. (2) හයවන විජයබාහු රජු ය.
(3) අටවන වීර පරාක්‍රමබාහු රජු ය. (4) මායාදුන්නේ රජු ය.

14. ග්‍රීසියේ ඍජු ප්‍රජාතන්ත්‍රවාදය පැවති පෞර රාජ්‍ය කුමක් ද?
(1) ස්පාර්ටා (2) ඇකේඩියා (3) ඇතන්ස් (4) තිබ්ස්

15. පියුනික් යුද්ධ සිදුකළේ කුමන ප්‍රදේශයේ බලය අල්ලා ගැනීම සඳහා ද?
(1) කෝර්සිකා දූපත (2) උතුරු ඇමරිකාව
(3) ඇපිනයින් ප්‍රදේශය (4) රෝමය

➢ **අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් හතර බැගින් ලබා දී ඇත. ඒවා අතුරින් එක් නමක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ නොගැළපේ. එම නොගැළපෙන නාමය තෝරන්න.**

16. (1) පෘතුගාලය (2) ඕලන්දය (3) එංගලන්තය (4) ඇමෙරිකාව

17. (1) රන්කොත් වෙහෙර (2) හැටදාගෙය
(3) නිශ්ශංකමල්ල ලතා මණ්ඩපය (4) තිවංක පිළිමගෙය

18. (1) කෝකිල සන්දේශය (2) ගිරා සන්දේශය
(3) හංස සන්දේශය (4) මයුර සන්දේශය

19. (1) රාද්වෑන් ජස්ටිටි (2) සිවිල් රාද් (3) ලෑන්ඩ් රාද් (4) කොමාන්ඩරි

20. (1) පස්වන බුවනෙකබාහු රජු (2) හත්වන බුවනෙකබාහු රජු
(3) හතරවන බුවනෙකබාහු රජු (4) තුන්වන වික්‍රමබාහු රජු

- **අංක 21 සිට 25 තෙක් ප්‍රශ්නවල නාම/ප්‍රකාශන යුගල හතර බැගින් ලබා දී ඇත. ඒවා අතුරින් එක් නාම/ප්‍රකාශන යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන නාම/ප්‍රකාශන යුගලය තෝරන්න.**

21. (1) මගධ - චම්පා (2) ගාන්ධාර - පුරුෂපුර
(3) මල්ල - කුසිනාරා (4) කාසි - බරණැස

22. (1) මාර්ස් - යුද්ධයට අධිපති (2) සෙරෙස් - අස්වැන්නට අධිපති
(3) මිනර්වා - ආලයට අධිපති (4) ජුපිටර් - අහසට අධිපති

23. (1) රජරට - පළමුවන ජයබාහු රජු (2) දක්ෂිණ දේශය - මානාභරණ රජු
(3) අටදහස් රට - නිශ්ශංකමල්ල රජු (4) රෝහණය - පළමුවන වික්‍රමබාහු රජු

24. (1) ආර්ටිමීස් - සඳු දෙවියා (2) එරෝස් - යුද්ධයට අධිපති
(3) හෝමර් - ආකාශයට අධිපති (4) ඇෆ්‍රොඩයිට් - ආලයට අධිපති

25. (1) බුරුමය - ස්වේදගොන් (2) තායිලන්තය - ප්‍රාචින්පුරි
(3) කොරියාව - මීරුක් (4) සියම - හෙන්සා

- **අංක 26 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා (A), (B), (C) හා (D) යන ප්‍රතිචාර හතරක් දී ඇත. ඒවා අතුරෙන් දෙකක් නිවැරදි ය. එම නිවැරදි ප්‍රතිචාර දෙක තෝරන්න.**

  **(A) සහ (B) පමණක් නිවැරදි නම්, අංක 1 ද,**

  **(B) සහ (C) පමණක් නිවැරදි නම්, අංක 2 ද,**

  **(C) සහ (D) පමණක් නිවැරදි නම්, අංක 3 ද,**

  **(A) සහ (D) පමණක් නිවැරදි නම්, අංක 4 ද, සලකුණු කරන්න.**

26. චීනයේ බුදුදහම පැතිරී යාම සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශ නිවැරදි වේ ද?
(A) අශෝක රජු දවස බුදුදහම චීනයට පැමිණි බවට මතයක් පැවැතීම.
(B) නමවන සියවස අවසානයේ බුදුදහම රාජ්‍ය ආගම බවට පත් වීම.
(C) අරාබි වෙළෙන්දන් හරහා ආගම ප්‍රචාරය වීම.
(D) ලංකාවෙන් ථේරවාදී බුදුදහම චීනයට පැතිරීයාම.

27. කුරුණෑගල රාජධානි සමය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශ නිවැරදි වේ ද?
(A) කුරුණෑගල දළදා මැදුරක් ඉදිකිරීම.
(B) ගඩලාදෙණි විහාරය කරවීම.
(C) ගාල්ලේ ත්‍රි භාෂා ලිපිය පිහිටුවීම.
(D) පන්සිය පනස් ජාතක පොත සිංහලයෙන් රචනා වීම.

28. මහා විජයබාහු රාජ්‍ය සමය හා සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශ නිවැරදි ද?
(A) රක්ඛ නැමති ප්‍රාදේශීය පාලකයාගේ සහය මත මලය දේශය යටත් කරගැනීම.
(B) හැටදාගෙය ඉදිකිරීම.
(C) බුදුගුණ වැව නමින් වැවක් තැනීම.
(D) මහානාගහුල පාලන මධ්‍යස්ථානය කර ගනිමින් රුහුණේ ආදිපාද තනතුරට පත්වීම.



www.pirivena.lk

29. ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල ලන්දේසි ආගමික ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශ නිවැරදි ද?
    (A) ක්‍රිස්තියානි දේවගැතිවරුන් පුහුණු කිරීමට සෙමනේරි ඇති කිරීම.
    (B) කොළඹ, ගාල්ල, යාපනය ආදී මධ්‍යස්ථානවල ආගමික මණ්ඩල පිහිටුවීම.
    (C) බොහෝ ප්‍රදේශවල කතෝලික දේවස්ථාන ඇති වීම.
    (D) කෝට්ටේ රජ පවුල්වල අය කතෝලික ආගමට හරවා ගැනීම.

30. යාපහුව රාජධානිය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ මොනවාද?
    (A) පළමුවන බුවනෙකබාහු රජු මෙම රාජධානියේ ආරම්භක පාලකයා විය.
    (B) මෙම රාජධානියේ ශ්‍රේෂ්ඨතම පාලකයා හතරවන පරාක්‍රමබාහු රජු ය.
    (C) මෙම කාලයේ දී ප්‍රභූ පවුල් දෙකක් පාලන කටයුතුවල දී රජුට සහය විය.
    (D) පළමුවන බුවනෙකබාහු රජු ඊජිප්තුව සමග රාජ්‍ය තාන්ත්‍රික සබඳතා පැවැත්වීම.

➢ **අංක 31 සිට 35 තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම/ප්‍රකාශන සමූහයක් x සහ y තීරුවල දී ඇත. y තීරුවේ දී ඇති නාම / ප්‍රකාශන x තීරුවේ දී ඇති නාම/ප්‍රකාශන සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නොවේ. y තීරුවේ ඒවා x තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.**

31.

| x | y |
|---|---|
| 1. ගම්පොළ | A - පැපිලියානේ සුනේත්‍රාදේවි |
| 2. කෝට්ටේ | B - අස්ගිරි විහාරය |
| 3. පොලොන්නරුව | C - ලංකාතිලක විහාරය |
| 4. කුරුණෑගල | D - ආලාහණ පිරිවෙන |

(1) C A D B (2) D A C B (3) C B D A (4) A C D B

32.

| x | y |
|---|---|
| 1. පළමුවන පරාක්‍රමබාහු රජු | A - රන්කොත් වෙහෙර |
| 2. තුන්වන වික්‍රමබාහු රජු | B - උත්තරාරාමය |
| 3. නිශ්ශංකමල්ල රජු | C - වියජසුන්දරාරාමය |
| 4. පළමුවන විමලධර්මසූරිය රජු | D - මහනුවර දළඳ මාළිගාව |

(1) B C A D (2) D B A C (3) B D A C (4) B D C A

33.

| x | y |
|---|---|
| 1. අශෝක | A - නන්ද පෙළපත පරාජය කිරීම. |
| 2. බින්දුසාර | B - ඇලෙක්සන්ඩර්ගෙන් මගධය රැක ගැනීම. |
| 3. චන්ද්‍රගුප්ත මෞර්ය | C - කාලිංගය මගධයට ඈඳා ගැනීම. |
| 4. ධනනන්ද | D - මිසරය සමග තානාපති සබඳතා ඇති වීම. |

(1) A D C B (2) C D B A (3) C D A B (4) A C B D


www.pirivena.lk

34. x | y

1. තායිලන්තය — A - බොරෝබුදූර් විහාරය
2. බුරුමය — B - ආනන්ද විහාරය
3. ජපානය — C - නබොම් පතොම්
4. ඉන්දුනීසියාව — D - දයිබුත්සු බුද්ධ ප්‍රතිමාව

(1) D C A B (2) C B A D (3) C B D A (4) A C D B

35. x | y

1. දන්තුරේ සටන — A - 1602
2. රන්දෙණිවල සටන — B - 1594
3. ගන්නෝරුව සටන — C - 1630
4. බලන සටන — D - 1638

(1) B C D A (2) C A D B (3) C D B A (4) D C A B

➢ **අංක 36 සිට 40 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයෙහි ප්‍රකාශ දෙක බැගින් ඇතුළත් වේ. ඒ ඒ ප්‍රශ්නයට දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන කවර ප්‍රකාශ යුගලය දැයි තෝරා එහි අංකය සලකුණු කරන්න.**

| වරණ අංකය | පළමුවන ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 1 | **නිවැරදි ය.** | **නිවැරදි ය.** |
| 2 | **නිවැරදි ය.** | **වැරදි ය.** |
| 3 | **වැරදි ය.** | **වැරදි ය.** |
| 4 | **වැරදි ය.** | **නිවැරදි ය.** |

| | පළමුවන ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 36. | තුන්වන විජයබාහු රජු විසින් බෙලිගල දළදා මාලිගයක් ඉදිකරන ලදි. | දෙවන පරාක්‍රමබාහු රජු විසින් දළදා වහන්සේ බෙලිගලින් , දඹදෙණියට වැඩම කරවන ලදි. |
| 37. | ක්‍රි. ව. 1619 දී පෘතුගීසින් විසින් යාපන රාජධානිය ආක්‍රමණය කරන ලදි. | යාපනයේ කතෝලික දහම පැතිරවීම හා කප්පම් ලබාගැනීම පෘතුගීසින්ගේ අරමුණ විය. |
| 38. | මහා පරාක්‍රමබාහු රජතුමා ක්‍රි. ව. 1070 දී දිවයිනේ ම පාලකයා බවට පත් විය. | නිශ්ශංකමල්ල රජතුමා දඹුලු විහාරයට අනුග්‍රහය දැක්වීය. |
| 39. | පෘතුගීසීන් ප්‍රොතෙස්තන්ත රෙපරමාදු ආගම මුහුදුබඩ ප්‍රදේශවල ව්‍යාප්ත කරනු ලැබීය. | ලන්දේසීන් රෝමානු කතෝලික ආගම මුහුදුබඩ ප්‍රදේශවල ව්‍යාප්ත කරනු ලැබීය. |
| 40. | ග්‍රීක ශිෂ්ටාචාරය පෝෂණය වීමට ඊට පෙර තිබූ මිනෝවන්, මයිසීනියන් ශිෂ්ටාචාරවල බලපෑම ලැබුණි. | සොක්‍රටීස්, ප්ලේටෝ, ඇරිස්ටෝටල් ආදීන් රෝම දාර්ශනිකයෝ වෙති. |

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය
கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு
Ministry of Education – Division of Piriven Education

වර්ෂාවසාන වාර පරීක්ෂණය - 2022 (2023)
ஆண்டிறுதிப் பரீட்சை - 2022 (2023)
Year End Term Test – 2022 (2023)

**ඉතිහාසය - I , II** **4 ශ්‍රේණිය**

## ඉතිහාසය - II

සැලකිය යුතුයි :

❖ **පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ද තෝරාගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

01. (i). ඔබට සපයා ඇති ශ්‍රී ලංකා සිතියමේ පහත සඳහන් සියලුම ස්ථාන ලකුණු කර නම් කරන්න.

(i) නල්ලූර් (ii) මැණික් ගඟ
(iii) අනුරාධපුරය (iv) කෝට්ටේ
(v) පරාක්‍රම සමුද්‍රය (vi) කුරුණෑගල

(නිවැරදිව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගින්)

➢ පහත A හා B රූප සටහන් අධ්‍යයනය කොට, ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.


A

(ii). (අ) A රූපයෙන් දැක්වෙන විහාරය නම් කරන්න.
(ආ) මෙය ඉදිකරන ලද්දේ කුමන රජ දවසක ද?
(ඉ) මෙම නිර්මාණය අයත් වන්නේ කුමන රාජධානියට ද?

(ලකුණු 03)


B

(iii). (අ) B රූපයෙන් දැක්වෙන විහාරය නම් කරන්න.
(ආ) මෙය පිහිටි රට කුමක්ද?
(ඉ) මෙම ස්තූප සංකීර්ණය බෞද්ධ විහාරයක් වීමට පෙර ඉදිකරන ලද්දේ කුමක් වශයෙන් ද?

(ලකුණු 03)

02. "අනුරාධපුර රාජධානියේ පරිහානියෙන් පසු රාජධානිය පොලොන්නරුවට මාරු විය."

(i) පොලොන්නරු රාජධානියේ බලයට පත් ශ්‍රේෂ්ඨ පාලකයන් **දෙදෙනකු** නම් කරන්න. (ලකුණු 02)

(ii) අනුරාධපුර රාජධානිය පොළොන්නරුවට මාරු කිරීමට බලපෑ හේතු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) පළමුවන පරාක්‍රමබාහු රජතුමාගෙන් ලාංකේය වාරිමාර්ග ක්ෂේත්‍රයට සිදු වූ සේවාව කරුණු **දෙකක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

03. (i). පෘතුගීසින් ලංකාවට පැමිණෙන අවධියේ කෝට්ටේ සහ යාපනයේ සිටි පාලකයන් නම් කරන්න. (ලකුණු 02)

(ii). උඩරටට පෘතුගීසින් එල්ල කළ ආක්‍රමණ **දෙකක්** සදහන් කරන්න. (ලකුණු 04)

(iii). පෘතුගීසින් සහ යාපන රාජ්‍ය අතර පැවති සබඳතා කරුණු **දෙකක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

04. (i). ලන්දේසීන්ගේ මව් රාජ්‍ය හා පෙරදිග පාලන මූලස්ථානය පිහිටි ස්ථානය නම් කරන්න. (ලකුණු 02)

(ii). අධිකරණ සහ නීති ක්ෂේත්‍රයට ලන්දේසීන් හඳුන්වා දුන් අංග **දෙකක්** සදහන් කරන්න. (ලකුණු 04)

(iii). ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල ලන්දේසීන් අනුගමනය කළ ආර්ථික ප්‍රතිපත්තියේ ලක්ෂණ **දෙකක්** සදහන් කරන්න. (ලකුණු 06)

05. (i). ග්‍රීක පෞර රාජ්‍යයන් **දෙකක්** නම් කරන්න. (ලකුණු 02)

(ii). ග්‍රීක නාට්‍ය කලාවෙ ප්‍රධාන ලක්ෂණ **දෙකක්** සදහන් කරන්න. (ලකුණු 04)

(iii). රෝම ශිෂ්ටාචාරයේ පැවති ඇදහිලි හා විශ්වාස කරුණු **දෙකක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

06. (i). සොළොස් මහා ජනපදවලින් **දෙකක්** නම් කරන්න. (ලකුණු 02)

(ii). සොළොස් මහා ජනපදවල පැවති පාලන ක්‍රම **දෙක** සදහන් කරන්න. (ලකුණු 04)

(iii). මගධයේ බල වර්ධනයට බලපෑ හේතු කරුණු **දෙකක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

07. මෞර්ය අධිරාජ්‍යය පිළිබඳ පහත සඳහන් මාතෘකා **දෙක** ඇසුරෙන් විස්තර කරන්න.

(i). අශෝක අධිරාජ්‍යයාගේ ධර්ම විජය ප්‍රතිපත්තිය

(ii). මෞර්ය කලාව හා ගෘහ නිර්මාණ (ලකුණු $6 \times 2 = 12$)

08. පහත සඳහන් මාතෘකා ඇසුරෙන් **දෙකක්** පිළිබඳ ඓතිහාසික සටහන් ලියන්න.

(i). පළමුවන විජයබාහු රජතුමා

(ii). චීනයේ බුදු දහම

(iii). කෝට්ටේ යුගයේ සාහිත්‍යය

(iv). පොළොන්නරු රාජධානියේ බිඳවැටීම (ලකුණු $6 \times 2 = 12$)

සියලුම හිමිකම් ඇවිරිණි |
முழுப் பதிப்புரிமையுடையது |
All rights reserved |

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය/Ministry of Education - Division of Piriven Education/ கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு

| 07 | S | I, II |
|---|---|---|

## මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2023 (2024)

## 4 ශ්‍රේණිය

## (07) ඉතිහාසය - I, II

පැය තුනයි

අමතර කියවීම් කාලය - මිනිත්තු 10

අමතර කියවීම් කාලය ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛතාව දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

### ඉතිහාසය I පත්‍රය

සැලකිය යුතුයි :

* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.
* අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
* ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

- **අංක 01 සිට 15 තෙක් එක් එක් ප්‍රශ්නයට ගැළපෙන පිළිතුර තෝරන්න.**

01. අනුරාධපුර රාජධානියේ ආරම්භක පාලකයා වන්නේ,
    1. පස්වන මිහිඳු රජු ය. 2. පණ්ඩුකාභය රජු ය. 3. විජය රජු ය. 4. ඉලනාග රජු ය.

02. ඉන්දීය කුලී හමුදා ආධාරයෙන් මෙරට බලයට පත් පළමු පාලකයා වන්නේ,
    1. මුටසීව රජු ය. 2. සූරතිස්ස රජු ය. 3. දේවානම්පියතිස්ස රජු ය. 4. ඉලනාග රජු ය.

03. දකුණු ඉන්දියාව තුළ ලාංකේය පාලකයන්ගේ හිතවත් ම පිරිස වූයේ,
    1. පල්ලවයන් ය. 2. පාණ්ඩ්‍යයන් ය.
    3. චෝළයන් ය. 4. පාණ්ඩ්‍යයන් සහ චෝළයන් ය.

04. අවසන් වරට අනුරාධපුර රාජධානියේ වාරි කර්මාන්ත ඉදි කළ බවට තොරතුරු දක්නට ඇත්තේ,
    1. මහසෙන් රාජ්‍ය සමයේ ය. 2. ධාතුසේන රාජ්‍ය සමයේ ය.
    3. හතරවන මහින්ද රාජ්‍ය සමයේ ය. 4. වසභ රාජ්‍ය සමයේ ය.

05. අනුරාධපුරය විනාශ කර තම පාලන මධ්‍යස්ථානය පොලොන්නරුවට ගෙන ගොස් එයට **ජනනාථපුරම්** යන නම තබන ලද්දේ,
    1. පළමුවන රාජේන්ද්‍ර රජු ය. 2. මහා රාජ රාජ රජු ය.
    3. ශ්‍රී මාර ශ්‍රී වල්ලභ රජු ය. 4. දෙවන වරගුණ වර්මන් රජු ය.

06. පොලොන්නරු රාජධානිය පාලනය කළ ශ්‍රේෂ්ඨ පාලකයන් අතරට අයත් වන්නේ,
    1. පළමුවන පරාක්‍රමබාහු රජු ය. 2. පළමුවන සේන රජු ය.
    3. මානවම්ම රජු ය. 4. පස්වන මිහිඳු රජු ය.

07. කල්‍යාණවතී රැජින කුමන රජුගේ බිසව ද?
    1. වීරබාහු රජුගේ 2. නිශ්ශංකමල්ල රජුගේ
    3. පළමුවන පරාක්‍රමබාහු රජුගේ 4. පරාක්‍රම පාණ්ඩ්‍ය රජුගේ

08. ''**කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත**'' ලෙස හැඳින්වෙන්නේ කවුරුන් ද?
    1. නිශ්ශංකමල්ල රජතුමා 2. පළමුවන පරාක්‍රමබාහු රජතුමා
    3. දෙවන පරාක්‍රමබාහු රජතුමා 4. පළමුවන බුවනෙකබාහු රජතුමා

09. 15 වන සියවසයේ සිටි දේශ ගවේෂණ ව්‍යාපාරයේ පුරෝගාමියා කවුරුන් ද?
    1. වස්කෝ ද ගාමා 2. ටොලමි 3. නාවික හෙන්රි 4. ලොරෙන්සෝ ද අල්මේදා

10. පෘතුගීසීන් ලංකාවට පැමිණෙන විට කෝට්ටේ පාලනය ගෙන ගිය පාලකයා කවුරුන් ද?
    1. විජයබාහු රජු
    2. අටවන වීර පරාක්‍රමබාහු රජු
    3. බුවනෙකබාහු රජු
    4. මායාදුන්නේ රජු

11. කෝට්ටේ දළදා මැදුරේ තැන්පත් කර තිබූ දන්ත ධාතූන් වහන්සේ සඟවා තබන ලද්දේ,
    1. දෙල්ගමුව විහාරයේ කුරහන් ගලේ ය.
    2. කිතුල්පේ විහාරයේ කුරහන් ගලේ ය.
    3. වෑගම විහාරයේ කුරහන් ගලේ ය.
    4. බෙලිගල විහාරයේ කුරහන් ගලේ ය.

12. සීතාවක රාජසිංහ නමින් අභිෂේක ලැබුවේ කවුරුන් ද?
    1. ධර්මපාල කුමරු
    2. මායාදුන්නේ කුමරු
    3. බුවනෙකබා කුමරු
    4. ටිකිරි කුමරු

13. ''දොන් පිලිප්'' නමින් බෞතීස්ම ලැබුවේ,
    1. කොනප්පු බණ්ඩාර ය.
    2. යමසිංහ බණ්ඩාර කුමරු ය.
    3. ධර්මපාල කුමරු ය.
    4. ඉහත කිසිවෙකු නොවේ.

14. ''කන්ද උඩරට ද්‍රෝහියා'' යන ආක්‍රෝශ නාමයෙන් පෘතුගීසීන් විසින් හඳුන්වන ලද්දේ,
    1. දෙවන රාජසිංහ රජු ය.
    2. සෙනරත් රජු ය.
    3. පළමුවන විමලධර්මසූරිය රජු ය.
    4. පළමුවන රාජසිංහ රජු ය.

15. පෘතුගීසී ජාතිකයන් නිසා ලංකාවේ ඇති වූ ලෙඩ රෝගයක් වන්නේ මින් කුමක් ද?
    1. මැලේරියාව
    2. ලාදුරු
    3. ඩෙංගු
    4. පාචනය

- **අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් හතර බැගින් ලබා දී ඇත. ඒවා අතුරින් එක් නමක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග නොගැළපේ. එම නොගැළපෙන නාමය තෝරන්න.**

16. 1. සිල්වා 2. පෙරේරා 3. කොස්තා 4. රණසිංහ

17. 1. දෝසි 2. කිරිබත් 3. පාන් 4. සලාද

18. 1. කොළඹ කොමාන්ඩරිය 2. ගාල්ල කොමාන්ඩරිය 3. යාල කොමාන්ඩරිය 4. යාපනය කොමාන්ඩරිය

19. 1. රාද් වෑන් ජස්ටිට් 2. හුෆ්ට්මන් 3. ලැන්ඩ්රාද් 4. සිවිල්රාද්

20. 1. නටරාජා ප්‍රතිමාව 2. සියුස් ප්‍රතිමාව 3. ඇතීනා ප්‍රතිමාව 4. මයිරෝ ප්‍රතිමාව

- **අංක 21 සිට 25 තෙක් ප්‍රශ්නවල නාම / ප්‍රකාශන යුගල හතර බැගින් ලබා දී ඇත. ඒවා අතුරින් එක් නාම / ප්‍රකාශන යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන නාම / ප්‍රකාශන යුගලය තෝරන්න.**

21. 1. ආකාශයට අධිපති - සියුස් දෙවියා
    2. බුද්ධියට අධිපති - ඇපලෝ දෙවියා
    3. ආලයට අධිපති - එරෝස් දෙවියා
    4. සමුද්‍රයට අධිපති - පොසිඩන් දෙවියා

22. 1. බටහිර වෛද්‍ය විද්‍යාවේ පියා - හිප්‍රොකටීස්
    2. ගණිත විද්‍යාවේ පියා - පයිතගරස්
    3. නවීන විද්‍යාවේ පියා - ප්ලේටෝ
    4. තර්ක ශාස්ත්‍රයේ පියා - ඇරිස්ටෝටල්

23. 1. මාර්ස් - යුද්ධයට අධිපති දෙවියා
    2. වීනස් - ආලයට අධිපති දෙවියා
    3. ජුපිටර් - අහසට අධිපති දෙවියා
    4. සෙරෙස් - මව් දෙවඟන

24. 1. අංග - චම්පා
    2. මල්ල - උදේනිය
    3. මත්ස - විරාට
    4. කාසි - බරණැස

25. 1. ලිච්ඡවී - අල්ලකප්ප
    2. ශාක්‍යයන් - කපිල වස්තු
    3. කෝලියන් - රාමගාම
    4. කාලාමයන් - කේසපුත්ත

- **අංක 26 - 30 තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති (A), (B), (C) හා (D) යන ප්‍රතිචාර හතරක් දී ඇත. ඒවා අතුරෙන් දෙකක් නිවැරදිය. එම නිවැරදි ප්‍රතිචාර දෙක තෝරන්න.**

    (A) සහ (B) පමණක් නිවැරදි නම් අංක 1 ද,

    (B) සහ (C) පමණක් නිවැරදි නම් අංක 2 ද,

    (B) සහ (D) පමණක් නිවැරදි නම් අංක 3 ද,

    (A) සහ (D) පමණක් නිවැරදි නම් අංක 4 ද, සලකුණු කරන්න.

26. රෝම අධිරාජයේ පරිහානියට බලපෑ දේශපාලන සාධක වන්නේ,

    A. බලය විකේන්ද්‍රගත වීම.
    B. රාජධානියේ දේශ සීමා පුළුල් වීම.
    C. හමුදා විනය ගරුක වීම.
    D. රාජ්‍ය උරුමය පිළිබඳ නිරවුල් ප්‍රතිපත්ති තිබීම. (.........)

27. ද්වාරවතී ශිෂ්ටාචාරයට අදාළ සාධක වන්නේ,

    A. ථෙරවාදී බුද්ධදහම මෙහි ව්‍යාප්තව තිබිණි.
    B. මෙහි හමු වී ඇති ලෝහමය හිටි බුදු පිළිම ලංකාවේ පොළොන්නරු යුගයේ බුදු පිළිමවලට සමාන ය.
    C. සිංහල භික්ෂූන් වහන්සේලා තායිලන්තයට ගොස් ඇති බවට සාක්ෂි හමු වී නැත.
    D. සෙල්ලිපි සහ වංසාවතාර අනුව තායිලන්තය එකල කාම්බෝජය නමින් හඳුන්වා ඇත. (.........)

28. ලාඕසයට අදාළ සාධක වන්නේ,

    A. ලාඕසයේ වර්තමාන රාජ්‍ය ආගම වන්නේ හින්දු දහම යි.
    B. ලාඕස වැසියෝ ජාතක කතාවලට දැඩි ඇල්මක් දක්වති.
    C. එරට දස ජාතකය සහ පනස් ජාතක ලෙස ජාතක කතා පොත් දෙකක් රචනා කර ඇත.
    D. වර්තමානයේ මහායාන බුදු දහම ප්‍රචලිත කිරීමට රජය උත්සහ දරයි. (.........)

29. චීනයේ බෞද්ධ සංස්කෘතියට අදාළ සාධක වන්නේ,

    A. චීන සමාජ චින්තනය හැඩ ගැස්වීමට පදනම් වූයේ කොන්ෆියුසියස් දහම වේ.
    B. චීනයට බුදු දහම ගෙනෙන ලද්දේ විං - කී අධිරාජ්‍යයාගේ කාලයේ ය.
    C. පළමුවන සිය වසයේ දී ටාටර් වංසය බුදු දහම පැතිර වීමට සහයෝගය ලබා නොදුන්නේ ය.
    D. අධිරාජ ලියාං - වුති හට බුදුදහමට එල්ල වූ අභියෝග ජයගැනීමට නොහැකි විය. (.........)

30. ජපානයේ බෞද්ධ සංස්කෘතියට අදාළ සාධක වන්නේ,

    A. ජපානයට බුදු දහම ස්ථාවර වූයේ පස්වන සියවසේ ය.
    B. ජපන් බෞද්ධයන් විසින් ෂෝතෙකු කුමරු අවලෝකිතේශ්වර බුදුන්ගේ අවතාරයක් ලෙස හඳුන්වනු ලබයි.
    C. ජපානයේ සෝගාවරු සෙසු ගෝත්‍ර අභිබවා බලවත්ව ඇත.
    D. සෙන් බුදු සමය ජපන් ජන ජීවිතය කෙරෙහි බලපෑමක් කළේ නැත. (.........)

www.pirivena.lk

- අංක 31 - 36 තෙක් දක්වා ඇති නාම / ප්‍රකාශන සමූහයක් X හා Y තීරුවල දී ඇත. X තීරුවේ දී ඇති නාම / ප්‍රකාශන Y තීරුවේ නාම / ප්‍රකාශන සමග කිසියම් ආකාරයට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නොවේ. X තීරුවේ ඒවා Y තීරුව සමග ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

31.

| X | Y |
|---|---|
| 1. පළමුවන විජයබාහු රජු | A. නිශ්ශංක ලතා මණ්ඩපය |
| 2. මහා පරාක්‍රමබාහු රජු | B. දඹදෙණි රාජධානිය |
| 3. කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල රජු | C. පොළොන්නරු රාජධානිය |
| 4. තුන්වන විජයබාහු රජු | D. පරාක්‍රම සමුද්‍රය |

1. A B C D 2. C A B D 3. C D A B 4. D A C B

32.

| X | Y |
|---|---|
| 1. වස්කෝ ද ගාමා | A. යාපනය |
| 2. ෆ්‍රැන්සිස්කෝ ද අල්මේදා | B. ඉන්දියාවේ කැලිකට් වරාය |
| 3. පරරාජසේකරම් රජු | C. රන්දෙණිවල සටන |
| 4. කොන්ස්තන්තිනු ද සා | D. සෙයිලන් |

1. B C A D 2. B D A C 3. D B A C 4. D B C A

33.

| X | Y |
|---|---|
| 1. ක්‍රි.ව. 1638 | A. අට්ටාපිටිය ගිවිසුම |
| 2. ක්‍රි.ව. 1634 | B. බයිබලය සිංහලට පරිවර්තනය |
| 3. ක්‍රි.ව. 1739 | C. ලන්දේසීන් හා කීර්ති ශ්‍රී රාජසිංහ රජු අතර ගැටුම් |
| 4. ක්‍රි.ව. 1766 | D. උඩරට ලන්දේසි ගිවිසුම |

1. B D A C 2. C A D B 3. D A C B 4. D A B C

34.

| X | Y |
|---|---|
| 1. පෞර රාජ්‍ය | A. නෙප්චූන් |
| 2. මුහුදට අධිපති දෙවියා | B. ස්පාටා |
| 3. ජලෝට් පීඩනය | C. සොපොක්ලීක්ස් |
| 4. ශෝකාන්ත නාට්‍ය | D. ආර්කිමිඩීස් |

1. B A D C 2. A B D C 3. D A C B 4. A C D B

35.

| X | Y |
|---|---|
| 1. චන්ද්‍රගුප්ත රජු | A. කාලිංගය අල්ලා ගැනීමෙන් මගධය ව්‍යාප්ත කරන ලදී. |
| 2. බින්දුසාර රජු | B. මගධ අධිරාජ්‍ය මහා ඇලෙක්සැන්ඩර්ගෙන් ආරක්ෂා කර ගැනීම. |
| 3. අශෝක රජු | C. නන්ද රාජවංශය පරදා මගධය අල්ලා ගැනීම. |
| 4. ධනනන්ද රජු | D. අමිත්‍රඝාත ලෙස හැඳින්වේ. |

1. B D A C 2. C A D B 3. D A C B 4. C D A B

www.pirivena.lk

- **අංක 36 සිට 40 දක්වා ඇති එක් එක් ප්‍රශ්නයෙහි ප්‍රකාශ දෙක බැගින් ඇතුළත් වේ. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1, 2, 3, 4 යන කවර ප්‍රකාශ යුගලය දැයි තෝරා ඊට අදාළ අංකය සලකුණු කරන්න.**

| වරණ අංකය | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 1 | නිවැරදි ය. | නිවැරදි ය. |
| 2 | නිවැරදි ය. | වැරදි ය. |
| 3 | වැරදි ය. | වැරදි ය. |
| 4 | වැරදි ය. | නිවැරදි ය. |

| | පළමුවන ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 36. | චෝලයන් ක්‍රි.ව.993 දී රජරට කොල්ල කෑ අතර, තම පාලන මධ්‍යස්ථානය බවට පොලොන්නරුව පත් කර ගත්තේ ය. | ක්‍රි.ව.1017 දී මුන්මුඩි චෝළ මණ්ඩලම් ලෙස එකල හැඳින්වූ ලංකාව චෝල අධිරාජ්‍යයට යටත් විය. |
| 37. | ක්‍රි.ව.1619 දී පිලිප් ද ඔලිවේරා යටතේ ගිය පෘතුගීසි හමුදාවක් විසින් යාපනය යටත් කර ගත්තේ ය. | ක්‍රි.ව.1621 වන විටත් යාපනයේ බලය සම්පූර්ණයෙන් ම පෘතුගීසින්ට ලබා ගත නොහැකි විය. |
| 38. | ක්‍රි.ව.1638 දී දියෝගු ද මේලෝගේ නායකත්වයෙන් උඩරට ආක්‍රමණය කරන ලදී. | රන්දෙණිවල දී පෘතුගීසින් සමූල ඝාතනය විය. |
| 39. | ග්‍රීක ග්‍රන්ථ රචනා කළ අය අතර පුරෝගාමියා හෙරඩෝටස් ය. | ඉතිහාසයේ පියා ලෙස හැඳින්වෙන මොහු පර්සියානු ආක්‍රමණ පිළිබඳව කෘති සම්පාදනය කර ඇත. |
| 40. | බුරුමයේ ථේරවාද බුදු දහමේ පුනරුදය වෙනුවෙන් අනවරථ රජතුමා කිසිවක් නොකළේ ය. | අනවරථ රජුගේ අනුප්‍රාප්තිකයා ලෙස ක්‍යාන්සිත්ථ රජු බුරුමයේ ථේරවාද බුදුදහමේ පුනරුදය වෙනුවෙන් කටයුතු කළේ ය. |

* * *

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

| 07 | S | I, II |
|---|---|---|

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය/Ministry of Education - Division of Piriven Education/ கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு

# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2023 (2024)
## 4 ශ්‍රේණිය
## (07) ඉතිහාසය - I, II

**සැලකිය යුතුයි :**

* පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ද තෝරාගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

01. i. ඔබට සපයා ඇති ශ්‍රී ලංකා ආකෘති සිතියමේ පහත සඳහන් ස්ථාන ලකුණු කර නම් කරන්න.

1. අනුරාධපුරය 2. මැණික් ගඟ 3. මාතර
4. මහනුවර 5. මහියංගනය 6. දඹකොළ පටුන

(නිවැරදිව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 1 × 6 = 06)

ii. පහත A හා B රූප සටහන් අධ්‍යයනය කොට ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(අ) A රූපයෙන් දැක්වෙන්නේ කුමක් ද?

(ආ) එය ඉදි කළ රජතුමා කවුරුන් ද?

(ඉ) මෙය පිහිටි ඓතිහාසික නගරය කුමක් ද?



A රූපය

(ලකුණු 1 × 3 = 3)

iii. (අ) B රූපයෙන් දැක්වෙන්නේ කුමක් ද?

(ආ) එය නිම කොට ඇත්තේ කුමන රාජ පරම්පරාවකින් ද?

(ඉ) මෙය පිහිටා ඇති දූපත කුමක් ද?



B රූපය

(ලකුණු 1 × 3 = 3)

02. i. අතීතයේ දී පොළොන්නරුව හඳුන්වා ඇති නම් දෙකක් ලියන්න. (ලකුණු 02)

ii. පළමුවන විජයබාහු රජුගේ ආර්ථික සංවර්ධන සේවා හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. පළමුවන විජයබාහු රජුගේ ආගමික සේවය කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

03. i. පොළොන්නරු රාජ්‍යය පාලනය කළ රැජිනියන් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 02)

ii. රාජ්‍යත්වය තහවුරු කර ගැනීමේ දී නිශ්ශංකමල්ල රජුට මුහුණදීමට සිදු වූ අභියෝග දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. පොලොන්නරු රාජධානියේ පරිහානියට හා බිඳ වැටීමට බලපෑ හේතු සාධක කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

04. i. දඹදෙණිය රාජධානිය පාලනය කළ රජවරුන් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 02)

ii. කෝට්ටේ යුගයේ රචිත සන්දේශ කාව්‍ය හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. හයවන පරාක්‍රමබාහු රජතුමා සාහිත්‍ය හා අධ්‍යාපනයේ දියුණුවට කළ සේවාව කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

05. i. ලංකාවට පැමිණි ප්‍රථම පෘතුගීසි ජාතිකයා සහ ඔහු පැමිණි ස්ථානය නම් කරන්න. (ලකුණු 02)

ii. පෘතුගීසින්ගේ උඩරට ආක්‍රමණ අසාර්ථක වීමට බලපෑ හේතු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. පෘතුගීසි ආගමනයෙන් ඇති වූ සමාජ හා සංස්කෘතික බලපෑම කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

06. i. ලන්දේසීන් ලංකාවට පැමිණීමේ අරමුණු දෙකක් දක්වන්න. (ලකුණු 02)

ii. 1638 උඩරට ලන්දේසි ගිවිසුමේ මූලික කරුණු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. ලන්දේසීන්ගේ පැමිණීම නිසා ඇති වූ ආගමික බලපෑම් පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 06)

07. i. ග්‍රීක නාට්‍ය කලාවේ ප්‍රධාන කොටස් දෙක නම් කරන්න. (ලකුණු 02)

ii. ග්‍රීසියේ විවිධ අංශවලට අධිපති දෙවිවරුන් සිව් දෙනෙකු දක්වන්න. (ලකුණු 04)

iii. මෞර්ය යුගයේ පරිහානියට හා බිඳ වැටීමට තුඩු දුන් හේතු සාධක කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

08. පහත සඳහන් මාතෘකා අතරින් **දෙකක්** පිළිබඳ ඓතිහාසික තොරතුරු දක්වන්න.

i. රෝම අධිරාජ්‍යයේ පිරිහීම හා බිඳ වැටීම

ii. බුරුමය හා ලංකාව අතර පැවති සබඳතා

iii. ද්වාරවතී ශිෂ්ටාචාරය

iv. සෙන් බුදු දහම

(ලකුණු 6 × 2 = 12)

* * *

www.pirivena.lk

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

| 07 | S | I, II |
|---|---|---|

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය/Ministry of Education - Division of Piriven Education/ கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு

**මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2023 (2024)**

**4 ශ්‍රේණිය**

**(07) ඉතිහාසය - I, II**

**සැලකිය යුතුයි :**

* දෙවන ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න අංක 01 (I) ට පිළිතුරු සැපයීම සඳහා මෙම සිතියම භාවිත කරන්න. පිළිතුරු සැපයීමෙන් පසුව මෙය ඔබේ පිළිතුරු පත්‍රය සමග අමුණා භාර දෙන්න.

